# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
*WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2014 ජූලි 22** වන අඟහරුවාදා
2014 ஆடி 22 செவ்வாய்க்கிழமை
Tuesday 22nd July 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்லை .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.34 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.34 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.34 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
**ANNOUNCEMENTS OF CHAIRMAN**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු මන්ත්‍රීවරුන් සඳහා වෛද්‍ය සායනයක් 2014 අගෝස්තු මස 05 වන දින පෙ.ව. 07.30 සිට මෙම පළාත් සභා පරිශ්‍රයේදී පැවැත්වෙන බවත්, ඒ සම්බන්ධයෙන් අද දින ගරු මන්ත්‍රීවරුන් වෙත පූර්ව දැනුම් දීමක් කරන ලෙසත්, එම අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් සභා ලේකම්තුමා වෙත ලිඛිත ඉල්ලීමක් කර තිබෙනවා. එම වෛද්‍ය සායනයේදී බෝ නොවන රෝග සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණ, දන්ත සායන මෙන්ම අක්ෂි සායනද පැවැත්වෙනවා.*

*වෛද්‍ය සායනය තුළ දී සිදු කරන රුධිරගත සීනි සහ ලිපිඩ ප්‍රමාණ පරීක්ෂාවන්ට සහභාගිවීම සඳහා පැය 12 ක පමණ කාලයක් නිරාහාරව සිට පැමිණීම අත්‍යවශ්‍ය වන බැවින් ඒ පිළිබඳවද ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. සායනය පැවැත්වෙන දිනය 2014 අගෝස්තු මස 05 වන දින, එනම් මීළඟ සභා රැස්වීම නියමිත දිනයේ උදේ වරුව වන බවත් මා විසින් දැනුම් දෙනවා."*

*ii*

*"ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් සිටි ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.07.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාව ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් ම විසින් නම් කර ඇති බවත්,*

*අවදි කාකර සභාවේ සාමාජික වශයෙන් කටයුතු කරමින් සිටි කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.07.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාව අවදි කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් නම් කර ඇති බවත් දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.07.08 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant report are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමනි, කළුතර දකුණ, බද්රියා මස්ජිත් මාවතේ, අංක 43 හි පදිංචි එම්.එස්.එම්. මුබාරක් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, බියගම, යටත්ත පාර, අංක 107/E, එල්. වී. චින්තක ලියනගේ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පන්නිපිටිය, හිරිපිටිය, අංක 52 හි එස්. ධනුෂ්ක හේෂාන් සහ පදිංචි සෝමසිරි මුදලිගේ යන අය විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම සහ

ii. මත්තේගොඩ, අංක 35/3 හි පදිංචි ඒ.එල්. මානෙල් රේණුකා යන අයගේ පෙත්සම.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, පිළියන්දල, සීලරතන මාවත, අංක 7/5 A හි පදිංචි කේ.එස්. ආනන්ද ගෝමස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ඒකල, පන්සල පාර, අංක 14/37 හි පදිංචි ජී.කේ. විජේදාස යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The question in the name of the Hon.Sunil Watagala, - Member, under item No.01 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks' time was asked for it by the Hon. Minister, Mr. Udaya Prabath Gammanpila on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 02 හා 03 යටතේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The questions in the name of the Hon.Mujibur Rahuman, - Member, under item No.02 & 03 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks' time was asked for it by the Hon. Minister, Mr. Udaya Prabath Gammanpila on his behalf, Hon. Chairman ordered the questions to be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 04 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The question in the name of the Hon.Lakshman Nipuna Arachchi, - Member, under item No.04 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks' time was asked for it by the Hon. Minister, Mr. Udaya Prabath Gammanpila on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්වැනි ප්‍රශ්නය මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.) [On Behalf of Hon. Chief Minister]

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සති දෙක පනින කොට මේ ප්‍රශ්නය නම් කල් පැනලා ඉවරයි. මේ රුහුණු කතරගම දේවාලය පිළිබඳ ප්‍රශ්නයක් මම අහලා තිබෙන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila - Minister [On Behalf of Hon. Chief Minister]

ගරු මන්ත්‍රීතුමා, මගෙන් ප්‍රශ්න කරලා වැඩක් නැහැ. ගරු මහ ඇමැතිතුමා මේ සභාවේ නොමැති නිසයි සති දෙකක කාලයක් කල් ලබා ගත්තේ. ගරු මහ ඇමැතිතුමා ඉන්න වේලාවක ඔබතුමාගේ ප්‍රශ්නය යොමු කරන්න.

***න්‍යාය පත්‍රයේ අංක 06 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The questions in the name of the Hon.Mahinda Jayasinghe, - Member, under item No. 06 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Mr. Udaya Prabath Gammanpila on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හත්වැනි ප්‍රශ්නය මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස ඉදි කිරීම් ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා [ගරු උපාලි කොඩිකාර අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila - Minister [On Behalf of the Hon. Minister Upali Kodikara ]

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.[1]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැඟිටිනවාටත් පාඩුයි.

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## MINISTRIE'S ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව, පළාත් සභාව රැස්වෙන සෑම මාසයකම දෙවන දිනයේ සභාව අවසන් වීමෙන් පසු ගරු මන්ත්‍රීතුමන්ලාට දිවා ආහාරය ලබා දී ඉන් පසුව මෙම ගොඩනැගිල්ලේ දෙවන මහලේදී පැවැත්වීමට කටයුතු යොදලා තිබෙනවා කියලා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට දැනුම් දෙන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, ඒක නැවත වරින් වර දැනුම් දෙන්නේ නැහැ. මම ලංකාවේ සිටියත් නැතත්, මම රෝහලේ සිටියත් ඒ නිශ්චිත වේලාවට, ඒ ස්ථානයේ උපදේශක කාරක සභාව පැවැත්වෙනවා. කලින් පැවැත් වුණෙත් එහෙමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, උපදේශක කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලාට විතරද ඒ ආරාධනාව? නැත්නම් විවෘතවද? එතකොට දිවා භෝජන සංග්‍රහය හැමෝටම දෙනවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

එන හැමෝටම දෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්

## PERSONAL EXPLANATIONS

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මෙම කාරණය ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න යන්නේ, මේ සභාවේ අවධානය යොමු කරන්න යන්නේ සීතාවක නගරයේ ඇති වී තිබෙන පාරිසරික ප්‍රශ්නයක් පිළිබඳ කාරණාවක්. විශේෂයෙන්ම අපි දන්නවා, සීතාවක

[1] පසුව පිළිතුරු ලබා දෙන ලදී. පිටු අංක 06 බලන්න.

[ගරු මහේෂ් අල්මේදා]

කර්මාන්ත උද්‍යානයක් පිහිටුවලා තිබෙන බව. මේ කර්මාන්ත උද්‍යානය, දැවැන්ත කර්මාන්ත උද්‍යානයක්. කර්මාන්තශාලා 100 කට අධික සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වාගේම 20,000 ක විතර සේවක සංඛ්‍යාවක් සේවය කරන කර්මාන්ත උද්‍යානයක්. මේ කර්මාන්ත උද්‍යානයේ එක කර්මාන්ත ශාලාවක් ලෙස ගල් අඟුරු බලාගාරයක් ඉදි කරන්න යනවා. අපි දන්නවා, අපේ රටේ ගල් අඟුරු බලාගාර දෙකක් ඉදි කර තිබෙනවා. මෙය තුන්වැනි ගල් අඟුරු බලාගාරය විධියට තමයි සැලකෙන්නේ. මේ ගල් අඟුරු බලාගාරය ඉදි කිරීම නිසා ඇති වන පාරිසරික තත්ත්වයන් පිළිබඳව තමයි මම සාකච්ඡා කරන්න යන්නේ.

ගරු සභාපතිතුමනි, අද වන විට පාරිසරික සංවිධාන පිහිටුවලා, යම් යම් සිවිල් පුරවැසියන් සංවිධානගත වෙලා මේ ඇති කරන්න යන ගල් අඟුරු බලාගාරය පිළිබඳව යම් නොසන්සුන්තාවයක් මතු වෙමින් තිබෙනවා. මේ කර්මාන්ත උද්‍යානය ඇතුළේ TJ කර්මාන්ත ආයතනය කියලා එක කර්මාන්ත ශාලාවක් තිබෙනවා. මේ කර්මාන්ත ශාලාව විසින් සිද්ධ කරන්නේ, රෙදි හෝදලා, සුද්ධ කරලා, රෙදි අලුත් කරලා යවන එකයි. ඒ කර්මාන්ත ශාලාවට අවශ්‍ය කරන විදුලිය ලබා ගන්න, එහෙම නැත්නම් අර Steam කරන එක ලබා ගන්න තමයි මේ ගල් අඟුරු බලාගාරය ඉදි කරනවා කියලා කියන්නේ. මෙගා වොට් 01 ක විදුලියක් ලබා ගැනීම තමයි ඒ අයගේ බලාපොරොත්තුව වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අවිස්සාවෙල්ල සීතාවක නගරය කියලා කියන්නේ අවිස්සාවෙල්ල මූලික රෝහල, ප්‍රධාන පාසල් ඇති ඉතාම ජනාකීර්ණ වුණු නගරයක්. ඒ වාගේම පාරම්පරික ජනාවාස. ඒ වාගේම ජනතාවට පානීය ජලය සපයන පානීය ජල උල්පත් පිහිටා තිබෙන ප්‍රදේශයක් වාගේම කොළඹ හා තදාසන්න නගරවලට පානීය ජලය ලබා දෙන ලබුගම, කලටුවාව ජලාශ දෙකත් තිබෙන ඒ වාගේම සම්ප්‍රදායික බෝග වගාව කරන වතු රාශියක්, පෙන්ඩ්‍රික් වත්ත, එල්සන් වත්ත, ෆැන්නැම් වත්ත, තල්දූව වත්ත ආදී වතු ගණනාවක් තිබෙන, සාම්ප්‍රදායික බෝග වගාවක් තිබෙන විශේෂයෙන්ම ජන ජීවිතයට බලපාන බොහෝ ක්‍රියාකාරකම් සිද්ධ කරන තැනක් විධියට තමයි සීතාවක නගරය සලකන්නේ. ඒ නගරය ආසන්නයේ තමයි මේ කර්මාන්ත පුරයත්, කර්මාන්ත ශාලාවත් පිහිටුවලා තිබෙන්නේ. ඒ නිසා තමයි ප්‍රශ්නය මතු වෙන්නේ ගරු සභාපතිතුමනි.

අපි දන්නවා, ගල් අඟුරු බලාගාරයක් පිහිටුවද්දී ලෝකයේ සම්මත නීතියක් තිබෙනවා. සම්මත සම්ප්‍රදායක් තිබෙනවා. ඒ තමයි ගල් අඟුරු බලාගාරයක් පිහිටු වන්නේ මහ මුහුදක් අයිනේ. ලුණු වතුරට මේ උණු වතුර මුදාහරින්න පුළුවන්, ඒ වාගේම ගල් අඟුරු මහ මුහුදෙන් ගෙනැල්ලා, බත්තල්වලින් බාලා පාවිච්චි කරන්න පුළුවන් තැනක තමයි ගල් අඟුරු බලාගාරය ඉදි කරනු ලබන්නේ. නමුත් අපි දන්නේ නැහැ, කොහොමද මේ නගරයක් මැද්දේ, රට අභ්‍යන්තරික ප්‍රදේශයක මෙහෙම ගල් අඟුරු බලාගාරයක් පිහිටුවන්නේ කියලා.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මේ ගල් අඟුරු බලාගාරයට මෙගාවොට් 01 ක විදුලි බලයක් නිෂ්පාදනය කිරීම සඳහා මෙට්‍රික් ටොන් 40 ක ගල් අඟුරු දිනකට පාවිච්චි කරනවා කියන කාරණය තමයි ඒ අවට ප්‍රදේශ වැසියන්ගේ අදහස වෙලා තිබෙන්නේ. අපි දන්නවා, ගල් අඟුරු බලාගාරයක ගල් අඟුරු පාවිච්චි කළාට පස්සේ Fly Ash කියලා, එහෙම නැත්නම් උඩට විහිදෙන ගල් අඟුරු අළු ප්‍රමාණය සියයට 0.04 ක් විතර වෙනවා. නොරොච්චෝලේ බලාගාරය සම්බන්ධ ගිවිසුමත් එක්ක විමසා බලන විට ඒ විහිදෙන Fly Ash එහෙම නැත්නම් උඩට යන අළු ඒ සියල්ල සිමෙන්ති කර්මාන්ත ශාලාවක විමිනියට ඉතාම ආරක්ෂිතව ලබා දෙනවා කියලා ගිවිසුමේ සඳහන් වෙලා තිබෙනවා. නමුත් මේ ආරම්භ කරන්න යන ගල් අඟුරු බලාගාරයේ Fly Ash වලට මොකද වෙන්නේ කියලා කිසිම සඳහනක් නැහැ. ඒක තේරෙන්නෙත් නැහැ. ඒක අහසට මුදා හැරියොත් - තදින් වර්ෂාව තිබෙන ප්‍රදේශයක් අවිස්සාවෙල්ල නගර ප්‍රදේශය. වැස්ස වෙලාවට ඒවා පොළවට පතිත වෙලා විෂ වායු හැදෙන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වාගේම අනික් පැත්තට Down Ash කියලා එකක් තිබෙනවා. මේ පිච්චෙන ගල් අඟුරු සියල්ල Down Ash විධියට තමයි සලකන්නේ. ඒක 98% ක ප්‍රමාණයක් වෙනවා. මේ 98% ක ප්‍රමාණය නොරොච්චලේ ගල් අඟුරු බලාගාරයේ සම්මත නීතිය තමයි තමන්ගේ අංගනවල ආරක්ෂිතව තැන්පත් කරන එක. හැබැයි මේ ගල් අඟුරු බලාගාරයේ ඒක තැන්පත් කරන්නේ කොහොමද කියලා කිසිදු සඳහනක් නැහැ. සාමාන්‍යයෙන් මෙවැනි ගල් අඟුරු බලාගාරයක් ඇති කරන්න අවම වශයෙන් අක්කර හතරකවත් ඉඩමක් තිබෙන්න ඕනෑ. හැබැයි,

මේ කර්මාන්තශාලාවටම තිබෙන්නේ එකම එක අක්කරයක ඉඩමක් විතරයි. මේ අක්කරයක ඉඩම ඇතුළේ කොහොමද ගල් අඟුරු තැන්පත් කරන්නේ. ඒ Down Ash එක කොහොමද අංගනවලට තැන්පත් කරන්නේ කියන කාරණය පිළිබඳව පැහැදිලි අදහසක් නැහැ.

ඊළඟ කාරණය තමයි මේ ගල් අඟුරු ප්‍රවාහනය කරන්නේ කොහොමද? මුහුදක් නැහැ. වෙනත් විධියක් නැහැ. පාරේ තමයි ගල් අඟුරු ගෙනෙන්න වෙන්නේ. ගල් අඟුරු ගේනකොට පිච්චිච්ච නැති ගල් අඟුරුවලින් නිකුත්වන සමහර දේත් පිළිකා කාරකවලට හේතු වෙනවා කියන කාරණය තමයි විද්‍යාඥයෝ පැහැදිලි කරලා තිබෙන්නේ. ඒ නිසා මේ සියලු අනතුරුදායක තත්ත්වයන් තිබෙද්දී ගල් අඟුරු බලාගාරයක් රට අභ්‍යන්තරයේ තැනක නිර්මාණය කිරීම හරහා මතුවන පාරිසරික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. රැසක් තිබෙනවා. ඒ සියල්ල එසේ තිබියදී කිසිදු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක්, සහතිකයක් නැතිව, කාගෙවත් උපදෙසක් ගන්නේ නැතිව, ප්‍රදේශයේ ජනතාවට සත්‍ය සඳහන් කරන්නේ නැතිව පෞද්ගලික කර්මාන්ත ශාලාවක් ගල් අඟුරු බලාගාරයක් ඉදි කිරීම තුළ විශාල පාරිසරික හානි වාගේම මානව ක්‍රියාකාරකම්වලට බරපතළ හානි සිද්ධ වෙන්න පුළුවන්කම තිබෙන නිසා මේ ගල් අඟුරු බලාගාරය ඉදි කිරීම පිළිබඳව බස්නාහිර පළාත් සභාවේත් අවධානය යොමු වෙලා - පාරිසරික කටයුතු පිළිබඳව කටයුතු කරන්න පුළුවන් අමාත්‍යාංශයක් අපට තිබෙනවා. අපි ඔබතුමා හරහා ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව මැදිහත් වෙලා ඒක යම් සම්මත නීතියකට අනුව නොමැතිව ඉදි කරන්නට යනවා නම් ඒක නතර කරන්න. එහෙම නැත්නම් මහජන හිතකාරීව මේක කරන්න පුළුවන් අවස්ථාව නිර්මාණය කරලා දෙන්න. ජනතාවට සහන සලසා දෙන්න, මේ සභාව මැදිහත් වෙන්න කියන බොහොම ගෞරවනීය ඉල්ලීම ඔබතුමාගෙන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට විනාඩියක් දෙන්න. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඒ පෞද්ගලික කාරණාව පිළිබඳව ඇත්ත වශයෙන්ම බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ විෂයය භාර පරිසර ගරු ඇමැතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, ඒ පිළිබඳව මැදිහත් වෙලා ඔබතුමාට පුළුවන් විධියට කඩිනම් විසඳුමක් ලබා දෙන්න කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ඒ විෂයය ක්ෂේත්‍රය අපට අයිති වන්නේ නැහැ. පරිසර සංරක්ෂණය සහ දැනුවත් කිරීම තමයි පළාත් සභාවට අයිති වෙන්නේ. පරිසර නියාමනය සිදු වන්නේ, සුසිල් ප්‍රේමජයන්ත ගරු ඇමැතිතුමා යටතේ තිබෙන මධ්‍යම පරිසර අධිකාරිය යටතේ. මීට අවුරුදු පහකට, හයකට කලින් නම් මට මොකක් හරි කරන්න හැකියාවක් තිබුණා. දැන් නම් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියටයි මම මේ යොමු කරන්නේ. ගරු සභාපතිතුමනි, අද දිනයේ සභා න්‍යාය පත්‍රයේ ප්‍රශ්න 01 සිට 07 දක්වා තිබෙනවා. ඒ ප්‍රශ්න සඳහා වගකිවයුතු ගරු ප්‍රධාන අමාත්‍යවරයා සහ අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යවරයා සිටියේ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, මේ හත්වැනි ප්‍රශ්නය, අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. හරියට මට නිකන් දැනෙන්නේ ගරු සභාපතිතුමනි, මේ හත්වැනි ප්‍රශ්නය මඟහරින්න ද මේ හදන්නේ කියලා. හරියට හත්වැනි ප්‍රශ්නය ඉවරවෙන කොටම තමයි උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මේ සභාවට ආවේ. එතකොට ගරු සභාපතිතුමනි. මම මේ කියන්නේ, මේ අදාළ න්‍යාය පත්‍රයේ තිබෙන කිසිදු ප්‍රශ්නයකට අද දවසේ උත්තර ලැබුණේ නැහැ. එතකොට දැන් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා හරියටම ආවේ හත්වැනි ප්‍රශ්නය පියමං වන කොට. එතකොට මෙය ගරු සභාපතිතුමනි -

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

මම උත්තර දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා උත්තර දෙන්න ලැහැස්තියිලු. එතුමා ප්‍රශ්නයට උත්තර දෙනවා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම කනගාටු වෙනවා. එනකොට මගේ රථයේ ටයර් එකක හුළං ගියා. ඒ නිසා මට ප්‍රමාද වෙන්න සිද්ධ වුණා. නැත්නම් මම වෙලාවට එන කෙනෙක්. ඒ නිසා මට සමාවෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. පසුව හරි පිළිතුරු ලබා දෙන නිසා.

***[ප්‍රශ්නවලට වාචික පිළිතුරු යටතේ පසුව දුන් පිළිතුරු]***
*[ Answer provided later to questions under oral responses]*

**07.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/14/29)**

අ. I. මීනුවන්ගොඩ මැතිවරණ කොට්ඨාශයේ අංක 05 මාර්ගයේ ගල්කන්ද හන්දියේ සිට බෝධිපිටුවල හරහා වන්කපුමුල්ල, කමරගොඩ පාර අයත් වන්නේ ප්‍රාදේශීය සභාවටද? පළාත් සභාවටද? යන බව ඔබතුමා මෙම සභාවට පැහැදිලි කරන්නේද?

II. එම පාර බෝධිපිටුවල තුන්මංහන්දියේ සිට කාමරගොඩ දක්වා කාපට් අතුරා සංවර්ධනය කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. I. එම පාර ගල්කන්ද හන්දියේ සිට බෝධිපිටුවල අවසානය දක්වා මීටර් 1500 ක දුර අබලන් වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

II. එසේ නම් එම කොටස පිළිසකර කර සංවර්ධනය කරනු ලබන්නේද?

III. එම කටයුතු ආරම්භ කරනුයේ කවදා සිටද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අ. I. විමසීම් කර ඇති මාර්ගයට අදාළව කාමරගොඩ හන්දියේ සිට වන්කපුමුල්ල හන්දිය දක්වා වන මාර්ග කොටස ඇතුළත් වන්නේ බස්නාහිර පළාත් සභාවටයි. මෙම මාර්ගය C-11 ශ්‍රේණියේ මාර්ගයක් වන ගනේමුල්ල කාමරගොඩ ගල්කන්ද මාර්ගය වන අතර, මාර්ගයේ දිග කි.මී. 3.13 කි.

වන්කපුමුල්ල හන්දියේ සිට ගල්කන්ද දක්වා වන මාර්ග කොටස අයත් වන්නේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවටයි.

II. බස්නාහිර පළාත් සභාවට අයත් උක්ත මාර්ග කොටස "සපිරි ගමක් සපිරි රටක්" වැඩ සටහන යටතේ කාපට් අතුරා සංවර්ධනය කරන ලද අතර, බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ඉල්ලීමට අනුව ප්‍රාදේශීය සභාවට අයත් කොටසින් මීටර් 360 ක මාර්ග කොටස ද අප අධිකාරිය මඟින් කාපට් යොදා සංවර්ධනය කරන ලදී. එසේම ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග කොටසින් තවත් සංවර්ධනය කළ යුතු කොටසක් ඉතිරිව පවතී.

ආ. I, II, III

මෙම මාර්ග කොටස බස්නාහිර පළාත් සභාවට අයත් නොවන බව දන්වමි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. දැන් ඔබතුමා සඳහන් කළා මේ පාරේ ගල්කන්ද හන්දියේ සිට, බෝධිපිටුවල තුන්මන්හන්දියේ සිට කමරගොඩ දක්වා කාපට් අතුරා තිබෙන්නේ ප්‍රාදේශීය සභාවට අයත් කොටසක් කියලා. නමුත් ඒ කාපට් අතුරා සංවර්ධනය කර තිබෙන්නේ

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ඉල්ලීමක් මත කියලා ඔබතුමා උත්තරය ලෙස සඳහන් කළා. එතකොට ඇයි ඉතිරි කොටස - එතකොට මේ පාරේ කොටසක් තමයි කාපට් අතුරලා සංවර්ධනය කරලා තිබෙන්නේ. ඉතිරි කොටස දැන් කැඩිලා තිබෙනවා. අබලන් වෙලා තිබෙනවා. ඒ කොටසේ ගමන් කරන්න අපහසුයි. මම පසුගිය දිනවල මේ ගමේ ගම්වාසීන් මුණ ගැසුණා. ඒ අවස්ථාවේදී මම මෙය මගේ ඇසින්ම දුටුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පැහැදිලි කිරීම් කරන්න බැහැ. ප්‍රශ්න තුනක් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම අහන්නේ, ඉතිරි කොටස සංවර්ධනය කරන්නත් ඇයි එලෙසම කටයුතු කරන්න බැරි? එය ප්‍රාදේශීය සභාවට අයිතියි කියලා ඔබතුමා මඟහරින්න උත්සාහ කරන්නේ ඇයි?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මඟහරින්න උත්සාහ කරනවා නොවෙයි. දැනට අපේ අධිකාරියේ මුදල් ප්‍රමාණයක් නැහැ. දැනට මේ අවුරුද්දේ මුදල් ප්‍රමාණය වියදම් වෙලා අවසන් වෙලා තිබෙන්නේ. අපි පාරවල්වලට බෙදා දීලා දැනට ඒ සංවර්ධන ක්‍රියාවලිය යනවා. එතකොට ඒක අපේ පාරක් නොවෙයි. අපි උදව්වක් හැටියට තමයි පළාත් පාලන ආයතනයක පාරකට අපි ඒ මීටර් 360 ක් කරලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට බැසිල් රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා සල්ලි දුන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉන්න කෝ. බාධා කිරීම් කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඒක මට අදාළ නැහැ. ඇමැතිතුමා සල්ලි දෙනවා නම් මම කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක දැන් ඔබතුමා පිළිගන්නේ නැද්ද? එකම පාරක ප්‍රාදේශීය සභාවට අයිති කොටසක් කාපට් අතුරලා සංවර්ධනය කරලා තිබෙනවා. ඉතිරි කොටස සංවර්ධනය නොකිරීම ඒ ගම්වාසීන්ට කරන අසාධාරණයක් කියලා ඔබතුමා පිළිගන්නේ නැද්ද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

තුන්වැනි කොටස අයත් වන්නේ මහා මාර්ග අමාත්‍යාංශයට. අපට නොවෙයි. පළාත් සභාවටත් නැහැ. ප්‍රාදේශීය සභාවටත් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෙහෙම උත්තර දෙන්න නම් මහා මාර්ග ඇමැති කෙනෙක් ඕනෑ වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ඒ කොටසට මෙතුමාගේ විමධ්‍යගත සල්ලිවලින් සල්ලි දෙනවා නම් මම සතියක් ඇතුළත කාපට් කරලා දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විමධ්‍යගත සල්ලිවලින් කරනවා නම්, ඔබතුමා අවශ්‍ය වෙන්නේ නැහැ. අපට ලැබෙන ලක්ෂ 35 න් -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඔච්චර මිනිස්සුන්ට ආදරේ නම්, මෙතුමාටත් සල්ලි හම්බ වෙනවා. ඒ සල්ලි අපට දෙන්න. එතකොට අපි කරලා දෙන්නම්. අපේ RDA එකෙන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ඊළඟ ප්‍රශ්නය, මෙහි ගම්වාසීන් 207 දෙනෙකු විසින් අත්සන් කරලා පෙත්සමක් මා වෙත යොමු කරලා තිබෙනවා. ඒ පෙත්සම ඔබතුමා වෙත ලැබී තිබෙනවාද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය මේ ප්‍රශ්න ජාලයෙන් අහලා නැහැ. ඉතින් මට උත්තර දෙන්න -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම අතුරු ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් වුණත් අහපු ප්‍රශ්නයට අදාළව අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අදාළව තමයි. මේ මාර්ගයට අදාළව -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මට අදාළ නැති ප්‍රශ්නයකට උත්තර දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ ප්‍රශ්නයට කල් ඉල්ලගෙන උත්තර දෙන්න. එතුමා කල් ඉල්ලගෙන උත්තර දෙයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම මේ පෙත්සම සභාගත කරනවා.[2] ඒ වාගේම -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඒ පාර හදලා ඉදිරියේදී මෙතුමාව ගෙනහිල්ලා විවෘත කරනවා.

[2] සභා ලේකම් කාර්යාලයේ හැන්සාඩ් අංශයේ ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම සන්තෝෂයි. හරිම හොඳයි ඇමැතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි, ගරු ඇමැතිතුමා. මාව නැති වුණත් කමක් නැහැ ඔබතුමා ගිහිල්ලා විවෘත කරන්න. මට අවශ්‍ය මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මේ පාර හදලා දෙන්නත්, විවෘත කරලා පාරේ බෝඩ් ඒක දාගන්න මට උවමනාවක් නැහැ. ඒ නිසා ඔබතුමා ගිහිල්ලා පාර හදලා විවෘත කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා නොසිටියත් අර ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව ප්‍රශ්නයට මැදිහත් වුණේ. ඒ නිසා අපි එතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. එතුමා පාර හදනවා නේ. එහෙම කරන එක ලොකු දෙයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිමල් ලන්සා ගරු ඇමැතිතුමා කියනකන් එතුමාට තේරුනේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා මට මේ සභාව කරගෙන යන්න දෙන්න. හැමදාම ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. සභාව යන්න ඕනෑ. තව පටන් ගත්තා ඉවරයි. ඔබතුමා පොඩ්ඩක් ඉන්න කෝ. න්‍යාය පත්‍රය තව ඉවර නැහැ නේ. හැමදාම මේක කරන්න බැහැ නේ. පටන් ගත්තා ඉවරයි. දවල් වෙලා පටන් ගන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමාට හොඳ කේන්දරකාරයෙක් ගාවට ගිහිල්ලා මේ දවස්වල වෙලාව බලාගන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම මේ නිකන් වචනයක් කියපුවාම ඔබතුමා මට අවවාද කරනවා. මෙතුමා කිසිම අදාළ නැති දෙයක් කථා කළාම ඔබතුමා උඩ බලාගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා තමයි අවුස්සලා ගන්නේ. කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය රඟපෑම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නීතිය ක්‍රියාත්මක කරනවා නම් හරියට නීතිය ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ නිකන් ප්‍රශ්න ඇති කරන්න එපා. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම ඔබතුමාට වාඩි වෙන්න කියන්න බැහැ. එහෙමනම් එතුමාටත් කියන්න එපැයි වාඩි වෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේ සභාව තුළ අනවශ්‍ය හැසිරීම්වලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නීතිය හරියට ක්‍රියාත්මක කරනවා නම් හරියට ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ මාධ්‍යවලට කැපී පෙනෙන්න හැසිරෙන්න එපා. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා හරියට වැඩ කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මහජන ඡන්දයෙන් ආපු මන්ත්‍රීවරයෙක්. මහජන ගරුත්වය ඔබතුමා ආරක්ෂා කරන්න. ඔබතුමා පොඩි ළමයෙක් වාගේ හැසිරෙන්න එපා. ඔබතුමා මන්ත්‍රීවරයෙක්. ඔබතුමාගේ මන්ත්‍රී ධූරයේ ගරුත්වය ඔබතුමා ආරක්ෂා කරගන්න.

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, අලුබෝමුල්ල එස්. මහින්ද මහා විද්‍යාලයේ වර්තමාන අපකීර්තිදායක සහ අසතුටුදායක තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමට ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ හොරණ අධ්‍යාපන කලාපයේ බණ්ඩාරගම කොට්ඨාශයට අයිති එස්. මහින්ද මහ විද්‍යාලය කියලා කියන්නේ අවුරුදු 100 කට වඩා පැරැණි, ප්‍රදේශයේ නැණවතුන්, උගතුන්, බුද්ධිමතුන් විශාල සංඛ්‍යාවක් බිහි කරපු, එක් කාල වකවානුවක් තුළ ප්‍රදේශයේ තිබුණු ජනප්‍රිය පාසලක්. මීට ඉස්සෙල්ලා මේ පාසලේ සිසුන් 2000 ක් පමණ වන තරමට අධ්‍යාපනය ලබමින් සිසුන් සංඛ්‍යාව එවැනි ඉහළ මට්ටමක තිබුණා. නමුත් අද වර්තමානය වන විට මේ පාසලේ අධ්‍යාපන මට්ටම, පරිපාලනමය තත්ත්වයන් සහ විනය කියන කාරණා පිරිහිලා ගිහිල්ලා, මේ පාසල ඉතාමත්ම අසතුටුදායක සහ අපකීර්තිදායක තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ අපකීර්තිදායක තත්ත්වය වඩාත් භයානක තත්ත්වයට පත් වෙන්නේ පාසලේ දරුවන්ගේ විනය පිරිහිලා තිබීම තුළින්. විදුහල්පතිවරයාගේ විනය පිරිහිලා තිබෙනවා. ගුරුවරුන්ගේ විනය පිරිහිලා තිබෙනවා. ටිබෙට් ජාතික එස්. මහින්ද හාමුදුරුවන්ගේ ගුණානුස්මරණ උත්සවයක් දවසේ තමයි මේ හාමුදුරුවන්ගේ නමට මේ පාසල නම් කළේ. අද එස්. මහින්ද හාමුදුරුවන්ගේ නමට පවා අපකීර්තියක්, අගෞරවයක් වන විධියට තමයි මේ පාසලේ කටයුතු සිද්ධ වෙන්නේ.

විශේෂයෙන්ම 2000 ක පමණ සිසුන් පිරිසක් සිටින පාසල අද ළමයින් 380 පමණ දක්වා මේ පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

පහළට ඇවිල්ලා තිබෙනවා. ඔබතුමාගේ අවධානයට ලක් කරනවා. මේ පාසලේ උසස් පෙළ පන්තියේ කලා විෂයයන් හදාරන්න ළමයින් ඉන්නේ 12 දෙනයි. වාණිජ විෂයයන් හදාරන්න අද වනකොට මේ පාසලේ ඉන්නේ ළමයින් 05 දෙනයි. 11 ශ්‍රේණියේ ළමයින් ඉන්නේ 29 දෙනයි. 10 වැනි ශ්‍රේණියේ ළමයින් ඉන්නේ 48 දෙනයි. 09 වන ශ්‍රේණියේ ළමයින් ඉන්නේ 50 දෙනයි. මේ විධියට මේ පාසල සිසුන් 2000 ක වාගේ ප්‍රමාණයේ ඉඳලා අද වනකොට මේ පරිහාණිය දක්වා ගමන් කරලා තිබෙන්නේ. මේ පාසලෙන් බිහි වුණු උදවිය පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කරනවා නම් හිටපු පොලිස්පති වික්ටර් පෙරේරා මැතිතුමා. ඒ වාගේම හිටපු අධ්‍යාපන විභාග කොමසාරිස් ගාමිණී ගුණරත්න මැතිතුමා. ඒ වාගේම වර්තමානයේ ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් මහින්ද ඉලේපෙරුම වැනි අයවලුන් මේ විද්‍යාලයේ ආදී ශිෂ්‍යයන් විධියට මේ ප්‍රදේශයේ ජනප්‍රිය ප්‍රභූන් තත්ත්වයට පත් වුණු උදවිය.

ගරු සභාපතිතුමනි, අද මෙහි තිබෙන ප්‍රධානම තත්ත්වය තමයි පාසලේ තිබෙන ක්‍රීඩා පිටිය විදුහල්පතිවරයා විසින් විවිධ ක්‍රීඩා සංගම් වෙත අලෙවි කරනු ලැබීමයි. නමුත් මේ මුදල් පාසලට ලැබීමක් නැහැ. ඒ මුදල් පාසල් සංවර්ධන සමිතියට ලැබීමක් නැහැ. පාසලේ ගොඩනැගිලි පද්ධතිය සහමුලින්ම කඩන් වැටිලා තිබෙනවා. මේ පාසලේ ඉතාම සුළු වියදමක් කරලා හදන්න තිබුණු ගොඩනැගිල්ලක් ලක්ෂ 19 ක් වියදම් කරලා පළාත් සභාවෙන් හදන තැනට කඩන් වැටෙන තුරු මේ පාසල බලන් සිටියා. ඒ වාගේම දෙමහල් ගොඩනැගිල්ලක් අද කඩන් වැටෙන තත්ත්වයට පත් වෙලා. ඒ දෙමහල් ගොඩනැගිල්ලෙන් සිසුන් ඉවත් කරලා තිබෙනවා. ඒ වාගේම තාක්ෂණ කාමරය අද නඩත්තුවක් කරන්නේ නැතිව අත්හැරලා දාලා තිබෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මහින්දෝදය විද්‍යාගාරය හදලා අවුරුදු 04 ක පමණ කාලයක් වෙනවා. මේ විද්‍යාගාරයෙන් ප්‍රයෝජන ගන්න ළමයින් නැහැ. මේ විද්‍යාගාරය විවෘත කිරීමක් නැහැ. හොඳ විද්‍යාගාරයක් තිබෙද්දී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්දෝදය විද්‍යාගාරය හදාලා අවුරුදු හතරක් වෙනවා?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හදන්න පටන් අරගෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවුරුදු හතරක් වෙනවා? හතරක් වෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

පසුගිය අයවැයෙන් -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මහින්දෝදය විද්‍යාගාරය හදන කොටත් මේ පාසලේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අවුරුදු හතරක් වෙන්නේ නැහැ. අවුරුදු දෙකයි පටන් අරගෙන. වැරැදි ප්‍රකාශ කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මහින්දෝදය විද්‍යාගාරය හදලා වසරකට වඩා වැඩි කාල සීමාවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කියන්න. එහෙම කිව්වාම මම අනුමත කරනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මෙක විවෘත කරන්න බැරිව තිබෙනවා. හේතුව මේ පාසලේ ඒ අධ්‍යාපනය ලබන විද්‍යා අංශයේ ළමයින් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, සුනාමි ආධාර ලැබුණු මේ පාසලේ හොඳ පරිගණක ඒකකයක් තිබෙනවා. හොඳ විද්‍යාගාරයක් තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පාසලට දිනෙන් දින අත්වන තත්ත්වය පිළිබඳව සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. විදුහල්පතිවරයාගේ අසාර්ථක පරිපාලන රටාවන් නිසා තමයි මේ පාසල අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ නිසා මේ විදුහල්පතිවරයාගේ අසාර්ථක පරිපාලන රටාවෙන් බැහැරට ගෙනිහිල්ලා සාර්ථක විදුහල්පතිවරයෙකු මේ විද්‍යාලයට පත් කරන්න අවශ්‍ය කටයුතු කිරීම දැයේ දරුවන්ට කරන මහඟු ප්‍රතිඵලයක් විධියට සලකන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ වන විට කළුතර නගර මධ්‍යයේ බස් නැවතුම්පොළේ සිට දුම්රියපල දක්වා තිබෙන සීමාවක කඩ 100 ක් පමණ ඉවත් කරන්න කියලා නාගරික සංවර්ධන අධිකාරිය හදිසියේ මේ වෙළඳුන්ට දැනුම් දීලා තිබෙනවා. මේ ලිපිය ඔවුන් යොමු කරන්නේ, පසුගිය ජූලි 07 වැනිදා. එකොළොස් වැනිදා වනකොට දවස් 04 ක් ඇතුළත මේ කඩ ටික අයින් කරගන්න කියලා. මේ පිළිබඳව දැනුම් දුන්නාට පසුව මම නාගරික සංවර්ධන අධිකාරිය එක්ක සාකච්ඡා කළා. නගර සභාවට සාකච්ඡාවට එන්න කිව්වා. එතැනට පැමිණියේ, නාගරික සංවර්ධන අධිකාරිය නියෝජනය කරන, නිල ඇඳුම් ලා ගත්ත මේජර්වරයෙක්. ඔහු ඒ සාකච්ඡාවේදී පැමිණි වෙළඳුන්ට තර්ජනය කරලා තියෙනවා. කිසිඳු සාකච්ඡාවක් නැහැ. වන්දි දෙන්නේ නැහැ. වහාම ඉවත් වෙන්න ඕනෑය කියලා තමයි ප්‍රකාශ කරලා තිබුණේ.

ගරු සභාපතිතුමනි, දින 04 ක් ඇතුළත මෙහෙම ඉවත් වෙන්න කියන එකේ සාධාරණය මොකක්ද? නගරය අලංකාර කරනවාට, නගරය නවීකරණය කරනවාට, නගරයේ අලුත් ගොඩනැගිලි හදනවාට අපේ විරෝධතාවයක් නැහැ. හැබැයි, අවුරුදු 10 ක්, 12 ක් වෙළඳාම් කරගත්තු මිනිස්සු. ඒ මිනිස්සු මේ කඩවලින් තමයි තමන්ගේ දරුවන් පාසල් යවන්න කීයක් හරි සොයා ගත්තේ. තමන්ගේ දූප්පත් අම්මා තාත්තා නඩත්තු කළේ. තමන්ගේ පවුලේ ජීවිකාව ලෙස තමයි මෙය පත් වෙලා තිබෙන්නේ. දින 04 ක් ඇතුළත මෙහෙම අයින් වෙන්න කියලා පාරට ඇදලා දැමීම සම්පූර්ණයෙන්ම මානව හිමිකම් කඩ කිරීමක්. අඩු තරමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, නගර සභා පනතේ, නාගරික සංවර්ධන අධිකාරී පනතේ සඳහන් වෙනවා, රජයේ ඉඩමක් පවරා ගන්නවා නම්, ඒ අයට විකල්ප ස්ථාන දෙන්න ඕනෑය කියලා. මේ වෙළඳුන් ඉල්ලා සිටින්නේ වෙන මොකවත් නොවෙයි ගරු සභාපතිතුමනි. ඒ අයට තමන්ගේ ව්‍යාපාරික කටයුතු කරගෙන යෑම සඳහා විකල්ප ස්ථාන ලබා දෙන්නය කියලා. ඒ ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන තුරු සාධාරණ වන්දියක් දෙන්නය කියලා. එහෙම නැතිව දැන් දින නියම කරලා තිබෙනවා. මේකට එක පැත්තකින් නගර සභාවේ සභාපතිවරයාත් වගකියන්න ඕනෑ. ඔහු එක්සත් ජාතික පක්ෂයේ. සභාපතිවරයාට සමහර දේවල් වළක්වන්න පුළුවන්කමක් තිබෙනවා. හැබැයි, ඔහු නාගරික සංවර්ධන අධිකාරිය තමන්ගේ සභාපති ධූරය අහිමි කරයි කියලා, මේ නගර සභාව නාගරික කොමසාරිස්වරයාට පවරයි කියලා, තමන්ගේ පට්ටම අහිමි වෙයි කියලා ඔහුත් මේකට උඩගෙඩි දීලා ඉන්නවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන් ගරු මහ ඇමැතිතුමා මාර්ගයෙන් මම ඉල්ලා සිටින්නේ, මේ වෙළඳුන්ට වන අසාධාරණය - අපි පසුගිය 18 වැනිදා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් කරලා තිබෙනවා. එසේ පැමිණිල්ලක් කරලා තිබියදී දැන් විටින් විට ආරංචි වෙනවා, UD එකෙන් ඇවිල්ලා මේක ඩෝසර් කරන්න දින යොදලා තිබෙනවා කියලා. මේක බරපතළ අසාධාරණයක්. එක පැත්තකින් මේ වෙළඳුන්ගෙන් 90% ක් විතර මුස්ලිම් ජාතිකයෝ. ඔවුන් ප්‍රීතියෙන්, සමාදානයෙන්, සහෝදරත්වයෙන් තමන්ගේ රාමසාන් උත්සවය සමරන්න සැදී පැහැදී ඉන්න වේලාවේ දැන් ඔවුන්ට බඩේ ගින්දරක් පත්තු කරලා තිබෙනවා.

මේක ගත්තොත් එහෙම, අපි දැක්කා බොරැල්ලේ, කොම්පඤ්ඤවීදියේ, වනාතමුල්ලේදී නීතිය පාවිච්චි කරලා, හමුදා බලය යොදවලා මේ අහිංසක මිනිසුන්ගේ නිවාස, කඩ සාප්පු ඩෝසර් කරනවා. අපි කියන්නේ නගරය සංවර්ධනය කරන්න. ඒකට සැලැස්මක් ගෙනෙන්න. අපි ඒකට එකඟයි. හැබැයි අවුරුදු 10 ක්, 12 ක් ව්‍යාපාර කරමින් ජීවත් වුණු අහිංසක මිනිසුන්ට සාධාරණයක් කරන්න ඕනෑ. ඒ නිසා මේ තීන්දුව ක්‍රියාත්මක කරන්න පෙර බලහත්කාරයෙන් - කවුරු වුණත් බලහත්කාරයෙන් මේක ක්‍රියාත්මක කරන්න ඉස්සර වෙලා, ඒ මිනිස්සුන්ට සාධාරණයක් කරලා, සාධාරණ වන්දියක් දීලා, විකල්ප ව්‍යාපාරික ස්ථාන ලබා දෙන්න කියන ඉල්ලීමයි මම ඉදිරිපත් කරන්නේ. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා. බස්නාහිර පළාත තුළ නීතිය හා සාමය බිඳ වැටීම පිළිබඳව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ප්‍රථමයෙන් ගරු සභාපතිතුමනි, පසුගිය කාලවකවානුව තුළ සිදු වුණු සිද්ධීන් සමඟ විශේෂයෙන්ම ඉස්ලාම් බැතිමතුන් හට ඒ සිදු වුණු පහරදීම් පිළිබඳවත්, ඒ එක්කම අද අපේ රටේ ඉන්න ජනතාව ආගම් වශයෙන්, ජාතීන් වශයෙන්, කුල වශයෙන් බෙදාගෙන යන මේ ක්‍රියාවලියේ අලුත්ම පරිවර්තනය තමයි ගරු සභාපතිතුමනි, මීට සුමානයකට ඉස්සෙල්ලා බොදුබල සේනාව විසින් කරපු ප්‍රකාශයක් ගැන ඉතාමත් කනගාටුවෙන් කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ශුද්ධ වූ පාප්තුමාගේ පැමිණීම රජය විසින් දැනුම් දීමත් සමඟම බොදුබල සේනාව විසින් ප්‍රකාශයක් කරලා තිබුණා, උන්වහන්සේ සිංහල බෞද්ධයන්ගෙන් සමාව ගන්න ඕනෑය කියලා. ගරු සභාපතිතුමනි, මම ඉතාමත් කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. (බාධා කිරීම්) අද මේ රට තුළ යම්කිසි ප්‍රශ්නයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පිරිසක් - (බාධා කිරීමක්) බොදුබල සේනාව තුළ පමණක් නොවෙයි, මේ රජය තුළත් ඔවුන් සිටින බව ඉතාමත් පැහැදිලිව අපට පෙනී යනවා. මේ මුස්ලිම් ප්‍රශ්නයත් පොඩ්ඩක් නිවෙන්න හැරුණා විතරයි. අද වනකොට ක්‍රිස්තියානි, කතෝලික ජනතාව අතරත් ප්‍රශ්නයක් ඇති කරලා, මේ රට තුළ නැවත අර L.T.T.E ත්‍රස්තවාදී වාගේ ප්‍රශ්න ඇති කරලා ඡන්දයකට ගිහිල්ලා ජයග්‍රහණය කිරීමේ ආශාවත් සමඟ තමයි මම හිතන්නේ, මේ සියලු ප්‍රශ්න අද නිර්මාණය වෙන්නේ. බොදුබල සේනාව කියද්දී ගරු සභාපතිතුමනි, මම පසුගිය වසරේ මේ සභාවේ ප්‍රකාශයක් කළා. මේකේ පිටිපස්සේ ඉන්න හස්ත දෙකක් තිබෙනවා කියලා. අපි දන්න තරමින්. එක්කෙනෙක් තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. ලේකම්තුමා. එතුමාත් සමඟ තවත් හස්තයක් ඉන්නවා පිටිපස්සේ ඉඳගෙන -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රශ්නය මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

දැන් රටේ ආරක්ෂක ලේකම්වරයාගේ නම ප්‍රකාශ කරන්න -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලේකම්වරයාට වරප්‍රසාද නැහැ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ලේකම්වරයාගේ නම ප්‍රකාශ කරන්න, කොහේ හරි මාධ්‍යයක, ගැසට් එකක සඳහන් වෙලා තිබෙන කරුණක් විතරයි ඒ ගැන කථා කරන්න පුළුවන්. එහෙම නැතුව නිලධාරීන්ට එහෙම මඩ ගහන්න පුළුවන්කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ලේකම්වරයෙක්ට එවැනි වරප්‍රසාදයක් නැහැ. මේ රටේ නීතිය අනුව -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

රීති සඳහන් කරමින් පෞද්ගලික අපහාස කිරීම් සිදු කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කිසිදු අපහාස කිරීමක් නැහැ. අපහාසය මොකක්ද?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

පෞද්ගලික ප්‍රකාශ හරහා රාජ්‍ය නිලධාරීන්ට අපහාස කරන්න එපා. චෝදනා, සාක්ෂි සහිතව ඔප්පු කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපහාසය මොකක්ද කියන්න කෝ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

නම සඳහන් කරන එක අපහාසයක් නොවෙයි. වෙන අයගේ නම සඳහන් කළොත් අපහාසයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර මට සභාව -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

රාජපක්ෂ පවුලේ නම සඳහන් කළොත් තමයි අපහාසය.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

මත පළ කරද්දී සාක්ෂි සහිතව මත පළ කරන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

රාජපක්ෂ පවුලේ නමක් සඳහන් කරන්න නොවෙයි. කවුරු හරි ඕනෑම නිලධාරියෙකුගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, -

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුගේ නමක් සඳහන් කරන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙනවා. කෙනෙකුට අපහාසයක් කරන්න, කෙනෙකු චෝදනාවට ලක් කරන්න ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය උඩ විතරයි කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

තමන්ගේ පළාත් සභාවේ ලේකම්වරයෙක් ගැන පසුගිය කාලයේ සඳහන් කළා. ඒ වෙනුවෙන් කවුරුත් නැඟිට්ටේ නැහැ. දැන් මේවාට එහෙම වරප්‍රසාද කොහෙද තිබෙන්නේ?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඒ ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඒ වේලාවේදී තමුන්නාන්සේලාට කථා කරන්න තිබුණා නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු ඇමැතිතුමා, තනියෙන් කඩේ යන්න එපා. එතකොට වැඬේ නෝන්ඩි වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා පළාත් සභාවේ ඇමැතිවරයෙක්. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මෙතැන නැති නිලධාරීන්ගේ නම් කීමෙන් පුළුවන්තරම් වළකින්න. ඔබතුමා දැන් කථාව කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ආරක්ෂක ලේකම්තුමාගේ නම මේ සභාවේ කියන්න මට අයිතියක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයිතියක් තිබෙන එක වෙනම දෙයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට රීතිවලින්වත් කිසිම දෙයකින්වත් නවත්වන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ඔබතුමා සදාචාර වෙන්න. එතුමාට මෙතැනට ඇවිල්ලා උත්තර දෙන්න බැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ වරප්‍රසාදවලට මුවා වෙලා නිලධාරීන්ට -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ මේ දේශපාලන න්‍යාය පත්‍රයේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

සුසිල් ප්‍රේමජයන්ත ඇමැතිතුමාගේ විෂයය ගැන කියද්දී ඔබතුමා එතුමා වෙනුවෙන් පෙනී සිටියේ නැහැ. හැබැයි, ආරක්ෂක ලේකම්තුමා වෙනුවෙන් පෙනී සිටින්නේ හයටද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම ප්‍රශ්නයක් මෙතැන නැහැ. ඔබතුමා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

සුසිල් ප්‍රේමජයන්ත ඇමැතිතුමා ගැන සඳහන් වුණා. ඒ වෙනුවෙන් ඔබතුමා පෙනී සිටියේ නැහැ. ඇයි ආරක්ෂක ලේකම්තුමා වෙනුවෙන් පෙනී සිටින්නේ?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඒ වෙනුවෙන් කවුරුත් කථා කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විනාඩි 04 න් විනාඩි 02 ක්ම එතුමායි කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි දෙකක් කථා කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඉතාමත්ම පැහැදිලිව මේ බොදුබල සේනාව පිටිපස්සේ ඉන්නේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ කියන එක අද මුළු රටේම ජනතාව දන්නවා. එදා වැලිවේරියට පහර දෙද්දී රටේ ආරක්ෂක ලේකම් හැටියට බලාගෙන සිටියා. මේ මෑතකදී බේරුවල ප්‍රශ්නයේදී ගහලා ඉවර වනතුරු බලාගෙන සිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශය පුළුවන්තරම් මේ සභාවේ නැති නිලධාරියෙක් ගැන කථා කරන්න එපා. ඒක සාධාරණ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අද අලුත්ම තත්ත්වය ඇවිල්ලා - සිංහල බෞද්ධයන්ගෙනුත් 99.9% ක් හොඳට ආගම අදහන බෞද්ධ ජනතාව, කතෝලික ක්‍රිස්තියානි ජනතාවත් එක්ක ඉතාමත් හොඳින්, සහයෝගයෙන්, සහෝදරකමින් ජීවත්වන ජනතාවක්. මේ අතරත් අද ගැටුමක් ඇති කරන්න උත්සාහ කරන පිරිසක් මේ රට තුළ ඉන්නවා. ඒක නිසා අපි කනගාටු වෙනවා, අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

මන්ත්‍රීවරුත් මේක පිටිපස්සේ ඉන්නවා කියන එක ඉතාම පැහැදිලිව මම නැවත වරක් කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මගේ විනාඩි දෙක ලබා දුන්නේ නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය ඉවරයි නේ දැන්. කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ කාලයෙන් මෙතුමා නේ කථා කළේ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, රීති අංක 34 -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. කාලය අවසන්.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, රීති 34(5) යටතේ සභාවෙන් බාහිරව මන්ත්‍රීවරයෙකු විසින් කරන ලද හෝ කියන ලද හෝ දෙයක් ගැන සභාවේදී පෞද්ගලික පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීම් ඉදිරිපත් කළ නොහැකිය. ඒ නිසා හෙළ උරුමයේ මන්ත්‍රීවරුන් මේ සභාවෙන් බැහැරව බොදුබල සේනාව එක්ක වැඩ කළාද නැද්ද කියන එක සම්බන්ධයෙන් ඒ මන්ත්‍රීවරයාගේ පෞද්ගලික පැහැදිලි කිරීම්වලට කථා කළ නොහැකිය කියලා අපේ රීතිවල සඳහන් වෙනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මම හෙළ උරුමයේ මන්ත්‍රීවරයෙක් නිසා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ ජාතික හෙළ උරුමයේ කියලා. ජාතික හෙළ උරුමයේ මන්ත්‍රීවරු විතරක් නොවෙයි ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමන්ලා ඇරුණාම තව කට්ටිය හෙළ උරුමයේ ඉන්නවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මම ජාතික හෙළ උරුමයේ මන්ත්‍රීවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා හෙළ උරුමයේ ඇමැතිවරයෙක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම මන්ත්‍රීවරු කියලා කිව්වේ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කිව්වා. මම ඒ කොටස හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ හෙළ උරුමයේ කියලා. ඔබතුමා ඕනෑ නම් -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඇමැතිවරයෙක්. ඔබතුමා හෙළ උරුමයේ නොවෙයි නේ? එක්සත් ජනතා නිදහස් සන්ධානය නේ? ඔබතුමා මැතිවරණයට ඉදිරිපත් වෙලා තිබෙන්නේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මෙතුමා වයර් ටික පටලවාගෙන.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

නෛතික තත්ත්වය එක්සත් ජනතා නිදහස් සන්ධානය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. මේ න්‍යාය පත්‍රයට යන්න ඕනෑ. පෞද්ගලික විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමාත් වාඩි වෙන්න. ඔබතුමාත් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ පක්ෂයේ මධුමාධව බෙරුවල ප්‍රශ්නය වන තැනදී සිටියේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මධුමාධව සිටියා. මෙතුමාගේ පක්ෂය නියෝජනය කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හෙළ උරුමය නියෝජනය කරන්නේ, අර කටට ඇඟිල්ල ගහගෙන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මහර ගලවලවත්ත නිවැසියන් පිරිසක් පිළිබඳ ජාතික නිවාස යෝජනා අධිකාරිය සම්බන්ධ කාරණාවට ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මහර ආසනයේ ගල්වලවත්ත නිවාස සංකීර්ණය නිවාස සංවර්ධන අධිකාරියට අයත් භූමි ප්‍රදේශයක්. පවතින රජයන් දෙක විසින්ම නිවාස තැනුවා. කෙසේ වෙතත් මේ මෑතකදී, සති කීපයකට පෙර නිවාස 20 ක ජනතාව නිවාස සංවර්ධන අධිකාරිය විසින් එළියට දැම්මා. එතැන 150 කට ආසන්න ජනතාවක් ඉන්නවා. මම ඒ ස්ථානයට යන්න ප්‍රථම ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, අනික් අමාත්‍යවරුත් පැමිණිලා සිටියා. කෙසේ වෙතත් ඒ සියලුමදෙනා මට ඡන්දයට වැඩ කළේ නැහැ. මෙතැන සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා නම්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉන්නවා නම් ඒ දෙදෙනාට පෝස්ටර් ගැහුවේ. කරන්න තිබෙන ඔක්කෝම දේවල් කළේ මේ ගෙවල් 20 ඉන්න අය තමයි. හැබැයි, ඒ අය දැන් කථා කරන්නේ නැහැ. කථා කරන්නේ විපක්ෂයේ ඉන්න අපි. ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරන්නේ, මහර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන්. ඇත්තටම මේ නිවාසවල සිටින එක එක උදවියට එක එක නීති. ඇමැති කෙනෙක් ඉන්නවා. ඇමැතිතුමාට ඕනෑ නම් ඒ නිවාස දෙනවා. එහෙම නම් මන්ත්‍රීවරුන්ට ඒ විධියට තිබෙනවා. හැබැයි, තව ගෙවල් 20 ක් අයින් කරලා තිබෙනවා. තව ගෙවල් 110 ක් තිබෙනවා. ඒ අයට ඊයේ ලියුමක් දීලා තිබෙනවා ලක්ෂ 03 1/2 ක් බැන්දේ නැත්නම් ගරු සභාපතිතුමනි, 20 වැනිදාට ප්‍රථම එළියට යන්න ඕනෑය කියලා. එහෙමනම් මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. බස්නාහිර පළාත් සභා භූමි ප්‍රදේශයක්. මහර ප්‍රාදේශීය සභාවට අයිති. මහර ආසනයට අයිති. පක්ෂ දෙකෙන්ම, රජයන් දෙකෙන්ම තනා නිම කරන ලද මේ මහල් නිවාසවලින් මේ ජනතාව ඉවත් කළා. හැබැයි, ඒ ජනතාව දැන් වැසිකිළියටවත්, කොහෙටවත් යන්න බැරිව ඒ ආසන්නයේම ඉන්නවා. සුනාමියක් වාගේ. දැන් ඒ උදවියට අර අනික් ගෙවල් 110 යේ අය තමයි කෑම බීම දන්සල් වාගේ දෙන්නේ. එහෙමනම් මම ඉල්ලීමක් කරනවා. කවදාවත් ඒ උදවිය එතැනින් යන්නේ නැහැ. මරාගෙන මැරෙයි. මේ ප්‍රශ්නයට තමුන්නාන්සේ මැදිහත් වෙලා බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් - ඒ උදවියම තමයි විදුලිය ගත්තේ. වසර 11 ක් පදිංචි උදවිය වශයෙන් ඒ අයටම ඒ නිවාස දීලා, අනික් අයටත් සාධාරණයක් ඉෂ්ට කරලා, ඔප්පු ලබා දීලා තමුන්නාන්සේලා ඔවුන්ට ඒ ශක්තිය ලබා දෙන්න.

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා හා සමානමයි. මේ දේමයි වෙලා තිබෙන්නේ. අද ඒ අයට ඕනෑ ඕනෑ විධියට මේ දේ කරගෙන යනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. එක එක මන්ත්‍රීවරුන්ට, ඇමැතිවරුන්ට ඕනෑ ඕනෑ විධියට මේක අන්දනවා. නැත්නම් ඕනෑ ඕනෑ විධියට එක එක හැන්දෙන් බෙදනවා. මේ දේ වෙනස් කරලා, මහර ආසනයේ කැන්දලියැද්දපාළුව මේකට කියන්නේ. නිවාස සංවර්ධන අධිකාරියේ කැන්දලියැද්දපාළුව ගල්වලවත්ත මහල් නිවාස සංකීර්ණය. එහෙමනම් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා අවංක ඉල්ලීමක් කරමින්, මෙයට මැදිහත් වෙලා කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මෙම අවස්ථාවේදී න්‍යාය පත්‍රය ප්‍රකාරව පෞද්ගලික මන්ත්‍රී කටයුතු තිබෙන්නේ. නමුත් ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා විසින් රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. උදෑසන තේ විවේකයෙන් පසුව එම යෝජනාව විවාදයට ගැනීමට බලාපොරොත්තු වෙනවා.

එම නිසා මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 10.19 ට යළිත් රැස් විය.***

*Sitting, accordingly suspened untill 10.19 A.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමාට අවස්ථාව. ඔබතුමා මා වෙත භාර දී ඇති රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, කාර්යපාටිපාටි රීති අංක 107 යටතේ යෝජනාව ඉදිරිපත් කිරීම. කාර්යපාටිපාටි රීති 107 මඟින් සලසා ඇති ප්‍රතිපාදනවලට අනුව 2014.07.22 වැනි දින සභා රැස්වීමේදී රීති අත්හිටුවා විවාදයට ගැනීම පිණිස පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරමි. රීති අත්හිටුවීමේ යෝජනාව.

*"පොදු වැදගත්කමින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්යපටිපාටි රීති 107 යටතේ-*

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැමදාම යෝජනාවක් ගේන කොට මෙතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කමක් නැහැ. එතුමාට අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේක මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ තිබෙන අයිතියට බාධා කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නය කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම ඔබතුමාගේ අවධානයට 36(1) රීතියට යොමු කරනවා. ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රය ඇතුළේ මගේ යෝජනාව පස්වැනි වතාවටත් එනවා. අද රීති අත්හිටෙව්වොත් මේ යෝජනාව ඉදිරිපත් කරන්න විධියක් නැහැ. ඒ නිසා කරුණාකරලා රීති අත්හිටුවීමටත් මම විරුද්ධයි. රීති අත්හිටුවීම ඇතුළේ මේ ජනතාවට බලපාන මගේ හදිසි යෝජනාව - මේ දරුවෝ ඩෙංගු හැදිලා මැරෙනවා. ඒ නිසා මේ යෝජනාව ගත යුතුයි. රීති අත්හිටුවීම තුළ න්‍යාය පත්‍රයේ මගේ යෝජනාව ගෙන එන්න බැරි වෙනවා. ඒ නිසා න්‍යාය පත්‍රයට ඉඩ දීලා මගේ වරප්‍රසාද ආරක්ෂා කර දෙන්න කියලා ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා. රීති අත්හිටුවීමට මම විරුද්ධයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙමනම් ගරු සභාපතිතුමනි, මීට පස්සේ මේ යෝජනා ගෙන එන්න ඕනෑ නැහැ. රීති අත්හිටුවීමේ යෝජනා කාර්යපටිපාටි රීතිවලින් අයින් කරගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, එතුමාගේ කථාවේ සාධාරණයක් තිබෙනවා. මොකද මේ යෝජනාව එතුමා පස් වතාවක් ඉදිරිපත් කළා. මට මතකයි මේ න්‍යාය පත්‍රයේ දිගින් දිගටම කල් ගියා. එතුමාගේ ප්‍රශ්නය.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, එහෙමනම් මේ ගරු මන්ත්‍රීවරු අහන ප්‍රශ්නවලටම කොපමණ කල් ගන්වාද ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. මට අවස්ථාව දෙන්න සිද්ධ වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒකත් මේ වාගේ අයිතිවාසිකමක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. අයිවාසිකම පිළිගන්නවා. එතුමාගේත් අයිතිවාසිකමක්. එතුමාගේ ප්‍රශ්නය-

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවට වැඩිය මේකේ තිබෙන හදිසිය මොකක්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේකේ කිසි හදිස්සියක් නැහැ. මගේ යෝජනාව හදිසි එකක්. මම කියන්නේ සෞඛ්‍ය සමාජ පිහිටුවන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මැදිහත්ව ඉන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඩෙංගු හැදිලා දරුවෝ මැරෙනවා. පාසල් ඇතුළේ වෙනත් ප්‍රශ්න මතු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමා කියන දේත් පිළිගන්නවා. මෙතුමා කියන දේත් පිළිගන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මොකක්ද මේකේ තිබෙන හදිසිය? නන්නාඳුනන තුවක්කුකාරයෝ එන්නේ නැහැ. ගෝනි බිල්ලෝ එන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මොකක්ද හදිසිය කියන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද නැහැයි කියලා කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දිගින් දිගටම විවාදයකට යන්න දෙන්න බැහැ. එතුමාගේ ප්‍රශ්නයත් තිබෙනවා. මෙතුමාගේ ප්‍රශ්නයත් තිබෙනවා. රීති අත්හිටුවලා යෝජනාවක් ගේනවාට ඔබතුමන්ලා කැමැතිද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රීති අත්හිටුවීම තුළ මගේ යෝජනාව අද දවසේත් විවාද කරන්න බැරිව යනවා. ඒ වාගේම මගේ වරප්‍රසාද උල්ලංඝණය වනවා වාගේම ජනතාවගේ වරප්‍රසාද උල්ලංඝණය වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉස්සෙල්ලා යෝජනාව ඉදිරිපත් කරන්න දෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා සභාවෙනුත් අහන්න. සභාවෙන් විමසන්න. මගේ යෝජනාව හදිසියි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනා වාඩි වෙන්න. අද දවසේ න්‍යාය පත්‍රය අනුව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත්, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාත් න්‍යාය පත්‍රයට ඇතුළත් කරපු යෝජනා දෙකක් පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ තිබෙනවා. මම හිතන්නේ,

[ගරු සභාපතිතුමා]

මේ යෝජනා දෙක අවස්ථා පහකදී දිගින් දිගටම යම් යම් හේතු නිසා කල් ගියා. මම ඒක පිළිගන්නවා. අසාධාරණයක් සිද්ධ වුණා. ඒ වාගේම ඔබතුමා ඉදිරිපත් කරපු යෝජනාවටත් ඇත්තටම අපි අවස්ථාවක් දෙන්නට ඕනෑ. නමුත් එතුමා සභාවේ විරෝධතාවයක් යොමු කළා, එතුමාගේ යෝජනාව දිගින් දිගටම කල් ගිය නිසා එතුමාට අසාධාරණයක් සිද්ධ වෙනවා කියලා. ඒ නිසා මූලාසනය වශයෙන් මට සිද්ධ වෙනවා, ඔබතුමා ගෙනෙන රීති අත්හිටුවීමේ යෝජනාවට මේ සභාවේ කැමැත්ත ගන්න. මට එහෙම කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ කරන්න හදන්නේ, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ගෙනෙන යෝජනාවල් සම්බන්ධයෙන් වැරදි සහගත, අයුක්ති සහගත තීන්දුවක් ගෙනෙන්නයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමාගේ යෝජනාව ගේනවාට අපි එකඟයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම මොකක්ද මේ කරන්නේ කියලා හෘද සාක්ෂියෙන් අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිසිම ගැටලුවක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, මගේ යෝජනාව හදිසියි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේවා ගන්න ඉඩ දෙන්න. මේවා ගන්න කොට තමයි -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම මාස 05 ක් තිස්සේ මේ ඉන්නේ. මාව එවලා තිබෙන්නේ ජනතාව. ඒ නිසා මම ජනතාවගේ උවමනාව සභාවට ගෙනැල්ලා තිබෙන්නේ. මාස තුනක් තිස්සේ යෝජනාව ගන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ බහුතරයක් ගරු මන්ත්‍රීවරු ඉල්ලීම් කරනවා නම් මම ඉඩ දෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මගේ යෝජනාව හදිසි එකක්. මගේ යෝජනාව ගන්න ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා සභා රීති අනුව ඔබතුමාගේ රීති අත්හිටුවීමේ යෝජනාවට සභාවේ බහුතරයක් කැමැති නම් මම ඉඩ දෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. මම විරුද්ධ වෙන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දැන් ඒ කියන්නේ,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බහුතරයක් නොවෙයි. මන්ත්‍රී සංඛ්‍යාව. ගරු විපක්ෂ නායකතුමා මෙතැන පොඩි ගැටුමක් තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගැටුම මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව දිගින් දිගටම කල් යන නිසා එතුමාගේ වරප්‍රසාද කඩවීමක් වෙලා තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කළාට ප්‍රශ්නයක් නැහැ. මට සිද්ධ වෙනවා මේ පිළිබඳව සභාවේ -

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services and Information)

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය කර්ය පටිපාටි රීති අංක 107(3) ට යොමු කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ ඔක්කෝම අඩුම ගණනේ මන්ත්‍රීවරයාට තමන්ගේ යෝජනාව ඉදිරිපත් කරන්නවත් මේ සභාවේ ඉඩ දෙන්නේ නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, මගේ යෝජනාවක් තිබෙනවා. වෙන යෝජනා ගෙනෙන්න බැහැ. හදිසි යෝජනාව මගේ එක.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

යෝජනාව ආවට පස්සේ ඔය ඔක්කෝම කියන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගෙනාවට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා ඔබතුමා ඉදිරිපත් -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු විපක්ෂ නායකතුමාට තිබෙන හදිස්සිය රටේ මිනිස්සුන්ට නැහැ. රටේ මිනිස්සුන්ට තිබෙන හදිස්සියට තමයි අපි අපේ යෝජනා ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, රීති අංක 107(3) පැහැදිලිව තිබෙනවා,

*"අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන විට හැර යෝජනාවට පක්ෂවන මන්ත්‍රීවරුන් ගණන ගණ පූර්ණයට අවශ්‍ය ගණනට අඩු වන්නේ නම් එම යෝජනාව සම්මත නොවූ ලෙස සැලකිය යුතුය."*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ කියන්නේ අඩු වන්නේ නම් කියන්නේ, සභාවේ ගණ පූරණයද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ ගණ පූරණය නොවෙයි. යෝජිත යෝජනාවට -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඕකෙන් එහෙම ගම්‍ය වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගම්‍ය වෙනවා. මේකේ තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

107(3)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙනවා. ඔබතුමා පිළිගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පිස්සුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පිළිගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ රීති බින්තැන්නේ තිසාහාමිගේ නීතිය වාගේ. ඕනෑ ඕනෑ පැත්තට හරවා ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිසාහාමිගේ නීතිය නොවෙයි. එහෙම නීතියක් නැහැ. මට සභාපතිවරයා වශයෙන් පෙනී යනවා ඔබතුමාට අවශ්‍ය ගණ පූරණය මෙතැන නැහැයි කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒකට මේ සභාවේ ගණ පූරණය ඕනෑ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

සභාවේ ගණ පූරණය? කොහෙද තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ ගණ පූර්ණය නොවෙයි.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අමාත්‍යවරයෙකු විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට හැර යෝජනාවට පක්ෂ වන ගරු මන්ත්‍රීවරුන්ගේ ගණ පූරණය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීවරුන්ගේ ගණ පූරණය -

[සභාවේ ඝෝෂා]

මේක තේරුම් ගන්න.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අපේ ගණ පූරණයේ ගැටලුවක් නැහැ නේ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, රීති ප්‍රකාරව රීති අත්හිටුවීමට ඡන්දය විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේකට ඡන්ද විමසීමකට යන්න අවශ්‍ය නැහැ. මෙය රීතිවල පැහැදිලි තිබෙනවා. යෝජනාවට අවශ්‍ය මන්ත්‍රීවරුන් මෙතැන නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාට කියන්න බැහැ. ඒක බලන්න ඕනෑ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාටවත්, මටවත් ඒක තීරණය කරන්න බැහැ. මෙතුමා රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කළාම ඔබතුමා සභාවට ඉදිරිපත් කළ යුතුයි. එවිට මන්ත්‍රීවරු 35 දෙනෙක් යෝජනාවට පක්ෂ නම් විරුද්ධ ගණන කීය වුණත් ඒ යෝජනාව විවාදයට ලක් කරන්න. ඔබතුමා මේ ඡන්දය විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ මතයේ මම ඉන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, යෝජනාව කියවන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කෑ ගහන්න එපැයි කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෑ ගහන්න එපා. ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න කෝ. අටුවා ටීකා එපා. ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඉන්න කෝ. දැන් මම මෙච්චර වෙලා මූලාසනයට කිව්වේ මට යෝජනාව ඉදිරිපත් කරන්න දෙන්න කියලා. ඒකටවත් ඉඩ දුන්නේ නැහැ. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා කිව්වාම තමයි ඔබතුමාට එහෙමවත් සිහියට ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. කමක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේක සම්පූර්ණයෙන් වැරැදියි. මම රීති අත්හිටුවීමට විරුද්ධයි. මගේ වරප්‍රසාදයක් උල්ලංඝණය වෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

රීති අත්හිටුවීමට විරුද්ධ වෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා යෝජනාව ගෙන එන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දැන් ගරු සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දිගින් දිගට නැඟිට කථා කරනවා. දැන් ඉස්සෙල්ලා තිබෙන්නේ එතුමාගේ යෝජනාව නොවෙයි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා යෝජනාව ගෙන එන්න කෝ.

## රීති අංක 107 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 107

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, *"පොදු වැදගත්කමින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්යපටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව සහ ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මගේ යෝජනාව -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

යෝජනාව ගෙන එන්න බැහැ. කැමැත්ත අහන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දැන් ඡන්දයකට යන්න ඕනෑද? ඉතින් යෝජනාව දන්නේ නැතිව කොහොමද ඡන්දය තියන්නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රීති අත්හිටුවලා තමයි යෝජනාව ගෙන එන්න ඕනෑ. ඒ නිසා රීති අත්හිටුවීමට මම විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා,

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා රීති ඉගෙන ගන්න. තව ඉගෙන ගන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

විපක්ෂ නායකකමට සුදුසු නැහැ ඔහොම ඉගෙන ගන්නේ නැතිව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. 107(3) යටතේ මේ යෝජනාව ගෙනාවට පස්සේ මේ යෝජනාව මොකක්ද කියලා අපි දැනගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉස්සෙල්ලා රීති අත්හිටුවලා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ රීති අත්හිටුවලා ගෙනෙන යෝජනාව මොකක්ද කියලා දැන ගන්න ඕනෑ. රීති අත්හිටුවන්න කැමැතිද? නැද්ද? කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි කොළ බෙදලා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මේ තියෙන්නේ පිටපත් කියවන්න.

**ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra De Silva

මේ තියෙන්නේ කියවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද රීති අත්හිටුවීමේ යෝජනාව පිළිබඳව සභාවේ විරෝධතාවයක් පැන නැඟුන නිසා එම රීති අත්හිටුවීමේ යෝජනාවට ඡන්දයක් විමසන්නට මට සිද්ධ වෙනවා. ඒ පිළිබඳව මෙම සභාවේ එම යෝජනාවට කැමැති ගරු මන්ත්‍රීතුමන්ලාට නැඟී සිටින ලෙස මම ආරාධනා කරනවා. පක්ෂ අය. කරුණාකර වාඩි වෙන්න. එම රීති අත්හිටුවීමේ යෝජනාවට විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැඟී සිටින්න. කරුණාකර වාඩි වෙන්න.

ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද රීති අත්හිටුවීමේ 107 යෝජනාව, 107(3) කාර්ය පටිපාටි රීති යටතේ අදාළව අවශ්‍ය ගණ පූර්ණය නොමැති නිසා එම යෝජනාව මෙම සභාවේ ප්‍රතික්ෂේප වූ යෝජනාවක් වශයෙන් මෙම අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

න්‍යාය පත්‍රයානුකූලව ඊළඟට තිබෙන්නේ -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

36(1) යටතේ මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවට අදාළ රීති අත්හිටුවීමේ යෝජනාව ගේන්න ඉස්සෙල්ලා මේ පිළිබඳව ගරු සභාපතිතුමා ඉතාම අවබෝධයෙන් යුක්තව කටයුතු කරන්න කියලා. මම කිහිපවරක්ම මේ සභාවේදී ඉල්ලීමක් කළා, මට මේක ඉදිරිපත් කරන්න ඉඩ දෙන්නය කියලා. තමුන්නාන්සේ මට රීති අත්හිටුවීමේ යෝජනාව ගේන්නවත් අවකාශය සලසා දුන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දුන්නා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉන්නකෝ. තමුන්නාන්සේ කට වහගෙන ඉන්න පොඩ්ඩක්. හරි. (බාධා කිරීම්) තමුන්නාන්සේලා කට වහගෙන ඉන්නේ නැහැයි කියන්නේ සභාපතිතුමාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

කියන එකයි. ඒ හින්දා එතුමාට අගෞරව කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ගරු විපක්ෂ නායකතුමා ඔබතුමා ඒ අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමාටයි අගෞරව කරන්නේ අර පැත්ත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. (බාධා කිරීම්) ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ සභාවේ කරන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ අය කියන්නේ -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ප්‍රශ්නේ තිබෙන්නේ ගරු විපක්ෂ නායකතුමා සභාවේ රීති දන්නේ නැතිව කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ අයිතිය එතුමා ප්‍රකාශ කළේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වාගේ වචන මම හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරනවා. ඒවාගේ වචන ප්‍රකාශ කරන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කියන්නේ, ඔබතුමා මේ සභාවේ ප්‍රධානියා හැටියට ඔබතුමාගේ අදහසට ඒ අයට අවනත වෙන්න බැහැ නේ. දැන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම අවනතවීමක් නැහැ. කිසිම අවනත වීමක් නැහැ එහෙම. මම ඔබතුමාටත් සලකන්නේ එකයි. ඒපැත්තටත් එකයි. වෙනසක් නැහැ ඒකේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි මොනවා කරන්නද? 35 ක් එකතු කර ගන්න -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ ඔබතුමාගේ යෝජනාව මන්ත්‍රීවරු 35ක් හිටියා නම්, අනිවාර්යයෙන් යෝජනාව ගන්න - 35 ක් නැහැ නේ දැන් ඉතින්? 35 ක් නැහැනේ? මෙතැන. 28 යි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමා ඒක ගණන් කළාම නේ? මම කියන්නේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

රීති පොත කියවන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු මන්ත්‍රීවරයෙකුට පුළුවන් විරුද්ධත්ව මතය ප්‍රකාශ කරන්න රීති අත්හිටෙව්වායින් පස්සේ -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා, රීති පොත කියවන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු ගරු මන්ත්‍රීතුමා. න්‍යාය පත්‍රය අනුව මීළඟට තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. විශේෂයෙන්ම දැන් දින කිහිපයකට කලින් මම ගියා මැද කොළඹ මැතිවරණ කොට්ඨාශයේ කොළඹ 12, මධ්‍ය ප්‍රදේශය කියන ප්‍රදේශයට. එක දවසක් නොවෙයි. දින කිහිපයක්ම ගියාම, ඒ ප්‍රදේශයේ ජනතාවට - දැන් මටත් අවශ්‍යතාවයකට පානීය ජලය සොයා ගන්න ඕනෑ වුණාම - කොළඹ හදවතේ දිනකට පැය පහයි ජලය ලබා දෙන්නේ. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එය වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. ඒ ප්‍රශ්නවලට ඉඩ දෙන්න බැහැ. ඒක වෙන ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බොරු වරප්‍රසාද.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ජල සම්පාදන ඇමති කෙනෙක් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ දවස්වල වතුර බොන්නේ නැහැ නේ ඕගොල්ලෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ යෝජනාව ගේන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මන්ත්‍රීතුමා වතුර බොන්නේ නැහැ නේ මේ දවස්වල.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමා නොදන්නා බයිලා කථා කරන්නේ නැතිව ඉන්නවාද පොඩ්ඩක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යෝජනාව ගේන්න.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
## PRIVATE MEMBERS MOTION:
## බස්නාහිර පළාතේ කැළි කසළ සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව විධිමත් කිරීම
### REGULARIZING THE GARBAGE, SOLID WASTE MANAGEMENT OF WESTERN PROVINCE IN COLLABORATION WITH URBAN DEVELOPMENT AUTHORITY

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, "*බස්නාහිර පළාත තුළ කැළි කසළ, සන අපද්‍රව්‍ය නිසි අයුරින් පාලනය කිරීම, එකතු කිරීම, බැහැර කිරීම හා එහි අතුරුඵල ලෙස විදුලි නිෂ්පාදනය කිරීම හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාතේ සන*

*අපද්‍රව්‍ය අධිකාරිය පුරා වසර 07 කට අධික කාලයක් තිස්සේ අපොහොසත් වී ඇත.*

*මෙම කාලය තුළ පළාතේ ප්‍රධානතම හා අත්‍යවශ්‍යම විෂයයක් වන මෙම ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීත්වය ඉහළ තත්ත්වයක ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පළාතටම දැනී ඇත.*

*එම නිසා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනට කර ගෙන යනු ලබන නගර සංවර්ධන ක්‍රියාවලිය තවත් ශක්තිමත් කරමින් මෙවැනි ව්‍යාපෘති සඳහා වඩාත් බල සහිත මූල්‍ය ශක්තියෙන් හෙබි තාක්ෂණික හැකියාවක් ඇති මධ්‍යම රජය සතු නාගරික සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව යම් කාල රාමුවකට සීමා කරන ලද කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[පූ.භා.11.25]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අද බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව මුහුණ දෙන වඩාත්ම බරපතළම අර්බුදය, කැළි කසළ අර්බුදය බවට අද පත් වෙලා තිබෙනවා. වෙනත් රටක නම් මේ කැළි කසළ කළමනාකරණය කරලා, ඒ අදාළ පළාත ආදායම් උපයන ව්‍යාපෘතියක් බවට මෙය අනිවාර්යයෙන්ම පත් කර ගන්නවා ගරු සභාපතිතුමනි. නමුත් අවාසනාවකට මේ රටේ පසුගිය අවුරුදු හතකට අධික කාලයක් තිස්සේ බස්නාහිර පළාත් සභාවේ සන අපද්‍රව්‍ය අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන්න වුණු සෑම යෝජනාවක්ම අසාර්ථක වුණා ගරු සභාපතිතුමනි. හැම තිස්සේම දේශපාලන අධිකාරිය මේ සඳහා මැදිහත් වුණා. කිසිම දවසක ටෙන්ඩර් පටිපාටියට අනුකූලව විශේෂයෙන්ම, විදේශ සමාගම් කිහිපයක් ඉතිහාසයේ මේ ව්‍යාපෘතිය සඳහා මැදිහත් වුණා. ගරු සභාපතිතුමනි, එක් වරක් මුලින්ම ආපු සමාගම පිළිබඳව මේ පළාත් සභාවේදී මම ඇහුවාම, මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න මොනවාද ඔවුන්ට තිබෙන සුදුසුකම්, මොනවාද තිබෙන මූල්‍ය ශක්තිය කියලා අවසානයේදී ඒ සමාගමට තිබුණේ ඩාර්ලි පාරේ මේසයක් සහ පුටුවක් විතරයි ගරු සභාපතිතුමනි. ගෝල්ඩන් සන්රයිස් කියන සමාගමක් ඉදිරිපත් වෙලා, ඉතිහාසයේ බස්නාහිර පළාත් සභාවේ අවුරුදු හතරක කාලයක් විනාශ කරලා දැම්මා විතරක් නොවෙයි, අද කැස්බෑව ආසනයේ ජල පෝෂිතයකට දවසකට කුණු ටොන් 500 ක් බහාලන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමාත් මමත්, ඒ වාගේම තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඒ ප්‍රදේශය නියෝජනය කරනවා. අද ඒ ප්‍රදේශයේ පානීය ජල ප්‍රශ්නය උග්‍ර වෙලා. ලෙඩ රෝග වැඩි වෙලා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය ඉතාමත්ම අයහපත් තත්ත්වයක තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, අවස්ථාවෙන් අවස්ථාවට විවිධ සමාගම්වලින්, විදුලි නිෂ්පාදන ව්‍යාපෘතීන් සඳහා බස්නාහිර පළාත් සභාව ටෙන්ඩර් කැඳවනවා. විදේශ සමාගම් එනවා. දැන් ඇවිල්ලා ඉන්න ආයෝජකයා කියනවා, මගේ සල්ලි ටික දෙන්න මට යන්නය කියලා.

ගරු සභාපතිතුමනි, මේ විෂය බස්නාහිර පළාත් සභාවට භාර දීලා මධ්‍යම ආණ්ඩුව ඇඟ බේරා ගත්තාට ටෙන්ඩර් පටිපාටියට කොළේ දාගන්න ගියාම නම් මධ්‍යම රජයේ සමහර දේශපාලඥයෝ මැදිහත් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශාල අර්බුදයක් බවට මේ ව්‍යාපෘතිය පත් වෙලා තිබෙනවා. අද කැළි කසළ සමහර දේශපාලඥයන්ගේ ආදායම බවට පත් වෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපි බලන්නේ විදුලිය නිෂ්පාදනය කරලා, කොම්පෝස්ට් නිෂ්පාදනය කරලා සාර්ථක ව්‍යාපෘතියක් බවට මේක පත් කරන්නේ කොහොමද කියන එකයි. නමුත් ගරු සභාපතිතුමනි, අද කැස්බෑව ආසනයේ ජනතාවට කෝට්ටේ කුණු ගෙන්වා ගන්න වෙලා තිබෙනවා. මොරටුව නගර සභාව පානදුරේ කුණු හොරෙන් ගෙනැල්ලා කරදියානට බාලා යනවා. හෝමාගම කුණු ගේනවා. තවත් මහරගම කුණු ගේනවා. දෙහිවල - ගල්කිස්ස නගර සභා බල ප්‍රදේශයේ කුණු ගේනවා. සමහර වෙලාවට කොළඹිනුත් හිටපු ගමන් එනවා. ඇවිල්ලා මේ ඔක්කොම බාලා යනවා. මුලින්ම කිව්වේ මේක විදුලි නිෂ්පාදනය කරනවා කිව්වා. කොම්පෝස්ට් හදනවා කිව්වා. දාන ඒවා පස් ආලා වහනවා කිව්වා. දැන් ගරු සභාපතිතුමනි, මේ ස්ථානයට ගියාම බලාගන්න පුළුවන් මොන වාගේ ඛේදවාචකයක් ද වෙලා තිබෙන්නේ කියලා. කුණු ටොන් ගණන් දානවා. ඊට අමතරව අපි කවුරුත් නොදන්නවා වුණාට හොරෙන් ගෙනැල්ලා වෙනත් පෞද්ගලික

[ගරු නිරෝෂන් පාදුක්ක]

සමාගමුත් කුණු දාලා මෙතැන ගනුදෙනු යටින් කර ගන්නවා. ඒ නිසා මේ ව්‍යාපෘතිය කවදාවත් ක්‍රියාත්මක වුණේ නැහැ. හැමදාම විදේශ ආයෝජකයෙක් ආවොත් අපේ අය බැලුවේ කොහොමද මේකාගේ දත ගලවන්නේ කියලා විතරයි. කොහොමද මේකාගෙන් වැඩේ කර ගන්නේ කියලා විතරයි. හැබැයි, බස්නාහිර පළාත් සභාවේ ජනතාවට විශේෂයෙන්ම කැළි කසළ සම්බන්ධව ඝන අපද්‍රව්‍ය අධිකාරියට යමක් කරන්න බැරි වුණා.

ගරු සභාපතිතුමනි, අපි දැකලා තිබෙනවා, අපි අහලා තිබෙනවා. විශේෂයෙන්ම අද ලංකාවේ මධ්‍යම ආණ්ඩුව වැඩියෙන්ම මුදල් වෙන් කරන ආයතනයක් වෙලා තිබෙනවා මෙය. විශේෂයෙන්ම කථා කරන කොට අපි දන්නවා නාගරික සංවර්ධන අධිකාරිය. අද නාගරික සංවර්ධන අධිකාරියට මූල්‍ය ශක්තිය තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියට දැන් මේ වන කොට තාක්ෂණික ශක්තිය තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවට අවුරුදු හතක් මේක කරන්න බැරි වුණා නම්, අපි ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, මේ ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කර ගෙන හරි මේ කැස්බෑව ජනතාව විඳින දුකෙන් කැස්බෑව ජනතාව ගලවා ගන්නට ඕනෑ. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන තාක්කල් කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය සහ විදුලි නිෂ්පාදන ක්‍රියාවලිය නොවෙන්නේ නම්, අපිත් කැමැතියි මේ ව්‍යාපෘතිය මෙතැනින් ඉවත් කරන්න. නමුත් අපට ආරංචිය තිබෙනවා කැස්බෑවට කුණු ගෙනැල්ලා, කැස්බෑවෙන් කුණු ලොරිවල දාලා, ආයිත් අරගෙන ගිහිල්ලා කොළොන්නාවට දාලා, කොළොන්නාවෙන් කෝච්චිවල දාගෙන හලාවතට කුණු ගෙනියනවා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පුත්තලමට.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පුත්තලමට කුණු ගෙනියනවා කියලා. මම දන්නේ නැහැ කොපමණ මුදලක්, පිරිවැයක් යයිද කියලා. මොරටුවෙන් ගේන කුණු කිලෝ එකක් පිළියන්දලට ගෙනැල්ලා, කරදියානේ බාලා, කරදියානෙන් ආයිත් පටවා ගෙන කොළොන්නාවට ගෙනිහිල්ලා, කොළොන්නාවෙන් කෝච්චි පෙට්ටියකට පටවලා ආයිත් ගිහිල්ලා පුත්තලමට දාන්න අපි දන්නේ නැහැ කොපමණ මුදලක් මේකට යයිද කියලා ගරු සභාපතිතුමනි. ඒ නිසා මෙය විශාල අනතුරක් බව මේ සුනිල් ජයමිණි මැතිතුමා අපි ඔක්කොම දකිනවා. ඒ නිසා මෙය විසඳන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව මේ දක්වන අලස දායකත්වය තුළ මේ ප්‍රශ්නය විසඳගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා නිලධාරී ප්‍රශ්නය තිබෙනවා. මේ අධිකාරිය තුළ නිලධාරිවාදය තිබෙනවා. සභාපතිතුමායි එතැන අධ්‍යක්ෂතුමායි අතර ප්‍රශ්න තිබෙනවා. අධ්‍යක්ෂතුමා දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නාමමාත්‍රිකයි. ආරංචිය තිබෙන්නේ, දැන් එතුමාට ගෙදර යන්න කියලා. එතැන හිටිය නිලධාරියාව එළවලා තිබෙනවා. දැන් එතැන අවුරුදු ගණනක් වැඩ කරපු පුද්ගලයාව අයින් කරලා තිබෙනවා. විශාල ප්‍රශ්න තිබෙනවා.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව මේ පිළිබඳව දක්වන මේ අපැහැදිලි ප්‍රතිපත්තිය තුළ කරදියාන කැළි කසළ බහාලන ස්ථානය පිළිබඳව වහා තීන්දුවක් ගැනීමේ අවස්ථාව මේ වන කොට උදා වෙලා තිබෙනවා. මේකේ තිරය පිටුපස බොහෝ කථා තිබෙනවා. තිරය පිටුපස කුමන්ත්‍රණ තිබෙනවා. තිරය පිටුපස මූල්‍ය ගනුදෙනු තිබෙනවා. තිරය පිටුපස තවත් විවිධාකාර කටයුතු තිබෙනවා. ඒ නිසා අපි එතැනට යන්න කැමැති නැහැ. ඒ ගැන කථා කරන්න නොවෙයි සභාවට මේ යෝජනාව ගෙනාවේ. කරුණාකරලා මේ යෝජනාවෙන් අපි බලාපොරොත්තු වෙන්නේ ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘතිය අවුරුදු හතක් බස්නාහිර පළාත් සභාවේ සුදු අලියෙක් බවට පත් වුණා. ඒ නිසා තවදුරටත් මේක ක්‍රියාත්මක වෙන්න බැහැ. ඒ නිසා ප්‍රධාන අමාත්‍යවරයා මේ සම්බන්ධයෙන් මීට වඩා වැඩි දායකත්වයක් ලබා දීලා, මේ ව්‍යාපෘතිය සඳහා යම් මූල්‍ය ශක්තියකින් හෙබි ආයතනයක් එක්ක ගනුදෙනු කරලා හරි මේ ප්‍රශ්නය විසඳලා දෙනවාද? එහෙම නැත්නම් තවදුරටත් කැස්බෑව ජනතාවට කියනවාද කවුරුත් නොකන කුණු කැස්බෑවේ මිනිස්සුන්ට කන්න කියලා. ඒ නිසා මේක මෙතැනින් එහාට යන්න බැහැ. මේ සභාව හරහා ප්‍රධාන අමාත්‍යතුමා මීට වඩා මැදිහත් වීමකින් යුතුව මේ ප්‍රශ්නය දිහා බලලා, මේ ප්‍රශ්නය විසඳලා කැස්බෑව ජනතාව විඳින මේ දුකෙන් බේරා ගන්නට ඕනෑ.

ඒ වාගේම පළාතේ ප්‍රධාන ආදායමක් කර ගන්න තිබෙන සම්පතක් මේ කිසිදු කළමනාකාරීත්වයකින් තොරව

ක්‍රියාත්මක වීම සහ විශේෂයෙන්ම සමහර පුද්ගලයින්ගේ මැදිහත්වීම් - කවුරුත් එන්න බලන්නේ මේ ව්‍යාපෘතිය කරන්න නොවෙයි. අපට හම්බ වෙන ගණන කොහොමද බලන්න. ගරු සභාපතිතුමනි, මේ වන කොට මධ්‍යම ආණ්ඩුව කැස්බෑවේ කරදියානේ කුණු ගොඩට කැබිනට් පත්‍රිකා අටකට වැඩිය ඉතිහාසයේ දාලා තිබෙනවා. එකක්වත් ක්‍රියාත්මක කරලා නැහැ. විදේශ සමාගම් එනවා. හැබැයි, මේ කරදියාන ඉඩම කාලයක් රුපියල් පන්සීයට අක්කරය විකුණන්න ගියා. ඒවාට අපි ජයමිණි මැතිතුමන්ලා මැදිහත් වුණා. අද මේ සඳහා අවශ්‍ය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ වුවමනාව දැනිලා තිබෙනවා. ඒ නිසා මේක කල් මරන්න බැහැ. කාලය ගත කරන්න බැහැ. ගරු සභාපතිතුමනි, වහාම මේ ප්‍රශ්නය විසඳන්න බස්නාහිර පළාත් සභාව මැදිහත් වෙන්න ඕනෑ. ඒ සඳහා බස්නාහිර පළාතට මූල්‍ය ශක්තියක් නැත්නම්, තාක්ෂණික ශක්තියක් නැත්නම් එයට විශේෂයෙන්ම මධ්‍යම රජය සතු නාගරික සංවර්ධන අධිකාරිය දායක කර ගෙන යන්න ඕනෑ. කොළඹ නගරය පිරිසිදු කරනවා. අනික් නගර පිරිසිදු කරනවා. හැබැයි, ලස්සන ගොඩනැගිලි කොළඹ නගරයේ ඉදි වුණාට, පරණ ගොඩනැගිලි හදලා ලස්සන කරලා අරගෙන ගියාට, ඒ කොළඹ නගරයේ තිබෙන කුණු ටික ගෙනැල්ලා කැස්බෑවට දාලා යනවා. මේක නවත්වා ගන්න ඕනෑ ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි විශ්වාස කරනවා නාගරික සංවර්ධන අධිකාරියටත් මේ පිළිබඳව විශාල වගකීමක් තිබෙනවා. ඒ වගකීම භාර අරගෙන රජයේ දේශපාලන අධිකාරිය, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා මේ පිළිබඳව ක්‍රියාත්මක කරයි. මේ යෝජනාව මේ න්‍යාය පත්‍රයේ දවස් ගණනක් තිබිලා අද යන්තම් සාකච්ඡාවට භාජනය කෙරුණත් මෙය තවත් මිය යන යෝජනාවක් නොවී ජනතාවට මේකේ ප්‍රතිඵල ගෙන දෙන යෝජනාවක් බවට පත් කරන්න මේ සභාවට යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[පූ.භා.11.34]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මම මේ බස්නාහිර පළාත් සභාවට නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වුණේ. අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ වසර නවයක් සභාපති ධූරය දරලා මට මේ ගමන එන්න අවස්ථාව ලබා දුන්න අපේ පක්ෂයේ නායකතුමා ප්‍රධාන සියලුම දෙනාටත්, අපේ ප්‍රදේශයේ ජනතාවටත්, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවටත් මගේ ප්‍රණාමය ප්‍රථමයෙන්ම මම පුද කරනවා. විශේෂයෙන්ම අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් අපි කටයුතු කරන කාලේ පළාත් පාලන ආයතනයක ප්‍රධානියෙක් වශයෙන් අපි මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් තමයි මේ ඝන අපද්‍රව්‍ය ප්‍රශ්නය. ඒ නිසා ගම්බද කෙනෙක් ප්‍රාදේශීය සභාවට පත් වුණොත් ඒ කෙනාට මේ ඝන අපද්‍රව්‍ය ප්‍රශ්නය දැනෙන්නේ බොහොම අඩුවෙන්. නමුත් නගරය තුළ මේ ඝන අපද්‍රව්‍ය රැස් වෙන කොට මේවා කළමනාකරණය කරන්නට ඕනෑ. බැහැර කරන්නට ඕනෑ. එතකොට මේ ප්‍රාදේශීය සභාවට තිබෙන මූල්‍ය ශක්තිය මදි වෙනවා. මම හොඳින් දන්නවා. බස්නාහිර පළාත් සභාව ඒ සඳහා මැදිහත් වෙමින්, මේ කසළ අපහරණය කරන්න කොපමණ උදව් උපකාර කරමින් පළාත් පාලන ආයතන සඳහා යොමු වෙලා තිබෙනවාද කියලා.

විශේෂයෙන් අපි මේ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කථා කරන කොට මීට වසර 10 කට 12 කට පෙර පළාත් පාලන ආයතනයට ගමේ පුද්ගලයෝ එනවා. ඇවිල්ලා කියනවා, කුණු ටික අපේ වත්තට ගෙනැල්ලා බාන්න. අපේ වත්තට මේ කුණු ටික දෙන්න. මේ වාගේ ජනතාව සභාවට ඇවිල්ලා කුණු අරගෙන ගිය යුගයක් තිබුණා. නමුත් මේ ඉටි වර්ගයේ වගේ අපද්‍රව්‍ය සමාජයට ඒමත් සමඟ මේ අපද්‍රව්‍ය ටික ජනතාව භාර ගන්න එක දිගින් දිගටම ප්‍රතික්ෂේප කළා. ඊට පස්සේ මේවා මහා ගැටළු බවට පත් වෙලා ප්‍රාදේශීය සභාවේ කාර්යාලය ඉස්සරහා ට්‍රැක්ටර් ටික නවත්වාගෙන තිබෙන කොට ඒ අය අසරණ වුණා. මේවා කොහාටද දාන්නේ? ඒ අනුව මේවාට ක්‍රම සහ උපදෙස් ලබා දෙන්න බස්නාහිර පළාත මම හිතන්නේ කටයුතු කළා. ඒ අනුව තමයි බස්නාහිර පළාතේ 2007 වර්ෂයේ අංක 01 දරණ බස්නාහිර පළාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තියක් ඇති කරලා, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඇතුළු සභාවේ ශක්තිමත්භාවය තුළින් ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ පළාත් සභාව කටයුතු කළ නිසා තමයි අනික් පළාත් සභාවකටත් කටයුතු කරන්න පුළුවන්කම ලැබුණේ.

ඒ අනුව අපේ ගෞරවය ඒ යුගයේත් අපි බස්නාහිර පළාත් සභාවට පුද කළා. ඒ විතරක් නොවෙයි. මේ බස්නාහිර පළාත මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී සත් ප්‍රණාම ක්‍රමයක් උපයෝගී කර ගන්නවා. ඒ උපයෝගී කර ගන්නා ක්‍රමය තුළ මේ කසළ අපහරණ ක්‍රමවේදය, කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ, මහ පරිමාණ වශයෙන් කොටස්

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

කරලා මේවා කරන විධිය කෙහොමද කියලා අපේ පළාත් පාලන අයාතනවලට දැනුවත් කිරීම් කරනවා. ඒ අනුව මේ කසළ අපහරණය කිරීමේදී ක්‍රමවේදයන් අවම කිරීම, නැවත භාවිතය කිරීම හා ප්‍රතිචක්‍රීකරණය. මේකට අපි කියනවා 3R ක්‍රමය කියලා. මේ අනුව මේවා අපට ඇවිල්ලා මේ බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂතුමන්ලා, ඒ සභාපතිවරු ඇවිල්ලා පුහුණු වැඩමුළු පවත්වලා ප්‍රදේශයේ ඒ කටයුත්ත නිසියාකාරව ඉටු කරපු නිසා තමයි ඒ පළාත් පාලන ආයතන අද ශක්තිමත් වෙලා තිබෙන්නේ. 2005 වර්ෂයේ ඉඳලා මේ වන කොට මේ පළාත් පාලන ආයතන සඳහා මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කරන්න මිලියන දහසක පමණ මුදලක් වැය කරලා තිබෙනවා. පළාත් පාලන ආයතනයට කර ගන්න බැරි, සමහරවිට තෝරන්න බැරි, සමහරවිට ප්‍රතිචක්‍රීයකරණය කර ගන්න බැරි මේවා කසළ අංගන බවට පත් කරලා, කළමනාකරණය කරනවා. බස්නාහිර පළාත මඟින් කසළ අංගන 21 ක් මේ පළාත තුළ ඇති කරලා, ඒ කසළවලින් විශාල ප්‍රමාණයක් කොම්පෝසට් බවට පත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඉතා විශාල වශයෙන් අද ඒවා දියුණු වෙලා තිබෙනවා. විශේෂයෙන් අත්තනගල්ල ආසනයේ අපෙත් තිබෙනවා. ඒවාට සේවකයෝ ලබා දුන්නා. ඒවාට උපකරණ ලබා දුන්නා. ඒ වාගේම ඉඩම් ප්‍රශ්න තිබෙන කොට ඉඩම් අපට ලබා දෙන්න කටයුතු කරනවා. මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාව කසළ සම්බන්ධයෙන් ඉතා විශාල වගකීමකින් කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. මේ අයගේ යම් යම් වැඩ සටහන් තිබෙනවා. ඒ කියන්නේ, මේ පළාත් සභාව හරහා අපට නොයෙක් ආකාරයේ ආධාර ලැබෙනවා. එකක් තමයි මූල්‍ය ආධාර ලැබෙනවා. ඒ වාගේම ට්‍රැක්ටර්. වර්ග කරන ලද, කොටස් කරන ලද ට්‍රැක්ටර් ලබා දෙනවා. ටිපර් රථ ලබා දෙනවා. අත් ට්‍රැක්ටර් ලබා දෙනවා. කරත්ත ලබා දෙනවා. දැනුවත් කිරීම් කරනවා. ගෙවල් ළඟට ගිහිල්ලා නාද කරලා කටයුතු කරනවා. එහෙම කරලා මේ කුණු ටික ට්‍රැක්ටර් ළඟට ගෙන්වා ගන්නවා. ඒ විතරක් නොවෙයි. කසළ කළමනාකරණය කරන්න භාජන ලබා දෙනවා. ඒ වාගේම බිම් ක්‍රම හඳුන්වා දීලා කසළ අවම කරනවා. කසළ සම්පතක් කරලා ජනතාව පාරට කසළ ටික නොදමන්න මේ පළාත් සභාව හරහා විශාල වැඩ කොටසක් කළාය කියන එක මම පෞද්ගලිකවම දන්නවා.

ඒ විතරක් නොවෙයි. ඉලක්කගත කණ්ඩායම් දැනුවත් කිරීම් විශාල වශයෙන් කරනවා. ඒ ඉලක්කගත කණ්ඩායම් අතර ප්‍රධාන තැනක් ගන්නවා, ප්‍රජාව දැනුවත් කිරීම. ඒ දැනුවත් කිරීම් කරලා යම් යම් කටයුතු කරනවා. අපි ඒ සඳහා පිවිතුරු පාසල් ක්‍රමය හඳුනා ගන්නවා. පෙර පාසල් කැකුළු කියලා අපේ පෙර පාසල් ක්‍රමය තිබෙනවා. සෞඛ්‍ය සම්පන්න රෝහල් ඒ සම්බන්ධව කටයුතු කරනවා. පිවිතුරු ආයතන සහ වෙනත් වෙනත් ක්‍රමවලින්. කසළ කියන්නේ සම්පතක්ය. මෙය කොහොමද කටයුතු කරන්නේ? මේක කළමනාකරණය කිරීම කියන හැම දෙයක් පිළිබඳවම මේ බස්නාහිර පළාත් සභාව මඟින් ලොකු දැනුවත් කිරීම් කරනවා. එම නිසා මම දන්නවා මේ කටයුත්ත සඳහා මේ බස්නාහිර පළාත විශාල වගකීමකින් කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන් කරදියාන ප්‍රශ්නය සම්බන්ධව මැදිහත් වන ගරු මන්ත්‍රීතුමා හඳුන්වනවා. අපි දන්නවා. මේ කසළ කියන්නේ ඉතාමත් සුවඳවත් දෙයක් නොවෙයි. කසළ කියන්නේ ගඳ ගහන දෙයක්. නමුත් පළාත් පාලන ආයතන අමාරුවේ වැටිලා ඉන්න කොට තමයි බස්නාහිර පළාත, මධ්‍යම රජය හා පෞද්ගලික ආයතන සම්බන්ධ වෙලා කටයුතු කරනවා විතරක් නොවෙයි. ඒ කරදියාන ප්‍රදේශයේ වුණත් නිකම්ම කසළ අපහරණය කරන්නේ නැහැ. සම්බන්ධීකරණ කමිටුවට මේ නිලධාරීන් කැඳවනවා. ප්‍රාදේශීය ලේකම්තුමා. MOH කාර්යාල තුනක්. ඒ වාගේ ආයතන ඒකරාශී කරලා, ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රජා කමිටු හදලා, වීදි කමිටු හදලා ප්‍රජාව දැනුවත් කරමින් තමයි කටයුතු කරන්නේ. ඒ ප්‍රදේශයේ පවුල් 30 ක් පමණ මේ කරදියාන කුණු ගොඩත් එක්ක ජීවත් වුණු අය. අද ඒ අයට යම් යම් ක්‍රමවේදයන් කියලා දීලා, ඒ අයගේ සෞඛ්‍ය සම්පන්නභාවය බලලා, ඒ අයට අද රුපියල් හැත්තෑ පන්දාහක පමණ ආදායම් තත්ත්වයක් උපද්දවන විධියට තමයි අද ඒ ප්‍රදේශය මේ කසළ ගොඩ සම්පතක් කර ගෙන තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. මේ ප්‍රදේශයේ මහා මාර්ග ටික හැදිලා තිබෙනවා. ඒ ඔය කියන්නා වූ අතුරු ප්‍රතිඵල ඇති වන්නා වූ දේවල්වලට යම් යම් උපක්‍රම හා ප්‍රතිකර්ම යොදමින් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා. මේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් විශාල වැඩ සටහන්, විශාල කැප කිරීම් ඒ වාගේම දැනුවත් කිරීම් කරමින් පවතිනවා.

තව අවුරුද්දක් දෙකක් වන කොට මේ කසළ ප්‍රමාණය තව වැඩි වෙනවා. 2050 වන කොට මේ ප්‍රදේශ නාගරීකරණය හරහා අති විශාල කසළ ප්‍රමාණයන් ඇති වෙනවා. බස්නාහිර පළාත කියන්නේ අපි ඔබ දන්නවා. මෙහේ ජනගහනයෙන් 60% ක් 67% ක් පමණ ජීවත් වෙන්නේ මේ ප්‍රදේශයේ. එතකොට භූමි ප්‍රමාණයෙන් 5.7 ක ප්‍රමාණයක් තුළ ජනගහනය 28% ත් 30% ත් අතර ප්‍රමාණයක් ජීවත් වෙනවා මේ බස්නාහිර පළාතේ. ජනගහනය අධික ප්‍රමාණයක් ජීවත් වන ඒ ප්‍රදේශය තුළ කසළ සම්බන්ධයෙන් මම දන්නා තරමින් සහ මට දැනෙන විධියටත්, මා අත්දැකීම් ලබපු පුද්ගලයෙකු වශයෙනුත් මේ බස්නාහිර පළාත් සභාව අපට වඩා ප්‍රාදේශීය සභාවේ සභාපතිට වඩා උවමනාවෙන් මේ පළාත් පාලන ආයතන දැනුවත් කරමින්, ඒ අය බල ගන්වමින්, ඒ අය කුල්මත් කරමින් මේ කටයුත්ත කරන්න කටයුතු කළාය කියන එක මා පැහැදිලි කරන්නට ඕනෑ.

බස්නාහිර පළාත තුළ මේ ඝන අපද්‍රව්‍ය සඳහා පළාත් පාලන ආයතන යොමු කරන්නට මේ බස්නාහිර පළාත් සභාව කටයුතු කළා විතරක් නොවෙයි, මම දන්නවා. මෙවර අයවැයෙන් පවා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා, මේ බස්නාහිර පළාතේ කසළ අපහරණය සම්බන්ධයෙන්. එම නිසා බස්නාහිර පළාත් සභාව මේ කසළ අපහරණය සම්බන්ධයෙන් ගන්නා වූ උත්සාහයත්, ඒ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ නිලධාරීන් ගන්නා උත්සාහයත් අගය කරමින් - එතුමා කිව්වා වාගේ යම්කිසි ගැටළුකාරී තත්ත්වයන් තිබෙනවා නම් ඒවාට MOH කාර්යාලය, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, ඒ වාගේම පළාත් පාලන ආයතන, ප්‍රජා කමිටු, ඒ වාගේම ප්‍රදේශයේ ජනතාවගේ සැදුම්ලත් කමිටුවකින් මේවා අවම කරන්නත් කටයුතු කරන්න බස්නාහිර පළාත් සභාවේ යම් අවධානය යොමු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. මට මේ බස්නාහිර පළාතේ නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් මාස කිහිපයකට හරි පස්සේ - ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් සමහරවිට ගොඩක් අපහසුතාවයට පත් වන්නේ මේ ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීම නිසා තමයි. මේ පළාත් සභාවේදී ඉස්සෙල්ලාම ඒ සම්බන්ධයෙන්ම කථා කරන්න ලැබීම සතුටු වන බව මතක් කරමින්, ඔබ හැම දෙනාටම සුභ දවසක් පතමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.43]

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මම පළමුවෙන්ම එතුමාට මගේ ස්තුතිය පුද කරනවා. බස්නාහිර පළාත් සභාවේ කැස්බෑව මැතිවරණ බල ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වන මම අප පළාතේ අද මුහුණ දීලා තිබෙන බරපතළම ගැටළුවක් සම්බන්ධව තමයි නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා යෝජනාව ගෙනාවේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් පාලනය වන කරදියාන කසළ රඳවනය අප පළාතේ ජනතාවට පීඩාකාරී, ජනතාවට ඔරොත්තු දෙන්නේ නැති, ඉතාම නරක විධියට මිනිස්සුන් හඳුන්වන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. මට මතකයි මේ කසළ අධිකාරිය පිහිටුවන කොට අපේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා මේ අධිකාරිය හැදින්නුවේ බස්නාහිර පළාතේම කසළ එක්රැස් කරන ආයතනයක් හැටියටයි.

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන ආයතනයක්. විදුලිබලය නිෂ්පාදනය කරන ආයතනයක්. ඒ වාගේ සුරංගනා ලෝකයක තමයි මේ ව්‍යාපෘතිය ආරම්භ කළේ. හැබැයි, මේ වන කොට මේ කැස්බෑව කසළ රඳවනයට පානදුර නගර සභාවේ කුණු ටොන් පහකට වැඩිය දවසකට එනවා. මොරටුව නගර සභාවේ කුණු ටොන් 50 කට වැඩිය දවසකට එනවා. දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ කුණු ටොන් 100 කට වැඩිය දවසකට එනවා. මහරගම නගර සභාවේ කුණු ටොන් 40 ක් 50 ක් විතර දවසකට එනවා. බොරලැස්ගමුව නගර සභාව, කැස්බෑව නගර සභාව සහ හෝමාගම ප්‍රාදේශීය සභාවේ කුණුවලින් මම හිතන්නේ, වැඩි ප්‍රමාණයක් හොරෙන් උඩුගහපත්තුව කියලා හඳුන්වලා මේකට ගෙනැල්ලා දානවා. දවසකට කුණු ටොන් 350 කට වැඩි ප්‍රමාණයක් අද කැස්බෑවට ගෙනැල්ලා දානවා. ඒ අවට සභාපතිවරුන්ට ප්‍රශ්නයක් නැහැ. ඒගොල්ලෝ සතුටින් හිනා වෙලා, කුණු ටික ගෙනැල්ලා දාලා සල්ලි ගෙවලා යනවා යන්න. සල්ලි එන්නේ පළාත් සභාවට. ටොන් එකකට මම හිතන්නේ රුපියල් 500 ක් ද කොහේද ගන්නවා. ඒ ගාණ බැඳලා ඒගොල්ලෝ යනවා. හැබැයි, මෙතැන නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතමා ඉන්නවා. අපේ ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. අපේ අනෙක් මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. ගාමිණී තිලකසිරි

[ගරු සුනිල් ජයමිණි]

ගරු සභානායකතුමා ඉන්නවා. අපේ පැත්තේ අපට මළ ගෙදරක යන්න බැහැ. දානේ ගෙදරක යන්න බැහැ. මිනිහෙක් හම්බ වෙන්න යන්න බැහැ. ගියාම මිනිස්සු අපෙන් අහනවා ගඳ එනවා. ගඳ දැනෙනවාද කියලා. අපට උත්තරයක් දෙන්න බැහැ. ඒ නිසා අද මේකට වගකියන්න ඕනෑ පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය. එතුමා කියන කථාව හරි. ඒකේ පූර්ණ බලතල සහිත විධායක අධ්‍යක්ෂවරයෙක් හිටියා. කවුරුත් කියන දේ අහන්නේ නැහැ. සභාපතිතුමා පැත්තකට ගිහිල්ලා හිටියා. මම මහ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. කොහොමහරි සභාපතිතුමාට දැන් බලය ගිහිල්ලා තිබෙනවා. නමුත් විධායක අධ්‍යක්ෂවරයා තවම ඉන්නවා. විධායක අධ්‍යක්ෂවරයා කරන්නේ මොනවාද? එතුමාගේ තිබෙන බලය මොකක්ද කියන එක පිළිබඳව අපි බොහෝ තැන්වල කථා කළා. මම දන්න විධියට විධායක අධ්‍යක්ෂවරයාට ජීවිත කාලයම මේ සභාවේ ඉන්න පුළුවන්කම තිබෙනවා. ඒ විධියට තමයි පනත හදලා තිබෙන්නේ.

ඒ නිසා අද බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමහර අය කියන විධියට කසළ ගොඩක් බවට පත් වෙලා තිබෙනවා. දැන් මේ වෙලාවේ අපට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. අධිකාරියේ මුදල් ගනුදෙනු පිළිබඳව මම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් එක්ක කථා කළා. මේ අධිකාරියේ මුදල් ගනුදෙනු පිළිබඳව අපි මොකුත් දන්නේ නැහැ. කවදාවත් ඒක පළාත් සභාවට එන්නේ නැහැ. අපේ ගිණුම් කාරක සභාවට ගිහිල්ලා අවුරුදු ගණනක් ගියාට පස්සේ එන්නේ. දැන් මම එක දෙයක් අහනවා. දවසකට කුණු ටොන් 350 ක් දානවා. දවසට කොපමණ පස් ගේනවාද මේක වහන්න? පස් කියුබ් 350 ක් ගේනවාද? ටොන් එකකට එක කියුබ් එක ගණනේ. අපි කවදාවත් දැකලා නැහැ එක පස් කියුබ් එකක්වත් මේක ඇතුළට ගේනවා. කුණු ටික ගෙනැල්ලා නිකම් හලලා දාලා යනවා. මම අහනවා. එක මන්ත්‍රීවරයෙක් පුළුවන්නම් කියන්න දවසකට මෙපමණ පස් ගේනවා කියලා. එක දවසකවත් මම දැකලා නැහැ, පස් ගේනවා. අපට ගිණුම් වාර්තා බලන්න බැහැ පස්වලට කොපමණ අය කරලා තිබෙනවාද කියලා. පස් කොපමණ ගෙනාවාද කියලා. මුලින් කිව්වේ එහෙම නොවෙයි. පස් දාලා වහලා, ගඳ නොයන්න කටයුතු කරනවා කියන එක තමයි කිව්වේ. නමුත් අද මේක අධිකරණයට ගිය ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. සෑම මාසයකට සැරයක්ම කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණයේ මේ නඩුව විභාග වෙනවා. එදාට ප්‍රාදේශීය ලේකම්තුමා අපේ කැස්බෑව සංවර්ධන කමිටුව හැටියට උසාවියට ගිහිල්ලා වාර්තා කරන්න ඕනෑ මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය කරන කටයුතු පිළිබඳව. එතකොට ඊට අමතරව හාස්‍ය ජනක කරුණු තමයි, මීට මාස කිහිපයකට කලින් හිටපු විධායක අධ්‍යක්ෂවරයා උසාවියෙන් අවසර ඉල්ලලා මෙතැන ඕනෑ තරම් ඉඩ තිබෙනවා. කොළඹ තිබෙන කුණු ටොන් 500 ත් ගෙනැල්ලා බාන්න පුළුවන් කියලා. එදා ප්‍රාදේශීය ලේකම්තුමා ඒකට විරුද්ධ වුණු නිසා ඒක නැවතුනා. නමුත් අද දැන් කුණු ටොන් 350 ක් හැමදාම එනවා. නමුත් මේක නිසි ලෙස කළමනාකරණය කරන්නේ නැහැ. අර එතුමන්ලා සඳහන් කළා වාගේ. දවසක්දා මමත් ගියා ලොකු උත්සවයකට. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් ආවා. ඒ විදුලි බල නිෂ්පාදන ව්‍යාපෘතියක් හැටියට. නමුත් ඒ ව්‍යාපෘතිය ආරම්භ කළා පමණයි. ඒක ඉස්සරහාට ගියේ නැහැ. ඒවා එතැනින් නැවතුණා. ඒ නිසා අද කැස්බෑව ආසනයේ කෙනෙක් හැටියට මටත් තිබෙන ලොකු ගැටළුවක් තමයි මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය නිසි ලෙස මේ කරදියාන කසළ රඳවනය පරිපාලනය නොකිරීම. ඒ නිසා පළාතේ මහජන නියෝජිතයෝ හැටියට අපි දැඩි අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා මම ප්රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලන්නේ. දැන් තමුන්නාන්සේගේ ආයතනයක් හැටියට මේක පාලනය වෙන්නේ. මේකට විසඳුමක් ලබා දෙන්න තමුන්නාන්සේ කටයුතු කරන්න. හැබැයි, රජය හැටියට මම එක දෙයක් කියන්න ඕනෑ. මේ අවස්ථාව වන කොට මධ්‍යම රජය අමාත්‍යවරුන් හතර දෙනෙක් යටතේ මේ සම්බන්ධව තේරීම් කාරක සභාවක් පත් කරලා තිබෙනවා. ඒ කාරක සභාව ගෝඨාභය රාජපක්ෂ ලේකම්තුමාත් එක්ක සාකච්ඡා කරලා, කොළඹ නගරයේ කුණුත්, කරදියානේ කුණුත්, එතකොට මීතොටමුල්ලේ කුණුත් මේ කුණු සියල්ල පුත්තලම දක්වා ප්‍රවාහනය කරන්න රජය මේ වන කොට විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් යනවා. ඒ හින්දා මේ කුණු දුම්රිය මගින් මීතොටමුල්ලේ ඉඳලා පුත්තලම දක්වා ගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ලෝක බැංකු ආධාර යටතේ මේ වන කොට සකස් වෙමින් පවතිනවාය කියන එක අපි දන්නා කාරණාවක්. ඒ නිසා රජය මේකට මැදිහත් වෙලා තිබෙනවා. පළාත් සභාවට කරන්න අමාරුයි කියලා අපි පිළිගන්නවා. පළාත් සභාවට අමාරු වුණා වාගේම ආරක්ෂක ලේකම්තුමා මේකට

මැදිහත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ වන කොට මධ්‍යම රජය මේ සියලු කුණු පුත්තලමේ රඳවනයට ගිහිල්ලා දාලා - අවුරුදු 20 ක් එතැන කුණු තැන්පත් කරන්න පුළුවන් කියන එක ශක්‍යතා වාර්තාවල සඳහන් වෙනවා. ඒ හින්දා දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත්, සුසිල් ප්‍රේමජයන්ත පරිසර ඇමතිතුමාත්, ගාමිණී ලොකුගේ ඇමතිතුමාත්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාත් මේ කටයුත්තේදී රජය වෙනුවෙන් ඒ තේරීම් කාරක සභාවේ කටයුතු කරන නිසා අපට විශ්වාසයක් තිබෙනවා ඉදිරි කාලයේදී මේ කසළ රඳවනය, ඒ ගැටළුව විසඳගන්න පුළුවන්කම ලැබෙයි කියලා. ඒ නිසා මම මීට වැඩිය වැඩි දෙයක් සඳහන් කරන්න යන්නේ නැහැ. පළාතේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ ගැටළුව නිරාකරණය කර ගන්න පළාත් සභාවත්, මධ්‍යම රජයත් ඉදිරි කාලයේ කටයුතු කරන්න ඕනෑය කියන පණිවිඩය ලබා දෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පෙ.ව.11.51]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගෙන එන මේ යෝජනාව, එතුමා ඡේද තුනකින් මේ යෝජනාව ඉදිරිපත් කරනවා. පළමුවැනි ඡේදයෙන් එතුමා කියන්නේ, පළාත් සභාව කුණු කසළ ප්‍රශ්නයට විසඳුම් දෙන්න සමත් වෙලා නැහැයි කියලා. අවුරුදු හතක් තිස්සේ, මම හිතන්නේ ඊටත් වඩා වැඩි කාලයක් තිස්සේ මේකට විසඳුම් දෙන්න සමත් වෙලා නැහැයි කියලා. එතුමා දෙවැනි ඡේදයෙන් කියන්නේ, මේකට උත්තරයක් ඕනෑ කියලා. තුන්වැනි ඡේදයෙන් කියන්නේ, ආරක්ෂක ලේකම්වරයාට වැඩේ භාර දෙන්න කියලා. එතුමා නාගරික සංවර්ධන අධිකාරිය කියලා හැඳින්නුවාට මම හිතන්නේ, එතුමාගේ ඔලුවේ තිබෙන්නේ මේක ආරක්ෂක ලේකම්වරයාට දෙන්න කියලා. අර කවුරුත් කියනවා වාගේ ගෝඨාට වැඩේ දෙන්න කියලා තමයි මේ කියන්නේ.

ගරු සභාපතිතුමනි, ආරක්ෂක ලේකම්තුමාට මේ වැඩේ භාර දෙන්න නම් ඇත්තටම නීතියක් රීතියක් නම්, මම නම් හිතන්නේ ඕනෑ නැහැ. නීතියක් රීතියක් සම්මත කර ගන්නත් ඕනෑ නැහැ. මොකද, එතුමාගේ වැඩවලට නීතියක් රීතියක් නැහැ. දැන් අපි දන්නවා. මේ කොළඹ දිස්ත්‍රික්කයේ වගුරු බිම් විශාල ප්‍රමාණයක් ගොඩ කරන්නේ නීතියකට රීතියකට අනුව නොවෙයි. මට මතකයි. එක මොහොතක රනිල් වික්‍රමසිංහ ගරු විපක්ෂ නායකතුමා කාලයක් කිව්වා, මේ කුඹුරු ගොඩ කරන්න ඕනෑය කියලා. එතුමාගේ මනසේ තිබුණු දෙයක් තමයි කිව්වේ. මේ කොළඹ දිස්ත්‍රික්කය හදන්න නම් කුඹුරු ගොඩ කරන්න වෙනවා කියලා එතුමා හරි අවංකවම ඒක කිව්වා. හැබැයි, දැන් වැඩේ නොකියා යන්නේ. දැන් කොළඹ දිස්ත්‍රික්කයේ විශාල ප්‍රමාණයක කුඹුරු ගොඩ කරලා තිබෙන්නේ. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ ලේකම්තුමාට - දැන් බාධා කරයි. බාධා කළේ නැත්නම් ප්‍රශ්නයක්, මේ ලේකම්තුමා සම්බන්ධයෙන් කථා කරන කොට.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

උවමනාව බාධා කර ගන්නද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. එහෙම කරයි කියලා ඊට ඉස්සෙල්ලා කියන්නේ, එපැයි කියලා. වගුරු ගොඩ කරන්නත් පුළුවන්. ගොඩ ඉඩම - මේ මගේ මංගල කථාව කරන්නේ. ඒ නිසා කරුණාකරලා නිශ්ශබ්දව ඉන්න. වගුරු ගොඩ කරන්නත් පුළුවන්. ගොඩ ඉඩම වැවක් කරන්නත් පුළුවන් ගරු සභාපතිතුමනි. නීතියක් රීතියක් ඇත්තටම ආරක්ෂක ලේකම්තුමාට ඕනෑ නැහැ. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද කිව්වේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සිද්ධ වන දේවල්වලින් මේ කියන්නේ. දැන් මේ මොහොත වන කොට බෙල්ලන්විල කුරුළු අභය භූමියේ ගස් කපලා, සම්පූර්ණයෙන්ම වැවක් හදලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හොඳයි නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හොඳයි. අර කුරුල්ලන්ට තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. කුරුළු අභය භූමියේ හිටපු කුරුල්ලන්ට අද

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ඉන්න තැනක් නැති කරලා තිබෙනවා. මේ අපි විශ්වාස කරන්නේ මේක තමයි මේ සන්ධාන ආණ්ඩුවේ සංවර්ධනය කියලා. මම හිතන්නේ විශ්වාස කරන්නේ ඒක වෙන්න ඇති. ඒ එතුමන්ලාට හිතෙන ආකාරයට. ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, මාදිවල පන්සලක් ආසන්නයේ ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. වගුරු බිම් කොටසක්. මේ ළඟදී මම ඒ ප්‍රදේශයේ මළ ගෙදරකට ගියාට පස්සේ තමයි මේක ඒ ප්‍රදේශයේ ජනතාව මට කිව්වේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ ඔබතුමාට මතක් කරන්නේ. දැන් මේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තිබෙන්නේ, කොම්පෝස්ට් පොහොර සම්බන්ධව තිබෙන ප්‍රශ්නයක්. ඔබතුමා වෙන වෙන මාතෘකා ගැන කථා කරන්නේ. කරුණාකරලා මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වෙන වෙන දේවල් කථා කරන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ගරු සභාපතිතුමනි, මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කොම්පෝස්ට් පොහොරවලට අදාළව කථා කරන්න කරුණාකරලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේක විසඳුනේ නැති ඉතිහාසයක් තිබෙන කථාවක් ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් හරි. ඉතිහාසය කථා කරන්න වෙලාවක් නැහැ නේ දැන් ඉතින්. විනාඩියකින් දෙකකින් ඔක්කොම කථා කරන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඕනෑම ප්‍රශ්නයක්. (බාධා කිරීම්) මම ඔබතුමාට කියන්නේ - (බාධා කිරීම්) අනේ කරුණාකරලා මට ඉඩ දෙන්නකෝ. ඉතාමත්ම ඕනෑකමින් කියනවා මම මෙතැන ඉන්නකොටම මම කාටවත් කොයිම මොහොතකවත් අනවශ්‍ය විධියට බාධා නොකරන මන්ත්‍රීවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. එතුමා බාධා කරන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා මම ඇත්තටම ඉල්ලනවා, මට මේකට බාධා කරන්න එපා. මට කරුණු ටික ඉදිරිපත් කරන්න දෙන්න. ඊට පස්සේ මම කියන ඒවා වැරදියි නම්, ඒ වැරදි මෙන්න මේවායි කියලා ඔබතුමන්ලා කියන්න. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක ගැටළුවක් දැන්. ගරු සභාපතිතුමනි, කිසියම් හෝ ගැටළුවක් විසඳන්න ඒ ඓතිහාසිකව අපි ඒක විග්‍රහ කර ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මම පිළිගන්නවා. ඉතිහාසය මම පිළිගන්නවා. නමුත් කාලය නැහැ. විනාඩි හතයි තිබෙන්නේ ඔබතුමාට.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. ඉතින් මම ඒක කර ගන්නම්. ඔබතුමා කළබල වෙන්න එපා. මම ඒක විනාඩි හතෙන් කර ගන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා අපට ඓතිහාසිකව බලන්න වෙනවා. එතකොට මේ විෂයයට මොකද වෙලා තිබෙන්නේ? එතකොට අනෙකුත් කාරණා මේකත් එක්ක සම්බන්ධ වෙන්නේ

කොහොමද? එහෙම නැතිව ගරු සභාපතිතුමනි, ගැටළුවක් අර්ථ කථනය කර ගන්න බැහැ. ඒ නිසා මම මේ විෂයට අදාළව තමයි කථා කරන්නේ. ඒ නිසා මේ පරිසර විෂය. එතුමා කියන්නෙත් ඒක. එතුමා මේ කොම්පෝස්ට් සම්බන්ධ ව්‍යාපෘතිය ගැන කිව්වාට, ඒ ප්‍රදේශයටම දැන් පරිසරය සම්බන්ධයෙන් විශාල හානියක් මෙයින්, වෙලා තිබෙනවා. එතකොට හරි පහසු වෙලා තිබෙනවා මේ යෝජනාව හරහා ඒ ටිකත් කථා කරන්න. ඒ නිසා මට ඔබතුමා ඒ ටිකත් කථා කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මම දෙන්නම්. තව විනාඩි දෙකක් තිබෙනවා ඔබතුමාට. විනාඩි දෙකයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම කියාගෙන ආවේ මාදිවල ඒ වගුරු බිම ගොඩ කරලා පන්සලට කා පාර්ක් එකක් හදනවා. එතකොට ඒකට කොහේවත් නීතියක් අදාළ නැහැ ගරු සභාපතිතුමනි. කවුරුවත් කථා කරන්නෙත් නැහැ. ඇයි මේක ගෝඨාගේ වැඩක්. ඒ නිසා ඒ ගෝඨාට සමහර ඇමතිවරු කථා කරන්නෙත් සර් කියලා. ඒ නිසා මිනිස්සු බයයි. ඉතින් ඒක නිසා - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පුළුවන්තරම් ඔබතුමා මේ විෂයට අදාළව - විනාඩි දෙකයි තව ඔබතුමාට තිබෙන්නේ. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා මේක ඇත්තටම විසඳිය යුතු ප්‍රශ්නයක්. එතුමා කියන ආකාරයෙන් ඇත්තටම විසඳිය යුතු ප්‍රශ්නයක්. ඒ නිසා මේ කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙනවා කඳු තුනක්. එකක් තමයි බ්ලූමැන්ඩල් කන්ද. ඒ වාගේම මීතොටමුල්ල කන්ද. එකක් තමයි කරදියාන. ඒක කන්දක් නොවෙයි. ඒක සානුවක් වෙලා. ගරු සභාපතිතුමනි, මෙතැනට දාන කුණු - සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා කිව්වා ඒකට පස් දාලා වහන්නේ නැහැයි කියලා. පස් දාලා වහන්න දෙයක් නැහැ. ඒක වැස්සට හේදි හේදී බොල්ගොඩ ගඟ විනාශ කරලා තිබෙන්නේ. මේකේ තිබෙන පරිසර විනාශය ඔන්න ඕකයි. ගරු සභාපතිතුමනි. කිලෝ මීටර් 10 කට 12 කට ප්‍රමාණයට දැන් මේකේ සම්පූර්ණ ගඳ පැතිරෙනවා. ගෙවල්වල ඉන්න බැහැ. කෑමක් කන්න බැහැ. ගඳ ගහනවා. ඒ නිසා මේකට විසඳුමක් ඕනෑ. ඇත්ත. අපි පිළිගන්නවා. මේ පළාත් සභාවට මේකට විසඳුම් දෙන්න බැහැ. (බාධා කිරීම්) මේක ජාතික ප්‍රශ්නයක්. අන්න ඒ ජාතික ප්‍රශ්නයට විසඳුමක් තමයි ලැබෙන්න ඕනෑ. මේක අර ඇවිදින මංතීරු හදනවා වාගේ ලෙහෙසි නැහැ. අපි දන්නවා. ඒවා ලෙහෙසියි. ඒවා කරන්න අමාරු වැඩ නොවෙයි. අර පිටරකට ගිහිල්ලා - (බාධා කිරීමක්) ඕවා කරන්න මහ ලොකු වැඩක් නොවෙයි. බලය සම්පූර්ණයෙන්ම අතට අරන් පාවිච්චි කරනවා නම් ඒවා කරන්න බැරි දේවල් නොවෙයි. මම කියන්නේ නීතියක් තිබෙන්න ඕනෑ. රීතියක් තිබෙන්න ඕනෑ. අන්න ඒ නීතියට රීතියට අනුව කටයුතු කරන්න ඕනෑ. අද නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා උදේ ප්‍රකාශ කළෙත් ඒකයි. ඒ නිසා මේ සමහර තැන්වල සමහර නගරවල මේ හදපු කඩ ඉවත් කරන්න කිසිම නීතියක් රීතියක් බලන්නේ නැහැ. බලහත්කාරය තමයි ඒ සඳහා යොදවන්නේ. ඒ නිසා බලහත්කාරය නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදී රටක නීතියක් රීතියක් තිබෙනවා. අන්න ඒ නීතියකට අනුව, රීතියකට අනුව මේ ප්‍රශ්නය විසඳීම සඳහා ජාතික ප්‍රතිපත්තියකට අනුව කටයුතු කරන්න ඕනෑය කියන යෝජනාව ගේන්න. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා එතුමාට. එතුමා බොහොම -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බොහොම ස්තුතියි ඔබතුමාට.

[ පූ.භා.11.59]

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, මම කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මම නවක මන්ත්‍රීවරයෙක් හැටියට මට මංගල කථාව කුණු කසළවලින්ම පටන් ගන්න සිද්ධ වුණා. ගරු සභාපතිතුමනි, මේ කුණු කසළ ගැන කථා කරන කොට අපි කළුතර

[ගරු පී.ආර්.පී. අබේගුණවර්ධන]

ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට අපටත් විශාල ප්‍රශ්නයකට, විශාල අර්බුදයකට මුහුණපාන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ සිද්ධ වෙලා තිබෙන කාල පරිච්ඡේදයේදී පළාත් සභාවත්, මධ්‍යම පරිසර අධිකාරියත් මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියත් ඒ සියල්ල එකතු වෙලා කළුතර නගර සභාවට අයිති භූමියක විශාල කන්දක්, ඔය කියනවා වාගේ කන්දක් ගොඩ ගැහිලා තිබුණු ස්ථානයක් එතුමන්ලාගේ යටතට අරගෙන, ඒ කුණු කන්දත් ප්‍රයෝජනයට ගන්න පුළුවන් විධියට එතැන විශාල මහා පරිමාණයේ ව්‍යාපාරයක් බවට පරිවර්තනය කර ගන්න කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් පටන් ගත්තා. ඒක පටන් අරගෙන යම්කිසි කාලයක් යන තුරු අපිත් ඒක දිහා බැලුවේ වපර ඇහෙන්. මේකෙන් ප්‍රතිලාභයක් ලැබෙයිදෝ කියලා. නමුත් අද වන කොට ගරු සභාපතිතුමනි, ඒ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් පවත්වාගෙන යන ඒ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියෙන් මාසයකට ටොන් 100 ක් පමණ කොම්පෝස්ට් පොහොර අද රටට අලෙවි කරනවා. විශාල ලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය වෙලා. ඒ ලාභයට වැඩිය අපට වටින්නේ, කළුතර නගර සභාවත්, කළුතර ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයේත් මේ කුණු කසළවලින් අපට පසුගිය කාලයේ සිද්ධ වෙලා තිබුණු ප්‍රශ්නය විසඳීමට උත්සාහ ගැනීමයි.

අපි ඒ ආයතනයට සහයෝගයක් වශයෙන් කළුතර නගර සභාවත්, කළුතර ප්‍රාදේශීය සභාවත් එකට එකතු වෙලා ඒ ගම්වල ජීවත් වන ජනතාව දැනුවත් කිරීමක් කරලා මාස තුනක විතර කාලයක් මේ පොහොර වන කුණු වෙනම වෙන් කරලා ගන්නත්, පොහොර නොවන කුණු වෙනම වෙන් කරලා ගන්නත් අපි විශාල වැඩ සටහනක් දියත් කරමින් ගියා. ඒක ඉතාම සාර්ථකයි. අද සතියේ දවස් හයක් කොම්පෝස්ට් පොහොර බවට පරිවර්තනය කරන කුණු එකතු කරනවා, කළුතර නගර සභාවත්, කළුතර ප්‍රාදේශීය සභාවත්. අර පොහොර නොවන කුණු සතියකට දවසක් එකතු කරනවා. ඒකෙනුත් අපට දැන් වන කොට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ස්ථාපිත කරන තැනක් සොයා ගැනීමට. අපි මේ වන කොට දේශපාලන අධිකාරිය හැටියට ඒ ආයතනත් එක්ක සම්බන්ධ වෙලා ඒකට අවශ්‍ය වැඩ කටයුතු කර ගෙන යනවා. මේ අවුරුද්දේ අවසාන වන කොට අපි ඒකටත් පිළියමක් යොදන්න ලැහැස්ති වෙනවා. අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙන්නේ කළුතර ආසනයේ විතරක් දැනට ඒ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය කරමින් යන අවස්ථාවක අපි බලාපොරොත්තු වෙනවා බේරුවල ආසනයේයි, පානදුර ආසනයේයි කුණු එතැනට ලබා ගෙන කොම්පෝස්ට් පොහොර බවට පරිවර්තනය කරන්න. ඉදිරියේදී ඒ ව්‍යාපෘතිය වැඩි දියුණු කර ගන්න. අපට මතකයි. අතීතයේ ඒ ප්‍රදේශයේත් අක්කර පහක විතර භූමි භාගයක් තිබෙනවා. අනික් හරිය සාමාන්‍ය තෙත් සහිත පොළොවක් තිබෙන්නේ. ඒ වට පිටාවේ ජීවත් වන ජනතාවට ඉතා දැඩි තර්ජනයක් තිබුණා. ඒ පොහොර ව්‍යාපෘතිය ඉදිරිපිට තිබුණු විහාරස්ථානය පවා වසා දමලා හාමුදුරුවෝ ගිහිල්ලා තිබුණා. අද අපට ඒ තර්ජනය නැතිව ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව ඒ පොහොර වත්තත් එක්කම තිබෙන ගෙවල්වල අයටත් දුගඳක් නැතිව නිදහසේ ජීවත් වීමේ හැකියාව අද ලැබිලා තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන් කියන්න කැමැතියි. මොකද, මෙතැන වැඩි හරියක්ම කුණු ප්‍රශ්නය ගැන කථා කළා. කළුතර ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට ඉතා ආඩම්බරයෙන් කියන්න කැමැතියි. ඒ ප්‍රශ්නයට විසඳුමක් පළාත් සභාවත්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියත් සම්බන්ධ වෙලා ඒ කර ගෙන යන ව්‍යාපෘතිය වැඩි දියුණු කර ගන්න දේශපාලන අධිකාරියට හැටියට අපි ඉතා සහයෝගයෙන් වැඩ කටයුතු කරනවාය කියලා පවසමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.03]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම මේ සභාවේදීම මීට කලින් වතාවකදීත් මේ කාරණය සම්බන්ධයෙන්ම කථා කළා. මගේ ප්‍රදේශය, මා ජීවත් වන ප්‍රදේශය, එහෙම නැත්නම් මා නියෝජනය කරන ප්‍රදේශයේ අපි කියන්නේ, මේ කන්දක් තිබෙනවා. පිදුරුතලාගලට විතරක් දෙවැනි කියලා. ඒ තමයි කොළොන්නාවේ කුණු කන්ද. මේ ගැන කථා කරලා, කථා කරලා, අද ඉතාම අප්‍රසන්න තැනකට ඇවිල්ලා තිබෙන්නේ. මොකද, කොළොන්නාවේ කුණු කන්දට අද වගකියන්න කෙනෙක් නැහැ. කොළොන්නාව නගරාධිපතිවරයාගෙන් ඇහුවාම ඔහු කියන්නේ, මේකට වගකියන්න ඕනෑ මධ්‍යම ආණ්ඩුවයි, කොළඹ නගර සභාවයි කියලා. කොළඹ නගරාධිපතිවරයාගෙන් කථා කරලා ඇහුවාම එතුමා කියනවා, මේකට මට කරන්න දෙයක් නැහැ. මට කාගෙන්වත් සහයෝගයක් නැහැයි කියලා. එහෙම නම් අපට පෙනෙන දෙයක් තමයි කොළඹ නගරාධිපතිවරයාටත්, කොළොන්නාව නගරාධිපතිවරයාටත්

තිබෙන්නේ එකම ප්‍රශ්නයක්. කවුද මේකට වග කියන්නේ? මේකේ තත්ත්වය ඉතාම අසතුටුදායකයි.

ගරු සභාපතිතුමනි, කොළඹ නගරයේ කුණු ටොන් දහස් ගණනක් දිනකට කොලොන්නාවට අරන් එනවා. පසුගිය ඡන්ද කාලයේ ආරක්ෂක ලේකම්වරයාගේ මැදිහත්වීමෙන් සාකච්ඡාවක් තිබුණා. ඒ සාකච්ඡාවේදී පොරොන්දු ගණනාවක් දුන්නා. හැබැයි, ඒ සාකච්ඡාවෙන් පස්සේ තිබුණු ප්‍රවෘත්ති සාකච්ඡාවකට ගරු සභාපතිතුමනි, මමත් සහභාගී වුණා. ඒ වෙලාවේ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයාත් හිටියා. මම ඒ වෙලාවේ මේ සාකච්ඡාවලට ගිය අයට කිව්වා, මේක ඡන්ද පොරොන්දුවක්. කරුණාකරලා දෙවරක් හිතා බලන්න. ආරක්ෂක ලේකම්වරයා ඉදිරියේ දුන් පොරොන්දු යථාර්ථයක් වෙයිද නොවෙයිද කියන එක ගැන. ඒ නිසා මේකෙන් උද්දාමයට පත් වෙන්න එපා. මේ ආණ්ඩුව දීපු තීරණවලින්. මේවා ක්‍රියාත්මක වන එකක් නැහැයි කියලා. හරියටම ඒ විශ්වාස කළ පරිදිම ගරු සභාපතිතුමනි, අද වන කොට එය සම්පූර්ණ මුසාවක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, ඔවුන් කිව්වා, ඉදිරි මාස දෙක තුන ඇතුළත මේ කුණු කන්දට ගේන කුණු ටික ක්‍රම ක්‍රමයෙන් නතර කරනවාය කියලා. නමුත් ගරු සභාපතිතුමනි, ගෙනෙන කුණු ප්‍රමාණය වැඩි වෙලා මිසක් අඩු වෙලා නැහැ. වෙනත් ව්‍යාපෘති ගැන කථා කළා. මේ මන්ත්‍රීවරයාගේ මැදිහත්වීමෙන් අපි මීට විරුද්ධව කථා කරන නිසා නියෝජිතයෙක් එව්වා. ඉස්සෙල්ලා මුට්ටිය දාලා බැලුවා. මේ අපව එකඟ කර ගන්න, ඒගොල්ලෝ වෙනත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න කියලා. මොකක්ද මේ ව්‍යාපෘතිය? විදුලිබල ජනන ව්‍යාපෘතියක්. මම ඊට පස්සේ ඒ යෝජනාව ගෙනාපු, මට කථා කරපු පුද්ගලයාගෙන් ඇහුවා, මේකේ තොරතුරු මට කියන්න. කොහොමද මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ කියලා. එතකොට කිව්වා, මේක මෙන්න මෙහෙම ව්‍යාපෘතියක්. ඊට පස්සේ මේක විද්‍යාත්මකව පැහැදිලි කෙරුවා. මම අහුවා, මේ ගැන ඔබට තිබෙන විද්‍යාත්මක පැහැදිලි කිරීම මොකක්ද? මේ ගැන Feasibility study එකක් කරලා තිබෙනවාද කියලා. එතකොට ඔහු මොනවාද කාරණා වගයක් කිව්වා. ඊට පස්සේ ඉදන් කිව්වා, මේක මෙහෙම සාකච්ඡා කරන්න බැහැ. අපි මීට වැඩිය විධිමත් සාකච්ඡාවකට යමු කියලා. මේ වාගේ පට්ට පල් බොරු දේශනා කරමින් මේ කොලොන්නාවේ කුණු කන්දේ ප්‍රශ්නය එන්න එන්න අවුලෙන් අවුලට පත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ කුණු ගේන එක නවත්වනවා වෙනුවට තවදුරටත් කුණු මෙතැනට ගෙන එමින් මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව ඉවත් කිරීමේ සැලසුමක ආණ්ඩුව ක්‍රියාත්මක වෙනවා. පසුගිය මාසයකට විතර කලින් ගරු සභාපතිතුමනි, මේ ප්‍රදේශයේ ගෙවල් 20 ක් විතර අනික් පැත්ත පෙරලුණා. මේක අවුරුදු 20 ක් පරණ ප්‍රශ්නයක්. මේ ආණ්ඩුව තරම්ම කොලොන්නාවේ කුණු ප්‍රශ්නය පරණයි. මීට වසර දෙකකට විතර කලින් කලින් මතු කරපු වෙලාවකදී ඒගොල්ලෝ කිව්වා, මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට ලක්ෂ 13 ගණනේ දෙනවා. මේ ප්‍රදේශයෙන් ඉවත් වෙන්නය කියලා. එහෙම දෙනවා කියලා මේ වන කොට ඒ තීරණය වෙනස් කරලා කොලොන්නාව ප්‍රදේශයේ අද පුංචි කුකුල් කූඩු වාගේ ගෙවල් ටිකට මේ මිනිස්සුන්ව ගාල් කරලා, අර ඉඩම් ටික ලබා ගැනීමේ සැලසුමක් තිබෙනවා. මේකට ජනතාව විරෝධය දක්වද්දීත්, ආණ්ඩුව මේක නොසලකා හැරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේක අද බරපතළ සෞඛ්‍ය අර්බුදයක් ඇති කරන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම කියනවා නම්, මේ කුණු කන්ද තිබෙන මීතොටමුල්ලේ පමණක් නොවෙයි, මේක මුළු කොලොන්නාවටම, වැල්ලම්පිටියට, කොටිකාවත්තට, අනෙක් පැත්තෙන් දෙමටගොඩට. මේ මුළු කොලොන්නාව බල ප්‍රදේශයටම බලපාන ප්‍රශ්නයක් බවට මේක පත් වෙලා තිබෙනවා. මේ ප්‍රදේශයේ දරුවන් රෝගී වන විධිය බැලුවාම, මේ ප්‍රදේශයේ ශ්වසන රෝගය ඉහළ ගිහිල්ලා තිබෙන විධිය බැලුවාම පැහැදිලිව හඳුනාගන්න පුළුවන්, මේ කුණු කන්ද නිසා ඇති වුණු, පාරිසරික විපර්යාසය නිසා ඇති වුණු මෙවැනි සෞඛ්‍ය ප්‍රශ්න විශාල වශයෙන් කොලොන්නාව ප්‍රදේශයේ ඉහළ ගිහිල්ලා තිබෙන බව. ඒ නිසා මේ ප්‍රශ්නයට වහාම විසඳුමක් සොයා ගත යුතුයි කියලා මීට කලිනුත් මම යෝජනා කළා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය ගෝඨාභය රාජපක්ෂ මහත්තයා සම්පූර්ණයෙන්ම දැන් විසඳලා ඉවරයි. ඔබතුමා මේ කථා කළාට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. මම හිතන්නේ ඔබතුමා මේ ප්‍රශ්නය ගැන හොඳින් දන්නවා. දැන් මේ හදන්නේ, මේ ප්‍රශ්නය මීට කලින් මම කිව්ව විධියට මේක මේ ඡන්දේ කාලේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ළඟට ගෙන ගියේම, මේ වැඩේ ආරක්ෂක අමාත්‍යාංශයට භාර දෙන්න. ඒ නිසා හිතනවා නම් ආරක්ෂක ලේකම්වරයාට මේ රටේ මෙහෙම ජනතාවට බලපාන ප්‍රශ්න හැම එකක්ම භාර දෙන්න. එහෙම නම් මේ හමුදා ආණ්ඩුවකට යන්නේ. අද රටේ මේ සියල්ල හමුදාකරණය වෙලා ඉවරයි. ඒ නිසා මේකට තව ටික දවසකින් -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඔබතුමාගේ නායකයාත් එහෙම නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතින් ඔබතුමාගේත් නායකයා නේ මගේ නායකයා. (බාධා කිරීම්)

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

මගේ නායකයා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාගේ නායකයා හමුදාපතිතුමා. ඇයි ඔබතුමා ඔහොම කථා කරන්නේ. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. අනවශ්‍ය ගැටුම්වලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

හමුදාව කෑවා ඔබතුමන්ලාගේ නායකයා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආ. හමුදාව කෑවේ කවුද කියලා දන්නවා. හමුදාව තමයි දැන් අර පිඩලි ගලවන්නෙත්. ගිහිල්ලා බලන්නකෝ පාර්ලිමේන්තුවේ පස් කපන්නේ, කාණු කපන්නේ. රණවිරුවන්ට මොකද කළේ ඔබතුමන්ලා. ඔබතුමා මේ සභාවේ රණවිරුවෝ ගැන කථා කළාද? අද රණවිරුවන්ට මේ රටේ මොකක්ද වෙලා තිබෙන්නේ. ඒවා විස්තරාත්මකව කියන්නද? ඒ නිසා කරුණාකරලා මේ කරන්න හදන්නේ මේ රටේ සිවිල් ජනතාවට බලපාන ප්‍රශ්න සියල්ල හමුදාවට භාර දෙන්න. මේක කරන්න දෙන්න එපා. හොඳ තැනකට මෙතුමා ගෙනාවේ මේක. ඒ නිසා මේ ගෝඨාභයට භාර දීලා, තර්ජනය කරලා, මර්ධනය කරලා මේ කුණු ටික ජනතාව විනාශ කරන ව්‍යසනයක් බවට පත් කරන්න එපාය කියලා මේ පළාත් සභාවෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම කියන්නේ, තාවකාලික පැලැස්තරවලින් මේ ප්‍රශ්නය විසඳන්න හදන්න එපා. ගරු සභාපතිතුමනි, කරුණාකරලා මේක මේ ජනතාවට බලපාන ප්‍රශ්නයක්. අනික් මන්ත්‍රීවරුත් ප්‍රකාශ කළා වාගේ මේ කුණු ප්‍රශ්නය - ඔය ප්‍රතිචක්‍රීයකරණ කතන්දර කියනවා. පුත්තලමට කෝච්චි ඇලා ගෙනියනවා කිව්වා. අනේ අපි නම් දැක්කේ නැහැ කෝච්චි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. කෝච්චියෙන් ගෙනියන්නේ කුණු ටික ඔක්කොම.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කෝච්චියේ ඇලා කුණු ගෙනියන්න හදන්නේ. තව ටික දවසකින් කෝච්චියත් භාර දෙනවා ආරක්ෂක අමාත්‍යාංශයට. ඒ නිසා මේ ප්‍රශ්නයේ බරපතළකම තේරුම් ගන්න. මේකෙන් පේන්නේ මේ ආණ්ඩුවට ප්‍රතිපත්තියක් නැහැයි කියලා. අනික් ප්‍රශ්න වාගේම. සෞඛ්‍ය ප්‍රතිපත්තියක් නැහැ. අධ්‍යාපන ප්‍රතිපත්තියක් නැහැ. ඒ වාගේම හරි සරලයි. ජනතාවට බලපාන ප්‍රශ්නයක් මේක. කුණු බැහැර කිරීම සඳහාත් මේ ආණ්ඩුවට ප්‍රතිපත්තියක් නැහැයි කියන එක මේකෙන් පෙනෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කරුණාකරලා ඉල්ලා සිටිනවා. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුත්ත සඳහා නිසි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න කියලා. ස්තුතියි.

[අ.භා.12.10]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම ඇත්තටම නිරෝෂන් පාදුක්ක අපේ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙවැනි

යෝජනාවක් මේ පළාත් සභාවට ගෙන ඒම සම්බන්ධව. මට මතකයි. (බාධා කිරීමක්)

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ස්තූතිවන්ත වෙන්න ඕනෑ අපට.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔව්. තව පොඩ්ඩෙන් මේ යෝජනාව එතුමාට ගන්න බැරි වෙනවා, එතුමාගේම විපක්ෂ නායකතුමා හින්දා. නමුත් විපක්ෂ නායකතුමාට අපි කනගාටුව පළ කරනවා. එතුමාගේ යෝජනාවට තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් 35 දෙනෙකුවත් ගෙන්වා ගැනීමට බැරි වුණු එක ගැන. ඒකත් එක්කම ඇත්තටම මෙම යෝජනාව පිළිබඳව මට තේරුණු දේ - සමහර මන්ත්‍රීවරු මේ යෝජනාව කෙරෙහි අවබෝධයකින් නොවෙයි කථා කළේ. අපේ සුසිල් කිදෙල්පිටිය ගරු මන්ත්රීතුමා කථා කළා. ඒ මන්ත්‍රීතුමා කිව්වා මේකට ප්‍රතිපත්තියක් නැහැයි කියලා. මේ වැඩ පිළිවෙළ ගෙන යන්න පළාත් සභාවට, මහ ආණ්ඩුවට ප්‍රතිපත්තියක් නැහැයි කිව්වා. මම කියන්නේ මේ අනං මනං කථා කරන්න නොවෙයි තිබුණේ. එතුමන්ලාට තමන්ගේ ප්‍රතිපත්තිය මොකක්ද? මේ කසළ කළමනාකරණය කරන්න මොකක්ද කරන්න ඕනෑ කියන එකයි කියන්න තිබුණේ. මේ වැඩ පිළිවෙළ, තමුන්ගේ වැඩ පිළිවෙළ -

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපෙන් විමසන්න. අපි දෙන්නම්, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තියක් නැත්නම්. අපි ලැහැස්තියි ඒකට.

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ප්‍රතිපත්ති හදන්න තමයි ආණ්ඩුව පත් කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා යෝජනා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේගොල්ලේ මේ මාධ්‍ය - මේගොල්ලෝ මේ රට හදන්න ආපු අය නොවෙයි.

**ගරු මංජුල බුද්ධදාස**
Hon. Manjula Buddhadasa

විවේචනය කරන්න විතරයි දන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා එතුමාට බාධා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මේගොල්ලෝ මේ මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්න ආපු අය නොවෙයි. මේගොල්ලෝ මාධ්‍යයට කථා කරන්න ආපු අය.

**ගරු මංජුල බුද්ධදාස**
Hon. Manjula Buddhadasa

විවේචනය කරන්න ආපු අය.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේගොල්ලෝ මාධ්‍යයට කථා කරන්න ආපු අය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැඩ පිළිවෙළ කියන්න.

**ගරු මංජුල බුද්ධදාස**
Hon. Manjula Buddhadasa

වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, විපක්ෂයේ ඉදිව් යෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන්න පළාත් සභාවට. මොකක්ද කසළ කළමනාකරණයට කරන්න ඕනෑ කියලා. එතකොට තමයි මේක කරන්න පුළුවන්. මේ යෝජනාව මොකක්ද කියලා තේරුම් ගන්න. හැමදාම කරන්නේ ඕක තමයි. ප්‍රතිපත්තියක් නැහැ.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

අපරාදේ ආණ්ඩුවක් තිබෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඊට පස්සේ මම යෝජනා කරන්නම්. (බාධා කිරීම්) තමුන්නාන්සේලා මගේ ඉතිහාසය අරන් බලන්න. මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙලා ඉන්න කොට - මම මේ නිකම් මෙතැන කථා කරනවා නොවෙයි. මම ගියවර පළාත් සභාවේදී යෝජනා කළා. එහෙම යෝජනා කරලා, අපි හොඳ අදහස් ඉදිරිපත් කළා. මම ඒක තමයි ආවේ. මම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට කසළ කළමනාකරණය කරලා ජනාධිපති සම්මාන ප්‍රාදේශීය සභාවට අරන් දීපු සභාපතිවරයෙක් හැටියට, මන්ත්‍රීවරයෙක් හැටියට මම මේ කථා කරන්නේ. එතකොට අපේ උදය ගම්මන්පිල ඇමතිතුමා අපේ පරිසර අධිකාරියේ සභාපතිවරයා හැටියට හිටියේ. මට මතකයි. මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. එතුමා ලොකු සහයෝගයක් දුන්නා. ඒ වාගේම මේ බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ලොකු සහයෝගයක් දුන්නා. ගරු සභාපතිතුමනි, මෙතැන පුංචි වරදක් තිබෙනවා. මම දැකපු බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියටත් පොඩි වැරදුණු තැනක් තිබෙනවා. අද ගොඩක් ප්‍රාදේශීය සභාවල සභාපතිවරු, නගරාධිපතිවරු කියන දේ තමයි මේ පිළිබඳව අපට වගකීම නැහැ. මේක එක්කෝ මහ ආණ්ඩුව කරන්නේ නැහැ. නැත්නම් මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය කරන්නේ නැහැයි කියලා. මහ ආණ්ඩුවේ පරිසර අධිකාරියත් ඉන්නේ, මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියක් තිබෙන්නේ ඒ අයට උපදේශන දෙන්න. ඒ අවශ්‍ය පහසුකම් ටික සලසන්න. නැතිව මේ කසළ කළමනාකරණය කරන්න නොවෙයි.

මේ ඕනෑම සභාපතිවරයෙක් ප්‍රාදේශීය සභාවේ වේවා, නගර සභාවේ වේවා පුටුවේ වාඩි වෙන කොට තමන් ඒ පනත ක්‍රියාත්මක කරනවා කියලා වාඩි වෙන්නේ. ඒ පනතේ පැහැදිලිව තිබෙනවා. පළමුවෙන්ම තිබෙන්නේ මේ කසළ කළමනාකරණය. මම පැහැදිලිව කියනවා. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හැටියට අපි කරන්න ඕනෑ දේ තමයි ගරු සභාපතිතුමනි, - අපි මේක භාර ගන්න නොවෙයි. අපි ඒ අදාළ පළාත් පාලන ආයතන ලවා ඒක කරන්න ඕනෑ. එහෙම කවුරුහරි සභාපතිවරයෙක්, නගරාධිපතිවරයෙක් ඉන්නවා නම් මේක කරන්න බැරි, එහෙම නම් ඉල්ලා අස් වෙලා ගෙදර යන්න ඕනෑ. මොකද, මේක කරන්න ඕනෑ වැඩක්. ඒ නිසා අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, කොළඹ නගරය දැක්කාම අද කවුරුත් සතුටු වෙනවා. මේ බත්තරමුල්ල ප්‍රදේශය දැක්කාම කවුරුත් සතුටු වෙනවා. එතුමා මේ කුඹුරු ගොඩ කිරීම ආදී කිසි දෙයක් නොවෙයි. රටේ සංවර්ධනය එතුමා නීත්‍යානුකූලව කරන්නේ. එතුමා වැව් කපන්නේ ලස්සනට විතරක් නොවෙයි. ඒ නගරයේ වතුර ටික රැඳෙන්න තැනක් හදන්න. අර ඒ කාලේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ කුඹුරු ටික ගොඩ කළා. නගරවල් යට වුණා.

ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ පරිසරය විනාශ කරන එක ගැන කථා කළා. මොකද, එතුමන්ලාට කිසිම අයිතියක් නැහැ පරිසරය විනාශ කරන ඒවා ගැන කථා කරන්න. 89, 90 කාලයේ මේ සිද්ධ වුණු දේවල් දිහා බැලුවාම. එතුමන්ලාට ඒ කාලේ අමතක වෙලා. කැලෑවල් පිටින් ගිනි තිබ්බේ. මහා ගස් කොලන් පාරට කපලා හෙලුවේ. ඒ විධියට තමයි ජනතා විමුක්ති පෙරමුණ ඒ කාලේ කළේ. ඉතින් ඇත්තටම පැහැදිලිවම මම කියන්නේ මෙපමණයි. එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට අපට පුළුවන් වුණා - මේ හැම දෙයක්ම එකපාරට කරන්න බැහැ. බස්නාහිර පළාත් සභාව පළාත් පාලන ආයතනත් එක්ක එකතු වෙලා - බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. මේ 48 න් දැන් අද 21 ක මේ කසළ කළමනාකරණය ක්‍රියාත්මක වෙනවා. ක්‍රියාත්මක වෙලා පළාත් පාලන ආයතනවලට මේවායේ ආදායම් මාර්ග හදලා දීලා තිබෙනවා. කසළ සම්පතක් කරලා දීලා තිබෙනවා. ඉතින් තව පොඩි ප්‍රමාණයයි තිබෙන්නේ. ඒ ප්‍රමාණයෙන් කටයුතු කරනවා. මම ඇත්තටම මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් ඉල්ලන්නේ මෙපමණයි. මේක තමන් භාර ගන්නේ නැතිව, පළාත් පාලන ආයතන හරහා මේක ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් යොදන්න කියලා. එහෙම කළොත් එහෙම මේක සාර්ථක වෙනවා. නැත්නම් මේ පළාත් පාලන ආයතනවල තිබෙන කුණු ටික ඔක්කොම එක තැනකට ගෙනාවොත් එහෙම මේක සාර්ථකව කර ගන්න බැරි වෙනවා.

අපි සතුටු වෙනවා. මේ කර ගෙන ගිය වැඩ පිළිවෙළ සඳහා අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා 2014 වර්ෂය සඳහා 2015 වර්ෂය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් මේ සඳහා වෙන් කරලා තිබෙනවා. අපට මතකයි. මේ පළාත් පාලන ආයතන හරහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා, අද

මේ වන කොට විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒවා ක්‍රියාත්මක වෙන ඒවා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මම පැහැදිලිවම කියන්නේ මේ කටයුත්ත වෙනුවෙන් අපට කරන්න බැරි දෙයක් නැහැ. දැන් 48 න් 21 ක කරලා තිබෙන්නේ. ඉතිරි ටිකත් අපට කරන්න පුළුවන්. මේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට මේ රටේ අවුරුදු 30 ක් තිබුණු, මේ කිසිම ආණ්ඩුවකට විසඳාගන්න බැරි වුණු යුද්ධය අවසන් කළා නම්, මේ කුණු ප්‍රශ්නය විසඳන එක ගැටළුවක් නොවෙයි. මේක අපට විසඳන්න පුළුවන්. මේකත් අපි විසඳනවා. මම පැහැදිලිවම කියන්නේ, මේ හැම කෙනෙක්ම හොඳ දේ හොඳ හැටියට දකින්න ඕනෑ. තමුන්නාන්සේලාගේ මොන මොන අරමුණු තිබුණත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කියන්නේ, මේ මුළු රටම පිළිගත්ත කෙනෙක්. අද ඒ යුද්ධය නැති කරන්න ඒ සහයෝගය දුන්නා වාගේම, මෙතුමා මේ පරිසරය රකින්නත් ලොකු විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අද ඕනෑම කෙනෙකුට ආවොත් එහෙම දැනට අවුරුදු හත අටකට උඩදී ලංකාවෙන් ගිය කෙනෙකු අද නැවත කොළඹට ආවා නම් එහෙම, අද අඳුරගන්න බැරි තත්ත්වයක් තිබෙනවා, මේ කොළඹ ද කියලා. අද ඒ තත්ත්වය උදා වෙලා තිබෙනවා. අද කොළඹ නගර සභාවට ස්තුති කරන්නේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නිසා. අද එතුමාට ඕනෑම දෙයක් භාර දුන්නොත් එතුමාට කරන්න හැකියාව තිබෙනවා. එතුමාට වුවමනාව තිබෙනවා.

ඉතින් ඒ නිසා මම අවසාන වශයෙන් කියන්නේ ගරු සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අද ඊයේ නොවෙයි මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑකම තිබුණේ. මම අවසාන වශයෙන් කියන්නේ. මට මතකයි මම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට ස්වර්ණවාහිනියේ අපේ වැඩ සටහන යන කොට එතුමා මේක බලාගෙන ඉඳලා මට අද වාගේ මතකයි. ඒ වැඩ සටහන අවසන් වෙලා විනාඩි 05 කට පස්සේ මට කථා කළා. ඒ කථා කිරීම නිසා තමයි එදා ඒ අපේ බණ්ඩාරගම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනයට විදුලිය හම්බ වුණේ. මම මේක මතක් කළේ වෙන දෙයකට නොවෙයි. එතුමා අද නොවෙයි, මේ ගැන කථා කළේ. මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.19]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O.W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම අමාත්‍යවරුනි, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුනි. මම සන්තෝෂ වෙනවා බස්නාහිර පළාත් සභාවේ නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් පළමුවැනි මංගල කථාව මා වෙත ලබා දීම පිළිබඳව. ඒ වාගේම බේරුවල ප්‍රාදේශීය සභාවේ දෙවරක් සභාපතිවරයා වශයෙන් කටයුතු කරලා, දැවැන්ත සංවර්ධනයක් සිදු කරමින්, ඒ බේරුවල ආසනයේ සිංහල, මුස්ලිම්, දෙමළ කියන ජනතාව එකතු වෙලා බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්න, ඒ ආසනයේ ප්‍රධාන සංවිධායක රාජිත සේනාරත්න මැතිතුමාගේ ශක්තිය යටතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ ශක්තිය යටතේ ඒ බේරුවල ආසනයේ සියලුම ජනතාවගේ ශක්තිය යටතේ මට බස්නාහිර පළාත් සභාවට එන්න හැකියාව ලැබුණා. ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ සිංහල, මුස්ලිම්, දෙමළ කියන සමස්ත ජනතාව එකතු වෙලා, ඒ වාගේම නිර්මල කොතලාවල ගරු අමාත්‍යතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයත් එකතු වෙලා මා හට ලොකු ශක්තියක් ලබා දුන්නා. ඒ සියලු දෙනාටමත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ සහෝදර සහෝදරියන් ඇතුළු අනෙකුත්, මගේ බිරිඳ, දරුවන්, ඒ වාගේම මගේ ළඟින් ඉන්න මගේ හිත මිතුරන් ටික ඔක්කොම එකතු වෙලා මට ලොකු ශක්තියක් ලබා දුන්නා. ඒ වාගේම බේරුවල මර්ජාන් ෆලීල් මැතිතුමා, ඒ අක්‍රම් මැතිතුමා ඇතුළු සියලු දෙනාටම මගේ අවංක ආදර ස්තුතිය මම මේ අවස්ථාවේදී පිරිනමනවා. මගේ ආදරණීය අම්මා තාත්තා ජීවතුන් අතර නැති වුණත්, මාව මෙලොවට දායාද කරලා හොඳ පුරවැසියෙක් බවට පත් කරලා, මහජන සේවාවක් ජනතාවට ලබා දෙන්න කටයුතු කිරීම පිළිබඳව ඒ දෙන්නාටත් මගේ අවංක ආදර ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමනවා.

ගරු සභාපතිතුමනි, අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඉතාමත් හොඳ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරු, නගරාධිපතිවරු වශයෙන් මේ ප්‍රශ්නය පිළිබඳව මහා දැවැන්ත කථිකාවතකට පත් වෙලා, අභියෝගවලට මුහුණ දීලා තමයි මේ සියලු කටයුතු සාර්ථකව කර ගෙන ආවේ. නමුත් අද මේ වන කොට බස්නාහිර පළාත් සභාවේ ඒ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා,

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ගරු ප්‍රධාන අමාත්‍යතුමා මහා පුදුමාකාර වෙහෙසක් දරනවා සමස්ත රටේම තිබෙන මේ කැළි කසළ ප්‍රශ්නය විසඳන්න. අපේ මේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා අද වර්තමාන පළාත් සභා මන්ත්‍රීතුමා කථා කළා වාගේ එතුමා මහා දැවැන්ත වැඩ කොටසක් ප්‍රාදේශීය සභාවේ සභාපති කාලයේදී කළා. මේ කථා කරන අපිත්, බේරුවල ආසනයේ තිබෙන කුණු ටික ගෙනියන්න ක්‍රමවේදයක් නැති නිසා මේ කථා කරන මම තමයි සොහොන් භූමියේ කොටසක මේ කටයුතු ආරම්භ කරලා, අද මම හිතන්නේ දවසකට ටොන් 18 ක් විතර කැළි කසළ ඒ සොහොන් භූමියට එනවා. මේවා ගෙනැල්ලා වර්ගීකරණය කරලා පොහොර කරන්න. මාසයකට පොහොර කිලෝ හයදාහක් පමණ නිෂ්පාදනය කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. නමුත් ප්‍රශ්න තිබෙනවා. අද යම්කිසි දෙයක් කරන්න ගියාට පස්සේ මම හිතන්නේ, හැම කෙනෙක්ම විරුද්ධ වෙනවා. පක්ෂ පාට භේදයකින් තොරවත් විරුද්ධ වෙනවා. නැත්නම් පක්ෂයේ කට්ටියත් විරුද්ධ වෙනවා. විපක්ෂයේ කට්ටියත් විරුද්ධ වෙනවා. මේක තමයි ස්වභාවය. නමුත් අපි රටකට ගිහිල්ලා බැලුවොත්තින් වෙනත් රටවල මේ වාගේ කැළි කසළ වගුරු බිම්වලට දාලා, ගොඩ කරලා පිට්ටනි බවට පත් කරලා ගෙවල් හදලා දෙන නොයෙකුත් වැඩ සටහන් දියත් වෙනවා. නමුත් මේ රටේ කරන්න ගියොත් දැඩි ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා.

අර කිව්වා වාගේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ කොළඹ දිස්ත්‍රික්කය සංවර්ධනය කරන්න කටයුතු කරන කොට හැම කෙනාම හදවතේ ඇතුළෙන් සන්තෝෂ වෙනවා. කුණු කසළ ටික නැහැ. අද මේ කුණු කසළ ටික නැති කරලා, ඉතාමත් දැවැන්ත වැඩ පිළිවෙළක් දියත් කර ගෙන යනවා. අර එදා ගොඩ කරපු වගුරු බිම් ටික අද එළියට ඇදලා ඒක හරියාකාරව එළියට ගන්න කොට මම හිතන්නේ, සමහරුන්ට මේවා ඉරිසියාවයි. මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්න. කැළි කසළ පාරට දාන්න බැරි වෙන කොට මේකත් හරි ප්‍රශ්නයක් බවට පත් වෙලා. මම තමුන්නාන්සේලාගෙන් අහනවා. මොන ප්‍රාදේශීය සභාවේද, මොන නගර සභාවේද විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා මේ කැළි කසළ ප්‍රශ්නයේදී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාත් එක්ක එකතු වෙලා, එක දවසක් හරි ශ්‍රමදානයක් මගින් කටයුතු කළේ කියලා. ඉන්නවා නම් ඉන්නේ 2% යි. එහෙම විපක්ෂයෙන් ඇවිල්ලා. අද මේ කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් මම අහනවා. තමුන්නාන්සේලාගේ ගේ ඇතුළේ කුස්සියේ තිබෙන කසළ ටික කළමනාකරණය කරලා තිබෙනවාද කියලා පවුලගෙන් හරියට අහන්න කියනවා. ගිහිල්ලා බැලුවොත්තින් කුස්සිය ඇතුලේ සම්පූර්ණයෙන්ම කළමනාකරණය අවිධිමත්. අන්න එහෙම නම් අපි කුස්සියෙන් පටන් ගන්නවා විතරක් නොවෙයි, පෙර පාසලෙන් පටන් අරගෙන තමයි අද ඉහළ දක්වා මේ කථා කරන්නේ. මේ කථා කරන අපි ඒ කළමනාකරණ වැඩ පිළිවෙළ හරියාකාරව කර ගෙන යනවා. මේ කථා කරන අපි පාරේ ට්‍රැක්ටරයක් කැඩුණොත් ට්‍රැක්ටරය පෙරළුනත් සෞඛ්‍ය කම්කරුවාත් එක්ක සවලක් අරන් හරි ඒ කුණු ටික පටවපු නිසා තමයි අපට මේවා ගැන කථා කරන්න පුළුවන්. තමුන්නාන්සේට මම ස්තුතිවන්ත වෙනවා. අද මගේ මංගල කථාව. මම කැමතිම විෂයක් වන කුණු ප්‍රශ්නය ගැන කථා කරන්න අද අවස්ථාවක් දුන්න එකට.

උදාහරණයක් වශයෙන් මේ රටේ ජනතාව විදේශ රටකට ගිහිල්ලා ගෘහ සේවිකා තනතුරට හෝ නැත්නම් අනෙකුත් කර්මාන්තවලට ගිහිල්ලා අවුරුදු ගණනක් සේවය කරන විට ඒ රටේ හරියාකාරව කටයුතු කරනවා. ටින් එක දාන්න ඕනෑ තැනට ටින් එක දානවා. බෝතලේ දානවා. පොලිතින් ටික දානවා. කාඩ්බෝඩ් ටික දානවා. නමුත් ඒ රටවල අවුරුදු හත අටක් සේවය කරලා අද වන විට කොළඹ එයාර්පෝට් එකෙන් බැහැලා ටිකක් දුර එන කොට වමනේ පැකට් එකට දාලා ඒක කරකවලා ජනේලෙන් එළියට විසි කළාම අනෙක් මිනිහාගේ ඔලුවට වැටෙන්න තමයි කටයුතු කරන්නේ. මෙන්න මේක තමයි අපේ ජනතාවගේ තත්ත්වය. හදවත, හිත මොනතරම් හැදුවත් මේ කටයුතු කරන්න ටිකක් වෙලා යනවා. කාලයක් යනවා. ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, මේ කොළඹ කුණු කන්ද ඉහළ ගියේ. මේවාට පිළිතුරු ක්‍රම ක්‍රමයෙන් ලබා ගන්න නම් ඔබතුමන්ලාට පුළුවන් අණ පනත් ගෙනැල්ලා පාර්ලිමේන්තුව තුළ යම්කිසි හඩක් නගන්න. ඔබ විපක්ෂයේ වුණාට ඔබට ඒවාට එකතු වෙලා කටයුතු කරන්න යම්කිසි පුළුවන්කමක් තිබෙනවා. තැන් සොයලා දෙන්න පුළුවන්කම තිබෙනවා. අන්න ඒ නිසා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ පළාත් සභාව තුළත් ඉන්න ගරු මන්ත්‍රීවරු තැන් සොයා ගෙන, අත්වැල් බැඳගෙන ඒවාට කටයුතු කරන්න. ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඇමති මණ්ඩලයටත්, මන්ත්‍රීතුමන්ලාටත් මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන ඉදිරියට ගෙනියන්න තමුන්නාන්සේලාගේ දැඩි සහයෝගය අවශ්‍යයි. මෙතැනට

යෝජනාව ගෙනැල්ලා කථා කරන විලාශය පමණක් නොවෙයි, ප්‍රායෝගිකව අපි ඉදිරිපත් වෙලා, එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා තමයි හෙට අනිද්දා වෙන කොට, නැත්නම් තව අවුරුදු ගණනක් යන කොට ගෙදරකින් කුණු ටික දෙන්නත් සල්ලි ඉල්ලන තත්ත්වයට පත් වෙනවා. ඒකට හේතුව තමයි වර්ගීකරණය කිරීම. අද වර්ගීකරණය නොකළාම ප්‍රාදේශීය සභාව, නගර සභාව මේවාට ස්ථානීය දඩ ගැහුවත් මම හිතන්නේ, ගෙදරින් ඒ ටික වෙන් කරලා දෙන කොට ඒවා ගෙනිහිල්ලා අපි ප්‍රාදේශීය සභාවේ ආදායම් මාර්ගය බවට පත් කරලා තිබෙනවා. පොලිතින්වලට වෙනම ගණනක් ගෙවනවා. කාඩ්බෝඩ්වලට වෙනම ගණනක් ගෙවනවා. ඒ විධියට සියලුම කටයුතු වර්ගීකරණය කරමින් කටයුතු කළාම ඒවාට ලොකු මුදලක් ලැබෙනවා. එහෙම නම් මම සන්තෝෂ වෙනවා. මේ කටයුතු නිර්මාණය කරන්න අපට තනි අතින් අත්පුඩි ගහන්න බැහැ. එහෙම නම් අපි අත් දෙකම එකට අල්ලලා අත්පුඩි ගහලා ඒ කටයුතු කරන්න මේ සන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සහ බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු මධ්‍යම රජයත් අපි සියලු දෙනාමත් එකතු වෙලා මේ කටයුතු සාර්ථක කර ගන්න කටයුතු කරන්න ඕනෑ. අර කුණු ටික ගිහිල්ලා පුත්තලමට දැම්මාට ඒකටත් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න මම හිතන්නේ ආරක්ෂක ලේකම්තුමා කටයුතු කරලා තිබෙනවා. එහෙම නම් ඒකටත් කට්ටිය විරුද්ධ වෙයි. නමුත් විරුද්ධ වුණාට මේ කුණු කන්ද පල්ලෙහාට එනකොට එදාට කියයි ඉතා සාර්ථක වැඩ කොටසක් ආරක්ෂක ලේකම්තුමා කෙක්කෙන් හරි කොක්කෙන් හරි කළයි කියන එක. ඒ නිසා අද මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. අපි කැළි කසළ ප්‍රශ්නයේදී විතරක් නොවෙයි ඕනෑම ප්‍රශ්නයකදී සහයෝගය ලබා දෙන්න මහජනතාව වෙනුවෙන් කැප වෙනවා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 07 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා.12.26]

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහරගම නගර සභාව අවුරුදු 12 ක කාලයක් නියෝජනය කරලා ඉන් වැඩි කාලයක් එහි හිටපු විපක්ෂ නායකවරයා ලෙස අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ සුවච කීකරු බිරිඳත් එක්ක උරෙන් උර ගැටෙමින් මේ ප්‍රශ්නය පිළිබඳව විශාල වශයෙන් ගැටුණු පුද්ගලයෙක් හැටියට මටත් මේ මොහොතේදී මේ ආකාරයට කථා කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත් වෙනවා. මම අවුරුදු 08 ක 09 ක කාලයක්ම එතුමියගේ පාලන කාලය තුළදී මේ ගැටළු පිළිබඳව විශාල වශයෙන් තර්ක කළා. ප්‍රශ්න ඇති කර ගත්තා. මේ සභාව තුළ මම ඒකම ප්‍රතිවිරුද්ධ පාර්ශවයෙන් බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන් මගේ ස්තූතිය පුද කරනවා, මම පළාත් සභාවට තේරී පත් වෙලා කසළ ප්‍රශ්නය පිළිබඳවම කථා කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව. අපේ අත්තනගල්ල හිටපු සභාපතිතුමා, වත්මන් පළාත් සභා මන්ත්‍රීතුමාත් ඒ වාගේම පළාත් පාලන ආයතන හරහා පැමිණි අපේ අනෙකුත් පළාත් සභා මන්ත්‍රීවරු ඒ අය බහුතරයක් සභාපතිවරුන් සහ ඒ හා සම්බන්ධ වුණු මන්ත්‍රීවරුන් දැඩි ලෙස මේ ප්‍රශ්නය පිළිබඳව බලපෑම්වලට ලක් වෙලා හිටපු මිනිස්සු.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කසළ කියලා කියන්නේ විශාල නිධානයක්. හැබැයි, මට මතකයි මහරගම නගර සභාවේදී කථා කරපු ප්‍රශ්නයකදී, මම කොළයක් සොයා බැලුවාම මේ කුණු ගොඩ කියලා කියන්නේ මහ මාෆියාවක්. මේ කුණුවලින් තරම් මුදල් හම්බ කරන්න පුළුවන් ක්‍රම වෙන කොහේවත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇතැම් පිරිස්වල දෛනික ජීවිතයේ මුදල් එකතු කර ගැනීම සඳහා යත්න දරන ප්‍රධානම මාධ්‍යයක් බවට කසළ පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් පළාත් පාලන ආයතන තුළ බුද්ධියෙන් තොර වූ නිර්මාණශිලී නායකත්වයන් බිහි නොවීම මත කසළ පිළිබඳව කවර කාර්යයක්, එහෙම නැත්නම් මොන ආකාරයෙන් මෙය ඉටු කළ යුතුද කියලා ඔවුන්ට නිසි

අවබෝධයක් නැහැ. ඔබතුමාත් හිටපු සභාපතිවරයෙක් හැටියට මම දන්නවා, මම මහරගම නගර සභාවේ හිටපු විපක්ෂ නායකවරයා හැටියට බණ්ඩාරගම හිටපු සභාපතිවරයා ඉතාමත් නිර්මාණශීලීව එතුමාගේ කාර්ය භාරය කරගෙන ගියා. ඔබතුමාට මතක ඇති, ඔබතුමාගේ කාර්ය භාරය බලන්න නගර සභාවක් හැටියට අපිත් පැමිණියා. මම එතුමාට සුදු හුණු ගෑමක් නොවෙයි කරන්නේ. අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ, මේවාට යම් ආකාරයකින් විසඳුමක් ලබා දිය යුතුයි කියන පරමාර්ථයෙන්. මම එතුමාගේ කාර්ය භාරය බලන්න ගිය අවස්ථාවේදී එතුමාට පුළුවන් නම් මේ කාර්යය නිසියාකාරව ඒ විධියට කරන්නට, ඇයි අනෙක් නගර සභාවලට, පළාත් පාලන ආයතනවලට ඒ දේ කරන්න පුළුවන්කමක් නැත්තේ? මම අද උදේත් මහරගම සෞඛ්‍ය පරීක්ෂකවරු සම්බන්ධව කථා කළාම කියපු දෙයක් තමයි මන්ත්‍රීතුමා, පළාත් සභාවෙන් අපට දෙන ප්‍රතිපාදන සහ පළාත් සභාවෙන් අපට යම් යම් දේවල් මිලදී ගැනීම සඳහා අවස්ථාවක් ලබා දෙන්නේ නැහැයි කියලා. අවශ්‍ය කරන වාහන මිලදී ගන්න එහෙන් ඉදිරිපත් කළාම පළාත් සභාව හරහා ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන - ප්‍රතිපාදන කියන්නේ, අවසරය ලබා දීමක් කරන්නේ නැහැයි කියනවා. ඒ නිසා නගර සභාවට සහ පළාත් පාලන ආයතනවලට සිද්ධ වෙලා තිබෙනවා, පිටස්තරින් වාහන මිලදී ගැනීම කරන්න. ඇතැම් අවස්ථාවලදී ටෙන්ඩර්වලින් තොරව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මහරගම නගර සභාව කේන්ද්‍ර කර ගන්නවා. මොකද, හේතුව මා සිටින බල ප්‍රදේශය නිසා. එක දවසකට එක ලොරියකට ගෙවනවා රුපියල් 7750/- ක්. මේ රුපියල් 7750/- තුළ මොන ආකාරයෙන්, මොන විධියට මේ මුදල් සංසරණය වෙනවාද, පරිහරණය වෙනවාද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා මහරගම නගර සභාව ගත්තොත් එහෙම, මහරගම නගර සභාවේ අපට වාහන 14 ක් පමණ තිබෙන්නේ. ඉතුරු හතරක් එහෙම නැත්නම් පහක් දිනපතාම මිලදී ගැනීම් කරන්නේ මෙන්න මේ ක්‍රියා පටිපාටිය මත. ඒ අනුව මේවා නිසියාකාරව එකී බැහැර කරන ස්ථාවලට යනවාද? එහෙම නැත්නම් එතැනින් ගිහිල්ලා - අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාත්, ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාත්, අපි කට්ටිය නිරීක්ෂණ චාරිකාවක් ගියා. ඒ චාරිකා කරන්න ගිය වෙලාවේ අපට දැණුනු දෙයක් තමයි මේ කසළවලින් පුළුවන් එක් වතාවක් මැනලා, කිරීම් කටයුතු කරලා නැවත ඕනෑ නම් ඇතුළට එන්නේ නැතුව ආපහු රවුමක් කාරිය ගහලා, ඒ කුණු කසළ ටිකම ඒ තරාදිය උඩ කිරන්න පුළුවන් මහ ඇමැතිතුමනි. එතකොට මේක හොඳ මුදල් හම්බ කරන ක්‍රමයක්. ඒ දේ සිද්ධ වෙලා තිබෙනවා. ඒ දේ සිදු වෙනවා කියලාත් කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් වෙනත් රටවල්වලට මේක නිධානයක් වුණාට අපට මේක මහ කරදරයක් බවට පත් වෙලා. මට හිතෙනවා ඇතැම් පාර්ශවයන් විසින්ම තමයි මේ දේ සඳහා ඉඩ දෙන්නේ නැත්තේ. මට ලැබුණා 2006 මව්බිම පත්තරයක්. 2006 දී මේ ලියුම්කරුවා ප්‍රකාශ කරනවා, කසළ මගින් විදුලිය උත්පාදනය කිරීම සඳහා. Planet Advantage Ltd කියන බ්‍රිතාන්‍ය ආයතනය ඉල්ලීමක් කරනවා. මේ ආයතනයට මූල්‍ය සම්පාදනය කරනවා යුරෝප් එක්ස්පෝර්ට් ක්‍රෙඩිට් ගැරන්ටි ඩිපාර්ට්මන්ට් කියන ආයතනය. මේ අය රජයෙන් ඉල්ලනවා - මම දන්නේ නැහැ එතකොට මෙතුමාද පාලන බලයේ හිටියේ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් අක්කර පහක් පමණයි මේ ආයතනය ඉල්ලන්නේ. අක්කර පහක භූමි භාගයක් මේ අයට වෙන් කරලා දුන්නොත් මේ කසළ මුදලට මිලදී අරගෙන අවශ්‍ය කරන විදුලිය සපයා දෙනවා කියලා. මම දන්නේ නැහැ, මේ ලියුම්කරුවා හරහා තමයි මම මේ කියන්නේ. රුපියල් 7/- කට යුනිට් එකක් භාර දෙන්න පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළක් තියෙනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති අබාන්ස් ආයතනය ඒ වාගේ බර්න්ස් ආයතනය. මට කථා කළා. පෞද්ගලීකරණය කරන්න දෙන්න බැහැයි කියලා කිව්වාම, නගර සභාව හරහා යම් යම් දේවල්වලට එකඟතාවයක් දක්වන්නේ නැහැයි කියලා කිව්වාම මට පුද්ගලික මට්ටමෙන් කථා කළා. ඔබතුමා ඇයි හුදෙකලා වෙලා එහෙම සටනක් කරන්නේ? අපි එකතු වෙලා මේ වැඩේ කරමු කියලා. එතකොට දැන් මේ එකතු වෙලා වැඩක් කරමු කියන්නේ අනිවාර්යයෙන්ම මේකේ යටි පරමාර්ථය තමයි යම් මුදලක් ඒ හරහා පරිහරණය වීමක් වෙනවා කියන එකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ඒ ආයතනවලට එහෙම නැත්නම් මේ ඉල්ලීම් කරලා තිබෙන ආයතනයට නොදී ඊට වඩා වැඩි ආකාරයක සේවාවක් ඉටු වෙයි කියන පරම පවිත්‍ර වූ චේතනාවෙන් තමයි පළාත් සභාව හරහා කරදියානට ලබා දුන්නේ. මේ කරදියානෙත් මුලින්ම ගියේ

පියදාස කියලා මහත්මයෙකුට අයිති ඉඩම් කෑල්ලක්. මගේ මතකයේ හැටියට. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාත් දන්නවා ඇති. පියදාස කියලා මහත්මයෙකුට තමයි මේක අයිති වෙලා තිබුණේ. මේ පියදාස කියන මහත්මයා මම හිතන්නේ, ඒ වගුරු බිමෙන් මාස පහක් හයක් යනකොට කෝටිපතියෙක් බවට පත් වුණා. පුදුමාකාර මුදල් ප්‍රමාණයක් ආවා. එයා මෙහෙන් ඉඩ දුන්නා. අරයා එහෙන් ගත්තා. කෝටි ප්‍රකෝටි ගණනක් හම්බ කළා. ඊට වඩා වැඩි ආකාරයකින් හොඳ කටයුත්තක් කරන්න ඕනෑ කියලා බලාපොරොත්තුවෙන් තමයි පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය අධිකාරිය හරහා මේ කටයුත්ත භාර අරගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෙනෙකුගේ ජීවත් වීමේ අයිතියක් තිබෙනවා නේ? පුද්ගලයෙකුට තමන්ගේ ජීවිතයේ අයිතියක් තිබෙනවා නේ? මේ පුද්ගලයින්ට අඩුම තරමේ හුස්ම ගැනීමේ අයිතියවත් නැහැ. ඒ ප්‍රදේශයට බැහැලා ඇවිදපු පිරිස් හැටියට, අපි මන්ත්‍රීවරුන් හැටියට ප්‍රදේශයේ පොඩ්ඩක් ඉදිරියට යන්න භයයි. එතකොට අපට ජීවත් වෙන්න තිබෙන අයිතිය ඇයි මේ අදාළ අංශ විසින් පාලනය කරලා තිබෙන්නේ. ඒ ප්‍රදේශවාසීන්ගේ ජන ජීවිතය අවුල් වෙලා තිබෙන්නේ. අඩුම තරමින් පිටස්තර කෙනෙක් තමන්ගේ ගෙදර ගෙන්වා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. විවාහ උත්සවයක්, තමන්ගේ දියණියගේ විවාහ උත්සවයක්වත් එහෙම නැත්නම් සාදයක්වත් ගෙදර පවත්වන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ඇති එළියට බහින තැනම තිබෙනවා හෝටලයක් හදලා. දැන් අවුරුදු ගාණක ඉඳලා දාලා තිබෙනවා මේ හෝටලය බද්දට දීමට ඇත කියලා. කුණු කන්දත් එක්කම තිබෙන හෝටලය. කිසිම කෙනෙක් ගන්නේ නැහැ. මෙලෝ කෙනෙක් ඒ හෝටලය ගන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව දැඩි ජාතික ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. මේක පක්ෂද විපක්ෂද කියලා නොවෙයි. මේක අපි සියල්ලටම ප්‍රශ්නයක්. ඒ නිසා අපි ඔක්කෝම එකතු වෙන්න ඕනෑ. මේක මධ්‍යම රජයටද, එහෙම නැත්නම් පළාත් සභාවටද, පළාත් පාලන ආයතනවලටද කියලා නැහැ. ඒ නිසා සියල්ලම එකතු විය යුතුයි. මම හිතන්නේ වැඩිපුරම කථා කළේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පිළිබඳව. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා - අද මම හිතන්නේ ජනාධිපතිතුමා කිසිම දෙයක් කරලා නැද්ද කොහේදෝ. මොකද, හැමෝම කථා කළේ ජනාධිපතිතුමාගේ බැස්ම පිළිබඳව වෙන්න ඇති. හැමෝම කථා කරන්නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පිළිබඳව. එතුමා කරලා තිබෙන වැඩ. මම හිතන්නේ ඉදිරියට එතුමාව Promote කරන්න උත්සාහ කරනවාද දන්නේ නැහැ. ජනාධිපතිතුමාගේ බැස්මද කොහේද මම හිතන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාව හරහා අපි ජාතික ප්‍රතිපත්තියකින් ප්‍රඥප්තියක් ගෙනැල්ලා, අපට පුළුවන් වයඹ පළාත වාගේ ප්‍රඥප්තියක් ගෙනැල්ලා මේ ආකාරයෙන් නිසි කටයුත්තක් කරන්න. බොහොම ස්තුතියි.

[අ.භා.12.40]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත් කාලෝචිත යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව නිරෝෂන් පාදුක්ක අපේ සහෝදර ගරු මන්ත්‍රීතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම මම හිතන්නේ, පළාත් සභාවක් හැටියට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව එතුමා ප්‍රකාශයක් කළා. මේ වර්ෂ කිහිපය තුළම ඝන අපද්‍රව්‍ය කළමනාරකණයෙන් කිසිදු ඵලක් සිද්ධ වුණේ නැහැ, මේ ගැටළුව විසඳන්න කියලා. ඒ නිසා අපේ සහෝදර මන්ත්‍රීතුමාගේ ඒ චෝදනාවට විරුද්ධව මම පොඩ්ඩක් කථා කරනවා. මොකද හේතුව, අපි පැහැදිලිවම දන්නවා කළුතර දිස්ත්‍රික්කය ගත්තාට පස්සේ අපටත් මේ කුණු ප්‍රශ්නය, කසළ ප්‍රශ්නය දැඩිව තිබුණු ප්‍රශ්නයක් හැටියටයි අපි දැක්කේ. කළුතර දිස්ත්‍රික්කයේ අපේ පළාත් පාලන ආයතන 16 ක් තිබෙනවා. ඒ පළාත් පාලන ආයතන 16 න් 10 කම කොම්පෝස්ට් ව්‍යාපෘති අංගන 10 ක ඉදි කරමින් වැඩි අංගන කිහිපයක් ඉතාමත්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට විශේෂයෙන්ම මම මගේ ස්තුතිය, සමස්ත කළුතර ජනතාවගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. අපි දන්නවා මේ පළාත් පාලන ආයතන 16 තුළ කළුතර දිස්ත්‍රික්කයේ දවසකට මෙට්‍රික් ටොන් 250 ක කුණු එකතු වෙනවා. ඒ නිසා ඒ පළාත් පාලන ආයතන 16 ම කුණු ඉතාමත්ම හොඳින් කළමනාකරණය කරන්න හැකියාව ලැබුණත් විශේෂයෙන්ම මේ වන විට ඒ දිස්ත්‍රික්කයේ සමස්ත ආයෝජනය, මේ ගැටළුව විසඳන්න ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට මිලියන 143 ක් යොදවලා තිබෙනවා.

[ගරු පියල් නිශාන්ත]

ඒ මුදල් යෙදවීම විතරක් නොවෙයි. නිලධාරීන්ගේ තිබෙන කැපවීමත් එක්ක තමයි මම හිතන්නේ, අපට මේ තිබෙන ප්‍රධාන ගැටළුව අවම කර ගන්නට පුළුවන් හැකියාව ලැබුණේ. ඒ වාගේම මම හිතන්නේ, මම ඉන්න ප්‍රදේශයේත් අපට ගැටළුවක් තිබෙනවා. ඒ චෝදනාවෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට බැහැර වෙන්න බැහැ. බේරුවල ප්‍රාදේශීය සභාවේ අපේ හිටපු සභාපතිතුමා කොපමණ උත්සාහ ගත්තත් මේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන්න එහෙම නැත්නම් කුණු කසළ පොහොර බවට පත් කරන්නට මම හිතන්නේ පාදාගොඩ ජනතාවට ලොකු ගැටළුවක් ඇති වෙලා තිබෙනවා. මේ පාදාගොඩ සුසාන භූමියේ ඉදි කරලා තිබෙන කොම්පෝස්ට් අංගනය සඳහා ලක්ෂ 79 ක් වියදම් කරලා තිබෙනවා. අපේ පරිසර අධිකාරිය ලක්ෂ 27 කුත්, ඒ වාගේම ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙන් ලක්ෂ 50 කුත් මේ අංගනය සඳහා වියදම් කරලා තිබෙනවා. ඊළඟට මේ කුණු කසළ තුනී කරන්න විතරක් බේරුවල ප්‍රාදේශීය සභාව ලක්ෂ 81 ක් වියදම් කරලා තිබෙනවා. තුනී කරන්න පමණක් ලක්ෂ 81 ක්. නමුත් අද වනකොට මේ අවට ඉන්න ජනතාවට ඉතාමත් ලොකු ගැටළුවක් බවට පත් වෙලා අද ඒ ප්‍රදේශයම ගඳ ගහන මට්ටමට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දරුවෙකුට කෑම ටිකක් කන්න බැහැ. මැස්සෝ වහනවා ඒ වාගේම ලෙඩ රෝග බෝ වන මට්ටමට අද එය පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම කියනවා, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට මුදල් යොදවනවා වාගේම හොඳ අධීක්ෂණයකුත් කරනවා නම් මම හිතන්නේ, මීට වඩා හොඳ ප්‍රතිඵල අපට ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම තමයි අපි පැහැදිලිවම දන්නවා, සමහර උදවිය රාජපක්ෂලාට ටිකක් හයේ තමයි ඉන්නේ. ඒ නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ ගැන අනෙකුත් රාජපක්ෂලා ගැන කථා කරන්නේ. ඇත්තටම මේ රාජපක්ෂලා ගැන කථා කරනවාට වඩා සමස්ත ජනතාවටම තිබෙන ප්‍රධාන ගැටළුවක් හැටියට මේ ගැටළුව විසඳන්නට අපි කටයුතු කරන්නට ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දැඩි නීති ගෙනාවේ නැත්නම් මම හිතන්නේ මේ මුළු රටම කුණු ගඳ ගහන මට්ටමක් ඇති වෙනවා. ඒ නිසා කරපු හොඳ දේවල් හොඳයි කියන්න පුළුවන් මානසිකත්වයක් තිබෙන්න ඕනෑ.

විශේෂයෙන්ම ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. සැබෑ ලෙසම ප්‍රායෝගික මට්ටමෙන් අපේ කළුතර දිස්ත්‍රික්කයේ සභාපතිවරයෙක් හැටියට ඉතාමත්ම හොඳින් මේ ගැළුවලට විසඳුම් ලබා දීම පිළිබඳව. මේ ගැටළුවට විසඳුම් ලබා දුන්නු කෙනෙක්. ඒ නිසා පැහැදිලි ලෙස මම හිතන්නේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියා නම්, අපට යම් තරමක විසඳුමක් ලබා ගැනීමට පුළුවන්. ඒ වාගේම හැමෝම කථා කරනවා මේ ප්‍රශ්නයෙන් කොහොමද අපි ගැලවෙන්නේ? එහෙම නැත්නම් ජනතාව බේරා ගන්නේ කියලා. පළාත් පාලන ආයතනයක් හැටියට හැම කෙනෙක්ම උත්සාහ ගන්නේ - පළාත් පාලන ආයතන ලොකු සහයෝගයක් ලබා දෙනවා. විශේෂයෙන්ම ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට. මේ ගැටළුව නිරාකරණය කරන්න නම් මම හිතන්නේ කොම්පෝස්ට් ව්‍යාපෘති විතරක් පටන් අරගෙන හරි යන්නේ නැහැ. සමහර උදවිය කියනවා සතියෙන් දෙකෙන් අපට ඕනෑම දෙයක් කොම්පෝස්ට් කරන්න පුළුවන් කියලා. නමුත් එය විධිමත් කරන විට අවසානයේ මාස හයකට වඩා වැඩි කාලයක් යනවා නිවැරදිව කොම්පෝස්ට් වෙන්න. ඒ නිසා විශේෂයෙන්ම කුණු කසළ පැසවන්න, ඒ වාගේම වැඩි වශයෙන්ම කුණු කසළ නරක් වීම තුළ ඒ ප්‍රදේශවල දුගඳ හමනවා වාගේම මැස්සන් වාහනය වෙනවා. ඒ වාගේම මිනිස්සු ලෙඩ රෝගවලට භාජනය වෙලා ඉතාමත් අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම කියනවා, අද දවසේ ඉඳලා මම හිතන්නේ, මුදල් වියදම් කරනවා වාගේම මේ ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කරන්න. ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති කරලා මේවාට විසඳුම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙළට අපේ පූර්ණ සහයෝගය මේ අවස්ථාවේදී ලබා දෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.47]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව ගැන අවධානය යොමු කරද්දී, ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත් මම හිතන්නේ, ප්‍රදේශ ගණනාවක මේ ප්‍රශ්නය ඉතාමත් බරපතළ ප්‍රශ්නයක් ලෙස තිබෙනවා. ජා-ඇළ ප්‍රාදේශීය සභාවට අයිති කඳාන බෝපිටිය මාර්ගයේ විශේෂයෙන්ම අධිවේගී මාර්ගයට ආසන්නව ඉතාම දැවැන්ත කුණු කන්දක් ගොඩ ගහලා තිබෙනවා. දැන් ඒක පාර දක්වාම ඇවිල්ලා

තිබෙනවා. මේ වනකොට ඒ කුණු කන්දට සත්ව කොටස් පවා ගෙනැල්ලා දමන තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ප්‍රදේශයේ ගම් හතකට ආසන්න ප්‍රමාණයක් පුබුදුගම, උස්වත්ත, නැදුරුපිටිය, වීදියමාවත ඒ වාගේම කඳාන පල්ලිය අවට ගම් දෙකක් මේ ආදී වශයෙන් ගම් හතකට වැඩි ප්‍රමාණයක ජනතාව ඉතාම නරක ලෙස පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ මාර්ගයේ පාසල් දෙකක ළමුන් විශාල ප්‍රමාණයක් ගමන් කරනවා. මේ ළමුන්ට ඉතාම නරක ලෙස මේ ප්‍රශ්නය ඔවුන්ගේ සෞඛ්‍යයට බලපාලා තිබෙනවා. ඒත් එක්කම ගම්පහ දිස්ත්‍රික්කයේ කොච්චිකඩේ ප්‍රදේශයේ මීගමුව නගර සභාවේ කුණු බැහැර කරන ප්‍රදේශයක් තිබෙනවා. ඒ කුණු බැහැර කරන ප්‍රදේශයේ කුණු කන්ද නිසා ඒ ප්‍රදේශයේ ජනතාව ඉතාම නරක ලෙස පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා දැන් මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරද්දී අපට හිතුනේ, බස්නාහිර පළාතේ මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳලා කියලා. නමුත් එහෙම නොවෙයි. ඇත්ත තත්ත්වය බලන්න නම් අධිවේගී මාර්ගවල විතරක් ගිහිල්ලා හරි යන්නේ නැහැ. අර කුඩා, කුඩා පාරවල්වලත් ගිහිල්ලා බලන්න ඕනෑ. කොයි වාගේද මේ කුණු ප්‍රශ්නය අපට බලපාන්නේ කියන කාරණය. ඒකෙන් විශේෂයෙන්ම ගම්වල ජනතාව, මොකද, මේ කුණු බැහැර කරන්නේ ගොඩක් වෙලාවට ගම් ආශ්‍රිතව. ඇතුළු වෙන්න තමයි කුණු බැහැර කරන්නේ. නගරබදව නොවෙයි. ඒ නිසා ඔවුන්ට ඉතාම නරක ලෙස මේක බලපාලා තිබෙනවා. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. දැන් මේ ප්‍රශ්නයත් එක්ක කථා කරද්දී අපට හිතුනේ - දැන් අර හැම ප්‍රශ්නයකටම මැක්කා වාගේ, හැම ප්‍රශ්නයක්ම විසඳන්න රාජපක්ෂවරුන්ට භාර කරනවා වාගේ - දැන් විශ්‍රාම පාරිතෝෂික ප්‍රශ්නය ආපු වෙලාවේ ඒ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වුණේ, විදේශයක ඉඳලා තමයි. ඒ වාගේම පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනත ගෙනාපු වෙලාවේ ඒකට එරෙහිව කම්කරුවෝ පාරට බහිනකොට ඒ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වුණෙත් රාජපක්ෂවරු. දැන් කුණු ප්‍රශ්නය විසඳීමත් මන්ත්‍රීවරු කියපු විධියට භාර දීලා තිබෙන්නේ එතුමන්ලාට. ඒ නිසා අපි විශ්වාස කරනවා, දැන් මේ පිළිබඳව මීට වඩා අවධානය යොමු කළ යුතුයි. හැම දේම එක කණ්ඩායමක් කරන්න නම් මහ ඇමැතිවරු ඕනෑ නැහැ. පළාත් පාලන ආයතන භාරව ඇමැතිවරු ඕනෑ වෙන්නේ නැහැ. ප්‍රාදේශීය සභා සභාපතිවරු ඕනෑ නැහැ. නගර සභා සභාපතිවරු, නගරාධිපතිවරු ඕනෑ නැහැ. එහෙම නම් එක් පුද්ගලයෙකුට හෝ දෙදෙනෙකුට මේ රටේම සියලුම ආයතන පාලනය කරන්න පුළුවන්. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා කිව්වා වාගේ එක තැනක දෙකක මේ ප්‍රශ්නය විසඳිලා තිබෙන්න පුළුවන්. හැබැයි සමස්තයක් ලෙස ගත්තාට පස්සේ මේ ප්‍රශ්නය විසඳිලා නැහැ. මේ ප්‍රශ්නයට ස්ථිර සාර විසඳුමක් අවශ්‍යයි. මොකද, මේ කුණු ප්‍රශ්නය කුඩු ප්‍රශ්නය තරමම බරපතළයි. අපේ මුළු රටම කුඩු ප්‍රශ්නයෙන් වෙලාගෙන තිබෙනවා. අකුරු දෙකක වෙනස විතරයි තිබෙන්නේ. කුණු ප්‍රශ්නය කුඩු ප්‍රශ්නය තරමම බරපතළයි. කුඩුලින් දරුවන්ගේ ජීවිත හානි වෙනවා වාගේම කුණුවලින් දරුවන්ගේ සෞඛ්‍ය හානි වෙනවා. දරුවන්ගේ අනාගතයට බලපානවා. ඒ නිසා මේ ප්‍රශ්නයට තවදුරටත් එකිනෙකාට චෝදනා කර ගනිමින් එකිනෙකා මත වරද පටවමින් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳන්න නම් අපි හිතනවා ඉතා හොඳ වැඩ පිළිවෙළක් පළාත් සභාවට අවශ්‍ය වෙලා තිබෙනවා.

ඒ වාගේම දැන් කොළඹ නගරය දැක්කාම සතුටු වෙනවා කියලා මන්ත්‍රීවරු කියනවා. ඔව් ඇත්ත. කොළඹ නගරය දැක්කාම සතුටු වෙලා විතරක් හරි යන්නේ නැහැ. කොළඹ නගරයේ කොලොන්නාවට ගිහිල්ලා බලන්න ඕනෑ ඒ සතුට ඒ විධියටම තියා ගන්න පුළුවන්ද කියලා. ගම්පහ නගරය අවට විතරක් බලලා හරි යන්නේ නැහැ. ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඔබතුමා උදේ පාන්දර පොඩ්ඩක් ගම්පහ නගරය වටේ ඇවිදලා බලන්න. කුණු පුරවා ගත්තු ට්‍රැක්ටර්, කුණු පුරවා ගත් වාහන උදේ පාසල් ළමුන් පාසල් යන මොහොතේදීත් පාරවල් දිගේ යනවා. සමහර විට පාරවල් දිගේ කුණු හලාගෙන යනවා. ඒවා සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි. කුණු ගොඩවල් ගැන අවධානය යොමු කරනවා වාගේම ඒවා ප්‍රවාහනය සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, ප්‍රවාහනය කරද්දී අඩුම තරමේ පාසල් ළමුන් පාසල් යන වෙලාවෙන් බැහැරව වෙනත් වෙලාවක ඒක පාවිච්චි කරන්න ඕනෑ. එක්කෝ රාත්‍රී කාලයේදී. එහෙම නැත්නම් දවසේ වෙනත් කාලයකදී. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කළ යුතුයි. ඒ නිසා අවට සිරි නරඹ නරඹා Walking Park දිහා බලාගෙන ඒවා විතරක් නරඹමින් මේ ගැන සතුටු වෙලා හරි යන්නේ නැහැ. එතැනින් එහා තිබෙන ලෝකය පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ කියන කාරණය තමයි විශේෂයෙන්ම මතු කරන්න බලාපොරොත්තු වෙන්නේ.

[ගරු මහින්ද ජයසිංහ]

ඒ වාගේම රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කිව්වා මේක ඉහළම ආදායම් ලබන - මම හිතන්නේ දෙවැනි ආදායම වාගේ වෙන්න ඇති. මේ වනකොට ඉහළම ආදායම ලබන්නේ කුඩු ජාවාරමින්. ඊළඟ එක වෙන්න ඇති කුණු. විශේෂයෙන්ම පුබුදුගම, කඳාන, බෝපිටිය පාරේ තිබෙන මේ කුණු කන්ද පිළිබඳ නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. ඒ අවට ඉන්න සමහරු මිලදී අරගෙන තිබෙනවා. ඒ අවට ඉන්න සමහරු මිලදී ගන්නවා. මොකද, ඔවුන්ට මේකට විරුද්ධ වෙන්න ඉඩ තියන්නේ නැතුව අදාළ බලධාරීන් විසින් ඔවුන්ට විවිධ වරදාන, වරප්‍රසාද, කප්පම් දීලා ඔවුන්ව මිලදී ගන්නවා. එතකොට ඔවුන් සමහර විට විරුද්ධ වෙන්නේ නැහැ. ඔවුන්ට මේකට විරුද්ධ වෙන්න උවමනාව තිබුණත් ඔවුන්ව මිලදී ගැනීම නිසා, ඔවුන්ට විවිධ අල්ලස් දීම නිසා, ඔවුන් ඔවුන්ගේ හඬ අවදි කරන්නේ නැහැ. එවැනි වටපිටාවක් මේකේ නිර්මාණය වෙලා තිබෙනවා. ඊට එහා ගියපු තව තව ජාවාරම් මේක ඇතුළේ සිදු වෙන්න පුළුවන්. තව සමහරුන්ට මේ කුණුවලින් ජීවත් වන වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, දැන් මේ බස්නාහිර පළාත තුළ කුණු එහෙම නැත්නම් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් මීට වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා. මීට වඩා වැඩි අවධානයක් යොමු කරලා, මේ ප්‍රශ්නය අපේ පළාතේ දැවෙන ප්‍රශ්නයක් ලෙස, බරපතළ ප්‍රශ්නයක් ලෙස සැලකිල්ලට අරගෙන - විශේෂයෙන්ම අපි විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපට තිබෙන්නේ, මේ කාරණය පෙන්වලා දීමයි. එතකොට ආණ්ඩුව චෝදනා එල්ල කරලා හරි යන්නේ නැහැ, මේක විසඳන්න යෝජනා ඉදිරිපත් කරන්න කියලා. යෝජනා ඉදිරිපත් කිරීම, වැඩ පිළිවෙළවල් හැදීම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම අදාළ වෙන්නේ, ආණ්ඩු පක්ෂය සහ ආණ්ඩු පක්ෂයේ මැති ඇමැතිවරුන්ට. ඔබතුමන්ලා තමයි ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒකට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අපි ලැහැස්තියි. ඒකට අවශ්‍ය සහයෝගය ලබා දීලා අපේ කාර්ය භාරය ඉටු කරන්න අපි සූදානම් කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.55]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව යටතේ මගේ මංගල කථාව කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පිහිට වූ පළාත් සභාවේදී ඒ පළාත් සභාව විසින් ඉටු කළ යුතු මූලිකතම නෛතික සහ සමාජයීය වගකීමක් සම්බන්ධව මාගේ මංගල කථාව කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ මංගල කථාව සභා වාර පහකදී කල් ගියා. මම හිතන්නේ, මේ පළාතේ පසුගිය කාලය පුරාවට තිබුණු නීතිය හා සාමය බිඳ වැටීම පිළිබඳ ගැටළුවක් වෙන්න ඇති. ඒ ගැටළුව මතම මේ සභාවේත් නීතිය හා සාමය පසුගිය සභා වාරවලදී පවත්වාගෙන යාමට නොහැකි වීම නිසාම මේ යෝජනාව හරහා සිදු කිරීමට නියමිත වූ මාගේ මංගල කථාවත් කල් ගියා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ කෙසේ වෙතත් මේ යෝජනාව හරහා සාකච්ඡාවට භාජනය කෙරෙන කරදියාන කැළි කසළ අවසන් පිරවුම් බිම පිහිටා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප නියෝජනය කරන මා ජීවත් වන, ඒ වාගේම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ජීවත් වන කැස්බෑව මැතිවරණ බල ප්‍රදේශය තුළ. ඒ කැළි කැසළ අංගනය පිහිටා තිබෙන්නේ, මම වසර පහකට ආසන්න කාලයක් සභාපති ධූරය දැරූ කැස්බෑව නගර සභා බල ප්‍රදේශය තුළ. ඒ නිසා මේ පිළිබඳව සමාජයට ඇති වෙලා තිබෙන බරපතළ සමාජයීය ගැටළුව විසඳීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන්නට අපට දැඩි වගකීමක් තිබුණා. ඒ නිසා ඒ කාලය තුළදී විශේෂයෙන්ම පළාත් සභාව යටතේ ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත් සන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. කිසිදු දේශපාලන පක්ෂ පාට භේදයකින් තොරව ඒ කටයුතු සම්පූර්ණ කරන්න. නමුත් අද මේ වනවිට කරදියාන කුණු කන්ද - මම හිතන්නේ මෙතැන ඉන්න ගරු මන්ත්‍රීවරු වැඩිපුරම දන්නේ බ්ලූමැන්ඩල් කුණු කන්ද සම්බන්ධව. ඒ කුණු කන්දට නොදෙවෙනි කුණු කන්දක් අද කැස්බෑව මැතිවරණ බල ප්‍රදේශය තුළ තුන්බෝවිල උතුර ග්‍රාම සේවා වසම තුළ කරදියාන ප්‍රදේශයේ අද බිහි වෙලා තිබෙනවා. මේ සභාව නියෝජනය කරන විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ට මා ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා. එන්න නිරීක්ෂණ චාරිකාවකට, මේ කුණු අංගනය දෙස බලන්න කියලා. මොකද, අද මේ කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ බල ප්‍රදේශ 15 න් බල ප්‍රදේශ 8 ක නැත්නම් 9 ක කැළි කසළ ගෙනැල්ලා ගොඩ ගහන්නේ

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කරදියාන කැළි කසළ අංගනයේ. ඉතින් එහෙම නම් අද ඒ ප්‍රදේශ නියෝජනය කරන මහජන නියෝජිතයින් තමන්ගේ ගමට ගිහිල්ලා තමන්ගේ ගමේ නගරයේ කැළි කසළ ප්‍රශ්නය විසඳුනා කියලා අද උජාරුවෙන් කථා කරනකොට කැස්බෑවේ ජීවත් වන මහජන නියෝජිතයන් වශයෙන් අපට දැඩි ගැටළුවකට, දැඩි ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අද තමුන්නාන්සේලා දන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ භූමි ප්‍රමාණයෙන් බස්නාහිර පළාත නියෝජනය වෙන්නේ 5.7% ක්. හැබැයි ලංකාවේ ජනගහනයෙන් 30% ක් ජීවත් වෙන්නේ බස්නාහිර පළාතේ. ලංකාවේ ජනනය වන කැළි කසළවලින් 60% ක් ඇති වෙන්නේ මේ බස්නාහිර පළාත තුළ. එසේ නම් බස්නාහිර පළාත නියෝජනය කරන ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු සියලුම ඇමැතිතුමන්ලාට පක්ෂ විපක්ෂ සියලුම මහජන නියෝජිතයන්ට සුවිශේෂී වගකීමක් තිබෙනවා, ත්‍රස්තවාදී උවදුර හා සමාන, මත්ද්‍රව්‍ය උවදුර හා සමාන මේ කැළි කසළ උවදුරටත් ස්ථිර සාර විසඳුමක් ලබා දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මා විශ්වාස කරනවා පසුගිය කාලය පුරාවටම කරදියාන කැළි කසළ අංගනය මේ දක්වා බරපතළ තත්ත්වයකට වර්ධනය වුණේ, බස්නාහිර පළාත් සභාවේ තිබුණු අකර්මන්‍යතාවය, අකාර්යක්ෂමතාවය නිසා. ඔබතුමන්ලා පිළිගන්නවා, මේ වනවිට බස්නාහිර පළාත් සභාවට වසර 20 යි. තමුන්නාන්සේලාගේ පාලන කාලය යටතේ වසර 20 යි. දශක දෙකයි. කරදියාන කැළි කසළ අංගනය බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපාදන යටතේ, ආශිර්වාදය යටතේ ආරම්භ කරලා ඒ කැළි කසළ අංගනයටත් වසර 16 යි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අද මේ වනවිට කොළඹ බ්ලූමැන්ඩල් කුණු කන්ද හා සමානවම කුණු කන්දක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම නම් පාලක පක්ෂයේ ඔබතුමන්ලාගෙන් මම එක ප්‍රශ්නයක් අහනවා. ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියට අනුව ඔබතුමන්ලා පිළිගන්න ඕනෑ, මේ ගැටළුවට විසඳුම් සෙවීමට පමා වීමට ඔබතුමන්ලාගේ වගකීමක් තිබෙනවා කියන එක. ඒ නිසා මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සිහිපත් කරන්නේ මීට වසර කිහිපයකට පෙර 2008 දී ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ පැවතුණු බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය එතුමාගේ අවශ්‍යතාවයට අනුව එතුමාගේ මඟ පෙන්වීමට අනුව ඒ අධිකාරියට ක්‍රියාත්මක වෙන්න අවස්ථාවක් නොලැබීම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මූලික වශයෙන් ප්‍රධානතම හේතුව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මට එක විනාඩියක කාලයක් ලබා දෙන්න. 2008 දී බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මේ කැළි කසළ අංගනය කළමනාකරණය කරමින් තියෙනකොට විශේෂ කැබිනට් තීන්දුවක් අරගෙන Golden Sunrise සමාගමට භාර දෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඊට පස්සේ වසර දෙකකට පසු 2010 දී කැබිනට් ඇමැතිවරු දෙදෙනෙක්ම ඇවිල්ලා, ගාමිණී ලොකුගේ ඇමැතිතුමා සහ එවකට පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා ඇමැතිතුමා ඇවිල්ලා, කැබිනට් තීන්දුවකින් ලබා දුන්නු Golden Sunrise සමාගම ඒ කටයුත්තෙන් ඉවත් කරනවා. දැන් මේ වනවිටත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ටෙන්ඩර් පටිපාටි කැඳවමින් නියමිත ආයෝජකයෙක් සොයන්න උත්සාහ කරන අවස්ථාවකදී පසුගිය වසරේ නැවත වතාවක් කැබිනට් තීන්දුවකින් Horizon Renewable Recycling Pvt. Ltd. කියන පුද්ගලික සමාගමට භාර දීලා තිබෙනවා, ඒ කටයුතු කරන්න. මම විශ්වාස කරන්නේ බස්නාහිර පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පළාත් සභාවේ කටයුතු කරගෙන යෑමේදී ගරු ඇමැතිතුමාගේ බලතලවලට උඩින් ගිහිල්ලා කැබිනට් තීන්දු ගැනීම නිසා තමයි අද මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ කියලා මම විශ්වාස කරනවා.

ඒ නිසා මා විශ්වාස කරනවා, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව හරහා මේ කටයුත්ත නාගරික සංවර්ධන අධිකාරියට පැවරීම පිළිබඳව අපේ ගැටළුවක් නැහැ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එසේ පවරනවා නම් අපේ නීතිමය පැවරීමක් අවශ්‍ය වෙන්නේත් නැහැ. ආරක්ෂක ලේකම්තුමාට ඒ කටයුත්ත කරන්න පුළුවන්. කෙසේ හෝ අපේ මැතිවරණ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන මේ සමාජයීය අර්බුදය විසඳීමට පළාත් සභාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමා හා අනෙකුත් ගරු අමාත්‍යවරු, පක්ෂ විපක්ෂ සියලු දෙනාම මැදිහත් වීමෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

[අ.භා.01.02]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. ඒ වාගේම පානදුර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් වසර 9 ක කාලයක් මම සේවය කරලා අද බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වෙන්න මා හට ඡන්දය දුන් පානදුර බල ප්‍රදේශය ඇතුළු දිස්ත්‍රික්කයේ අනෙකුත් ආසනවල මහජනතාවට මගේ අවංක ආදර ස්තුතිය මේ අවස්ථාවේ ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම විශේෂයෙන්ම මා මේ අවස්ථාවේදී මාව මෙලොවට බිහි කරපු මගේ සදාදරණීය මෑණියන්, ඒ වාගේම දේශපාලන අත්වැලක් වුණු මගේ පියාණන් මේ අවස්ථාවේ ඉතාමත් කෘතවේදීව සිහිපත් කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, මා හට නාම යෝජනා ලබා දීමට කටයුතු කරපු අපේ ආසනයේ සංවිධායක සුළු අපනයන භෝග ප්‍රවර්ධන ගරු අමාත්‍ය රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාටත් මගේ අවංක ආදර ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, මා හට සහයෝගය දුන් සියලු දෙනාටත් මා මේ අවස්ථාවේදී මගේ අවංක ආදර ස්තුතිය ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම අපේ ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි කසළ ප්‍රශ්නයෙන්ම මගේත් මංගල කථාව ආරම්භ කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ කෙසේ වෙතත් පසුගිය වසර 9 ක කාලය තුළ මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් විශාල අත්දැකීම් සමූහයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් වශයෙන් අපට තිබෙනවා. මේ කාලය තුළ අපි සියලු දෙනා එකතු වෙලා විශේෂයෙන්ම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාත් සමග සුසංයෝගයෙන් අපි කටයුතු කළා. පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිනපතා ජනනය වන කැළි කසළ ඉවත් කරන්න ඒවාට වෙනම වැඩ පිළිවෙළක් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමග සාකච්ඡා කරලා අවශ්‍ය කටයුතු කරලා ආකල්පමය වෙනසක් ඇති කරන්න ඒ කාලය තුළ අපට හැකියාවක් ලැබුණා. දැනට 75% ප්‍රමාණයක් ඒ ආකල්පමය වෙනස තුළින් මහජනතාව මේ කසළ විධිමත් ලෙස ප්‍රදේශයට මුදා හරිනවා. ඒ කටයුතු අපි නිසියාකාරයෙන් කරලා පානදුර ප්‍රාදේශීය සභාවේ පොහොරවත්ත ප්‍රදේශයේ අද නොමිලේ කසළ ලබා ගැනීමට කටයුතු කරනවා. මේ වාගේ විශාල වැඩ කොටසක් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් අපි පළාත් පාලන ආයතන වෙනුවෙන් ඉටු කළා.

ඒ වාගේම මම හිතන්නේ අපි සියලු දෙනා මේ ප්‍රශ්නයට යථාර්ථවාදීව මුහුණ දිය යුතුයි. අභියෝගාත්මක ප්‍රශ්නයක්. සභාපතිවරුන් පමණක් නොවෙයි මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන් මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. දැනට අතිගරු ජනාධිපතිතුමා විශේෂ වැඩ පිළිවෙළක් - අපි දන්නා තරමින් සනීපාරක්ෂක කසළ රඳවන ශ්‍රී ලංකාද්වීපය පුරා විශේෂයෙන් මහනුවර ප්‍රදේශයේ, දොම්පේ ඒ වාගේම පානදුර බටහිර මාලමුල්ල, ගල්ගොඩ කැලේ කියන අක්කර 10 ක ඉඩම. ඒ වාගේම හික්කඩු ප්‍රදේශයේ. එතුමා කැබිනට් පත්‍රිකාවක් මගින් ඒ ප්‍රදේශ පුරා ක්‍රියාත්මක කරන්න විශේෂ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. මම හිතන්නේ වසර තිහක කුරිරු යුද්ධය නිම කරපු එතුමාට අද අපි නිදහස් ශ්‍රී ලංකාවේ එකම ශ්‍රී ලාංකකයින් වශයෙන් සිංහල, දෙමළ, මුස්ලිම් භේදයෙන් තොරව ජීවත් වන අපි සියලු දෙනා එකතු වුණොත් මේ ප්‍රශ්නය විසඳීම ඉතාමත්ම සරල දෙයක්. ඒ නිසා අපි සියලු දෙනා යථාර්ථයට මුහුණ දීලා, මේ අභියෝගාත්මක ප්‍රශ්නයටත් අපි සියලු දෙනා එකතු වෙලා මුහුණ දෙමු කියන ප්‍රකාශය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.01.07]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිබඳව මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කළා. මේ යෝජනාව හැටියට පළමුවැනි ඡේදයෙන් එතුමා සන අපද්‍රව්‍ය අධිකාරිය පුරා වසර හතකට අධික කාලයක් තිස්සේ අපොහොසත් වුණාය කියන කාරණාව තමයි ඉදිරිපත් කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශ්වාස කරනවා, අපෙන් විය යුතු යම් අඩුපාඩුවක් වෙන්න ඇති, මේ සන අපද්‍රව්‍ය අධිකාරිය පිළිබඳව ඒ ආයතනය හරහා මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ කටයුතු නොකිරීම. මේ ආයතනය ආරම්භ කළේ රෙජිනෝල්ඩ් කුරේ හිටපු මහ ඇමැතිතුමා. මම හිතන්නේ, එතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අඩු ගණනේ එතුමා රටේ අනාගතය ගැන හිතලා ප්‍රමාද වෙලා හරි මේ වාගේ ආයතනයක් පිහිටුවලා මේ කටයුතුවලට මැදිහත් වෙන්න කටයුත කිරීම පිළිබඳව අගය කරනවා. අද මේ ආයතනය

නැත්නම්, මේ ආයතනයේ උපදේශන - පළාත් පාලන ආයතනවල හිටපු සභාපතිවරු බොහෝ දෙනෙක් කථා කළා. ඒ අය කථා කරනකොට එතුමන්ලා මුහුණ දීපු ගැටළු හා මේ ආයතනය හරහා ඒ ඒ ආයතනවල සිදු වන කාරණා පිළිබඳව කථා කළා. අද මේ කැළි කසළ ප්‍රශ්නය පළාත් සභාවට අයිති විෂයයක් නොවෙයි. මේක පළාත් පාලන ආයතනවල වගකීමක්. නමුත් පළාත් පාලන ආයතන, පළාත් සභාව යටතේ තිබෙන නිසා රෙජිනෝල්ඩ් කුරේ හිටපු ප්‍රධාන ඇමැතිතුමා විශ්වාස කරන්න ඇති, අපි යම් මැදිහත් වීමක් කරලා මේ අයට මේ ප්‍රශ්නය විසඳන්න දායකත්වයක් දෙන්න ඕනෑය කියලා. ඒ නිසා පළාත් පාලන ආයතන මට්ටමෙන් ගමේ ඉඳලා පළාත් පාලන ආයතනවලට කොම්පෝස්ට් අංගන හදලා කුණු ප්‍රශ්නය විසඳන්න යම් මැදිහත් වීමක් කරපු නිසා තමයි මේ පළාත් පාලන ආයතන බොහොමයක් අද මේ ප්‍රශ්නයෙන් මිදිලා තිබෙන්නේ. මේ පළාත් පාලන ආයතනවලට දරා ගන්න බැරි කොටසක්, මේ ප්‍රඥප්තිය හරහා පළාත් සභාව සිදු කරලා තිබෙනවා. මේ අධිකාරියේ ප්‍රඥප්ති සකස් කරලා, නීති රීති හදලා අද පළාත් පාලන ආයතන මට්ටමෙන් දිරන නොදිරන කියන විධියට කසළ බෙදලා ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආයතනයේ උපදේශන මට්ටමෙන්. ඒ නිසා උපදේශන සේවාවක් කරන අතරතුරදී තමයි අපට බරක් වුණු පළාත් සභාවේ ප්‍රතිපාදන වෙන් කරලා කටයුතු කරන කරදියාන අපට භාර දුන්නේ. හැබැයි මෙතැන ඉන්න ඒ ප්‍රදේශය නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීවරු දන්නවා මේක අපට භාර දෙනකොට තිබුණු තත්ත්වය. මා ළඟ තවම ඡායාරූප තිබෙනවා. මම ඕක බලන්න ගියා. එදාට වඩා අද ඒ අංගනය - මම කියන්නේ නැහැ සියලු දේවල් සම්පූර්ණයි කියලා. නමුත් එදා තිබුණු තත්ත්වයට වඩා, මම හිතන්නේ අපේ ලෙනාඩ් කරුණාරත්න හිටපු සභාපතිතුමා දන්නවා එදා ඒ පැත්තේ තිබුණු තත්ත්වය. එදා තිබුණු තත්ත්වයට වඩා අද යම් යහ පාලනයකින් එතැන කටයුතු සිද්ධ වෙනවා කියන එක අපි කාටත් දකින්න පුළුවන්. කොළඹ, කොලොන්නාවේ මේ සියලුම කුණු කඳුවලට වඩා එතැන යම් පාලනයක් ඇති කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුල් යුගයේ මේක පාලනය කළේ, පෞද්ගලික ආයතනයක්. එතුමා කිව්වා වාගේ. මට මතකයි මම පළමුවැනි පාරට එතැනට යනකොට කිඹුල්ලු වාගේ ලොකු කබරයෝ හිටියා. බල්ලෝ හිටියේ තුවාල වෙලා. නමුත් ඔබතුමන්ලා පිළිගන්නවා ඇති අද ඒ තත්ත්වය ගොඩක් දුරට මර්දනය වෙලා තිබෙනවා. මම කියන්නේ නැහැ ඒක සම්පූර්ණ වෙලා කියලා. නමුත් අපට දුන්නේ කුණු කන්දක්. මේක විසඳගන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේකට මහ පරිමාණයේ ව්‍යාපෘතියක් කොළඹටයි, ගම්පහටයි එන්න දැන් කාලය හරි. මේවා හිතන්න තිබුණේ මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා. ඒ නිසා තමයි අද ඒ අධිකාරිය හරහා ඒ සඳහා අවශ්‍ය පසුබිම හැදුවේ. හදලා මේ කටයුත්ත කරන්න අද යම් යම් ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. නමුත් මේවා ආරම්භ කරලා, මහ පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක භාවයට පත් වෙන්න අවුරුදු තුනක් විතර යනවා. අපේ ගරු මන්ත්‍රීතුමා ඉතාමත් නිවැරැදිව කිව්වා වාගේ මේ රටේ තිබෙන භයානකම ප්‍රශ්නය බවට අද කුණු පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද අපි කඩුවෙල ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කටයුතු කළා. ප්‍රදේශයේ විරෝධතා ආවා. දේශපාලන අධිකාරියේ විරෝධතා ආපු නිසා අපි තාවකාලිකව අත්හිටුවලා ඒ පිළිබඳව නිලධාරීන්ට උපදෙස් දීලා තිබෙනවා, මේ පිළිබඳව දැනුවත් කිරීම් කරලා කටයුතු කරන්න කියලා. අපේ මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ කොළඹ තිබෙන සියලුම ආයතනවල කුණු නොමිලේ ඒ ආයතන මිලදී ගන්න ඉදිරිපත් වෙලා, ඒ කටයුත්ත බොහෝ දුරට අවසන් වෙලා තිබෙනවා. දැන් අපට තිබෙන්නේ, ඉඩම් පැවරීම කරන්න. ඉඩම් පැවරීම කරන්න එනකොට අපට දේශපාලන අධිකාරිවල, ඒ ප්‍රදේශයේ ජනතාවගේ විරෝධතා නිසා තාවකාලිකව අත්හිටුවන්න කටයුතු කරලා තිබෙනවා. කරදියාන ව්‍යාපෘතිය පිළිබඳව කථා කළා. අද එතැන පළාත් සභා වියදමින් කොම්පෝස්ට් අංගනයක් ඇති කරලා තිබෙනවා.

අපේ කළුතර මන්ත්‍රීවරු කථා කළා. කළුතරට තිබුණු ලොකුම ප්‍රශ්නය කුණුවලට විසඳුමක් නැති එක. පළාත් සභාවත්, අධිකාරියත් සම්බන්ධ වෙලා අද කළුතර ඒ ප්‍රශ්නයට යම් මට්ටමක විසඳුමක් - පූර්ණ විසඳුමක් නොවෙයි. යම් මට්ටමක විසඳුමක් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ හා සමානම මහ පරිමාණයේ ව්‍යාපෘතියක් කරදියානේ ආරම්භ කරලා අවුරුදු තුනක් යනවා ඒක අවසන් කරන්න. ඒ කාලසීමාව තුළ මේකේ යම් මට්ටමකින් පාලනයක් ඇති කරන්න අද කොම්පෝස්ට් අංගනය පළාත් සභා අරමුදල්වලින් ඉදි කරමින් යනවා. එතැනට යනකොට එය දකින්න පුළුවන්කම තිබෙනවා. නමුත් මම දන්නවා ගාමිණී ලොකුගේ ඇමැතිතුමා

ඒ ආසනයේ සංවිධායකවරයා හැටියට එතුමා විශාල දේශපාලන අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ ජනතාවක් එක්ක. පළාත් සභා මන්ත්‍රීවරු දේශපාලන අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. නමුත් මේ කරදියාන නිසා පළාත් පාලන ආයතන හතක ප්‍රශ්නය විසඳිලා තිබෙනවා. එක තැනකට කුණු ටික එනකොට අනෙක් තැන් පිරිසිදු වෙලා, ලස්සන වෙලා, අලංකාර වෙනකොට කවුරුත් හිතන්නේ නැහැ මෙහෙම වෙන්නේ කොහොමද කියලා. ඒ අය හොඳයි පිරිසිදුයි ලස්සනයි කියනකොට එක කොට්ඨාශයක් මේකෙන් පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒක මම පිළිගන්නවා. නමුත් මේවාට විසඳුම් ලැබෙන්න ඕනෑ කියන කාරණය මම විශ්වාස කරනවා. ඒ සඳහා අධිකාරියක් හැටියට, පළාත් සභාවක් හැටියට අපට ලබා දිය හැකි සියලුම සහයෝගය ලබා දෙන්න අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ගෙන එනකොට මමත් පුල්ස්කැප් පිටු හතර පහක අදහස් ටිකක් අරගෙන ආවා කථා කරන්න. හැබැයි මන්ත්‍රීවරුන් කථා කරනකොට මම හිතුවා ඒක ඒ තරම්ම කථා කළ යුතු දෙයක් නොවෙයි කියලා. ඒක නිසා මම මේක සභාගත කරනවා.[3] මොකද, මන්ත්‍රීතුමාගේ යෝජනාව කථාවලින් බාල්දු වුණා දෝ කියලා මට හිතුණා. මොකද, එතුමා කථා කළේ මේ අධිකාරිය සම්බන්ධව. හැමෝම කථා කළේ ගෝඨාභය රාජපක්ෂ ගැන. මම දන්නේ නැහැ මොකක්ද? ඒ භීෂණය. ඇයි එපමණ අවධානයක් යොමු කළේ කියලා. හැමෝම කථා කළේ ඒක. මම විශ්වාස කළේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාවට යෝජනාව ගෙන එනකොට මේ යෝජනාව සම්බන්ධව කථා කරයි කියලා. අදහස් ඉදිරිපත් කරයි කියලා. (බාධා කිරීමක්) ස්තූතිවන්ත වෙනවා, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට. ඒ වාගේම අපේ මහරගම විරුද්ධ පක්ෂයේ හිටපු රොඩ්නි ෆ්‍රේසර් මන්ත්‍රීතුමාට. එතුමන්ලා යම් දායකත්වයක් ලබා දෙන්න කටයුතු කළා. අනෙක් හැමෝම කථා කළේ ගෝඨාභය රාජපක්ෂ ගැන. මම හිතන්නේ ඔබතුමාගේ යෝජනාවේ අවසානයේ ඔබතුමා පවා පිළිගන්නවා, එතුමා ලේකම් ධුරය දරන නාගරික සංවර්ධන අධිකාරිය සමග හෝ සම්බන්ධ වෙලා මේක කළ යුතුයි කියලා. අද කොළඹ ලස්සන ගැන, මොකද, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා මාදිවෙල මරණ ගෙදරකට ගියාම එතැන වගුරු බිමක් ගොඩ කරලා Car Park එකක් හදලා කියලා. හැබැයි මම හිතන්නේ එතුමා ඒ මරණ ගෙදරට යනකොට ඒ ප්‍රදේශයේ ක්‍රමවත්ව, ක්‍රමානුකූල සංවර්ධනයක් ඇති කරන්න, ගංවතුර බැස යන විධියක් - මම ඊයේ පෙරේදා ගියා ඒ ප්‍රදේශයට. සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාගේ ගෙදර තියෙන්නේ ඒ ප්‍රදේශයේ. ඒ ප්‍රදේශය තිබුණු හැටි අපට මතකයි. නමුත් අද ඒ ප්‍රදේශවලට ගියාම අවුරුදු ගණනක් වගා නොකරපු බිම් අපේ පැරණි ක්‍රමයට වගා කරලා, කන්න තුනම අද වගා කරන තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඔබතුමා පිළිගන්නවා ඇති. ඒ ප්‍රදේශයේ ජනතාව පසුගිය කාලයේ මුහුණ දීපු ගැටළු ගොඩක් ඒ හරහා අද නිරාකරණය වෙලා තිබෙනවා.

අපි විශ්වාස කරනවා, ඒ ප්‍රදේශයේ ඇති වුණු සංවර්ධනය ගැන කුහකකමින් බලන්නේ නැතුව, හොඳ දේ හොඳයි කියන්නත්, නරක දේ නරකයි කියන්නත් අපට පුළුවන්කම තිබෙන්න ඕනෑ. විරුද්ධ පක්ෂයේ වුණු පලියටම විරුද්ධ දේ ගැන විවේචනය කරලා හොඳ දේත් නරක දේ බවට පත් කළ යුතු නැහැ. හොඳ දේ හොඳයි කියන්නත්, වැරදි දේ වැරදියි කියන්නත් අපට පුළුවන්කමක්, කොන්දක් තියෙන්න ඕනෑ. ඒ නිසා -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මහ ඇමැතිතුමා, අපේ යෝජනාවක් ආවාම ඕකේ අනෙක් පැත්ත වෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ ව්‍යාපෘති සම්බන්ධව කථා කරනකොට මම කනගාටු වෙනවා. අද විරුද්ධ පක්ෂයට වෙලා තිබෙන්නේ, මේ පළාත් සභාවේ විරුද්ධ පක්ෂයට වෙලා තිබෙන දේමයි.

[3] කථාව අවසානයේ පළ කර ඇත.

ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය

- දැනට වත්තල නගර සභාව සහ ප්‍රාදේශීය සභාව සහ පෞද්ගලික ආයතන කිහිපයක වෙන්කල දිරණ අපද්‍රව්‍ය කළමනාකරණය කර ජීව වායු නිපදවනු ලබයි.
- නර්ඩ් ආයතනය සමග සම්බන්ධවී පරීක්ෂණ හා සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි.

4. 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| වැඩසටහන | අරමුණ | 2013 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන් ගනන |
|---|---|---|
| පිවිතුරු පාසල් | බස්නාහිර පළාත් පාසල්වල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා උපදෙස් ලබා දීම | 32 |
| පිවිතුරු පුර | පළාත් පාලන ආයතන යටතේ ඇති හඳුනාගත් ප්‍රදේශයන් වෙත අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සැපයීම සහ නිරන්තර පසු විපරමට ලක් කිරීම | • 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැති අතර, පසුවිපරම් කටයුතු සිදු කර ඇත. |
| පිවිතුරු සුවපියස | බස්නාහිර පළාත් රජයේ රෝහල්වල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා උපදෙස් ලබා දීම | • Trainers of Trainee (TOT) වැඩමුළු - 01<br>• ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩමුලු -03 (ගම්පහ, කොළඹ හා කළුතර දිස්ත්‍රික් සඳහා) රෝහල් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් - 08 |
| පරිසර කැකුළු | බස්නාහිර පළාත් පිහිටා ඇති පෙරපාසල්වල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා උපදෙස් ලබා දීම | • 2013 වසර වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් නර නොමැති අතර, කසල බහාලන BIN මිලදී ගැනීමේ කටයුතු සිදු කර ඇත. |
| පරිසර මිතුරෝ | පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා බඳවා ගෙන ඇති කම්කරුවන් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා ධනාත්මක ආකල්ප ඇති කිරීම | • 2013 වසර වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොමැත |
| පිවිතුරු ආයතන | පළාත තුළ පවතින රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් එකී ආයතන වල නිළධාරීන් දැනුවත් කිරීම. | • 2013 වසර වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොමැත |
| රන් කැට | පළාත් පාලන ආයතන මට්ටමින් පිහිටා ඇති කොම්පෝස්ට් අංගන 22 හි නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර වල තත්ත්වය ඇගයීම (Quality Testing) සඳහා මෙම වැඩසටහන නිර්මාණය කර ඇත. | • මෙම වැඩසටහන යටතේ නයිට්‍රජන්,පොටෑසියම් සහ පොස්පරස් යන පෝෂක ද්‍රව්‍ය සහ පොහොරවල තෙතමනය, PH අගය වැනි ප්‍රතිශතමය ගුණාංග අවම වශයෙන් වසරකට 03 වරක්වත් පරීක්ෂා කිරීම.<br>• තවද ඊ කෝලා සහ සැල්මොනෙල්ලා යන ක්ෂුද්‍ර ජීවීන් සඳහා වසරකට 02 වරක්ද, බැරලෝහ සඳහා වසරකට 01 වරක්ද තත්ත්ව පරීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. |

3

[අ.භා.01.17]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහෝම අවංක චේතනාවෙන් කැස්බෑව ජනතාවගේ හිතසුව පිණිස ගෙනාපු යෝජනාවේදී අපේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා සිහින මාළිගා චිත්‍රපටයේ තිර රචනය ලියලා ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාගෙන් මම මීට අවුරුදු දෙකකට හෝ තුනකට ඉස්සෙල්ලා ඇහුවා කොම්පෝස්ට් නිෂ්පාදනය කරන දිනය කවදාද කියලා. එතුමා මට කිව්වා දැනට අවුරුදු තුනකට උඩදී ඉඳලා කියලා. මම ඇහුවා විදුලිය නිෂ්පාදනය කරන්නේ කොයි කාලයේද කියලා. එතුමා කිව්වා විසුරුවා හරින්න ඉස්සෙල්ලා කරලා දානවා කියලා. දැන් තාමත් කොම්පෝස්ට් හදන තැන වහලේ හදනවා. අවුරුද්දයි මාස 06 ක්. වහල කැල්ල ගහනවා. අමානෝ ෂීට් ටික ගෙනැල්ලා. එක ෂීට් එකක් ගහන්න දවස් 36 ක් විතර යනවා. මේක දිගටම ගහගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම කනගාටුවෙන් කියනවා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු එතැන බලන්න ගියාම ඊට පැය කාලකට පස්සේ පොලීසිය එවලා නිලධාරීන්ගෙන් ඇහුවා මෙතැන බලන්න මන්ත්‍රීවරුන්ට යන්න දුන්නේ කොහොමද කියලා. ගල්කිස්ස පොලීසිය එව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බොහොම වගකීමෙන් කියනවා. මේකේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයා අතර අභ්‍යන්තර ගැටළුවක් තිබෙනවා. දෙන්නා දෙපැත්තට අදිනවා. මේ ප්‍රඥප්තියේ කිසිදු බලයක් සභාපතිට නැහැ. මේකේ සියලු බලතල දීලා තිබෙන්නේ, විධායක ජනාධිපති ධූරය දරනවා වාගේ අර සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා කියපු ඒකේ අධ්‍යක්ෂතුමාට. දැන් කොහොම හරි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණා මෙහෙම වනකොට කොම්පෝස්ට් නිෂ්පාදනය - අපේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාත් දන්නවා, අර්ජුන රණතුංග මැතිතුමා වාගේ Gap එකට බෝලේ තල්ලු කරලා. Single එක දාන්න. කඩුවෙල කුණු පාස් කළා කැස්බෑවට. බොහොම වගකීමෙන් කියනවා. කඩුවෙල කැළි කසළ නිෂ්පාදනය කරන ස්ථානය පිහිටුවන්නම ඕනෑ. ඒ කුණු කැස්බෑවට ගේන්න බැහැ. කෝට්ටේට ගේන්න බැහැ. හෝමාගම ඒවා ගේන්න බැහැ. මහරගම ඒවා කැස්බෑවට ගේන්න බැහැ. හැබැයි කැබිනට් ඇමැතිවරයෙකුට, කට වාචාල පුද්ගලයෙකුට භයේ බස්නාහිර පළාත් සභාව ඒ ව්‍යාපෘතිය නැවැත්තුවා. අතන ඉන්නවා අපේ නගරාධිපතිතුමාගේ පුතා. ඇහුවොත් කියයි මොකක්ද කියලා. එහෙම බැහැ. කඩුවෙල ව්‍යාපෘතිය ආරම්භ කරන්න ඕනෑ. උප සභාපතිවරයාට ඕනෑ විධියට කඩුවෙල කරන්න බැහැ. එහෙම නම් ප්‍රසන්න රණතුංග මැතිතුමා මහ ඇමැති පුටුවේ ඉඳලා වැඩක් නැහැ. ඒ නිසා මේවා සිද්ධ වෙන්න ඕනෑ. මේවා නිසා තමයි කැස්බෑවට මෙපමණ කුණු එන්නේ. දවසකට ටොන් 500 ක්. බාන්නේ කොහේටවත් නොවෙයි, ජල පෝෂිතයකට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මේවා ගැන කථා කරන්න ඕනෑ. අභ්‍යන්තර ගැටළු තිබෙනවා. මූල්‍ය ගණුදෙනු තිබෙනවා. අත යටින් යන ගණුදෙනු තිබෙනවා. මේක දිහා බලාගෙන ඉන්නවා, දියවන්නා ඔය ඇතුළේ ඉන්න කට්ටියකුත්. මේක Cash in the Flash deal එකක්. මේක කට්ටියකගේ Income එකක්. නමුත් අර ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්වා වාගේ මම දුක් වෙනවා, තමුන්නාන්සේලාගේ කණ්ඩායම් රැස්වීමේදී මේ යෝජනාව පිළිබඳව තමන්ගේ මන්ත්‍රීවරු හරියට දැනුවත් කරලා නැහැ. මට හිතුනා, මම ආවේ භක්ති ගීත තරගයකටද කියලා. සන්ධානයේ මන්ත්‍රීවරු ඔක්කෝම භක්ති ගීත කිව්වේ, ආරක්ෂක ලේකම්තුමාට.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි නොවෙයි. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු කිව්වේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

යෝජනාවෙන් මම කිව්වේ බස්නාහිර පළාත් සභාවට කරන්න බැරි නම් ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ මූලිකත්වයෙන් - අපේ (බාධා කිරීම්) යෝජනාවේ හරය බොහොම පැහැදිලියි, පිරිසිදුයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මම කිව්වේ, මේක කරන්න බස්නාහිර පළාත් සභාවට බැරි නම් - දැන් ඇමරිකන් ඩොලර් මිලියන කීයක් වියදම් වුණාද කියලා ප්‍රසන්න රණතුංග මැතිතුමාගෙන් ඇහුවොත් කියයි. දැන් ඇවිල්ලා ඉන්න ඒ මනුස්සයා බොහොම ළඟ දිනයකදී ලංකාවේදී බෙල්ලේ වැල දාගන්නවා. මේ ව්‍යාපෘතිය කර ගන්න ඒ මනුස්සයා පැය ගණන්, දවස් ගණන්, අවුරුදු ගණන් කැබිනට් ඇමැතිවරු පස්සේ ගිහිල්ලා තිබෙනවා. කර ගන්න දෙන්නේ නැහැ. Cash in the Flash. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක මෙහෙම කර ගන්න බැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වුණේ, මේ කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ට කියයි කියලා මේකට විසඳුම් සොයන කරීකාවක් කථා කරන්න කියලා. බැලුවාම ඔක්කෝම ගෝඨාභය මැතිතුමාට භක්ති ගීත කියනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලාත් කියනවා නේ ගෝඨාභය -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දැන් එක තමයි කියන්නේ. චරිතය බලවත් වෙලා. ජනාධිපතිතුමාගේ ග්‍රහචාරයේ Upset එකක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යථාර්ථය තුළ අපට ඕනෑ විසඳුමක්. කැස්බෑවේ ජනතාවට ඕනෑ නැහැ බෝල පාස් කිරිල්ලක්. අපට ඕනෑ මේකට විසඳුමක්. හරිම පුදුම කථාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොරටුවේ කුණු ගෙනැල්ලා පිළියන්දලට බානවා. පිළියන්දලින් ආයිත් පටවාගෙන - කවුද මන්ත්‍රීවරයෙක් කිව්වා පස්සෙන් යන්න වෙනවා කියලා වට්ටන ඒවා එකතු කර ගන්න කියලා. ඊට පස්සේ පිලියන්දලින් කොලොන්නාවට ගෙනියනවා. කොලොන්නාවෙන් පුත්තලම්. අපට කමක් නැහැ පුත්තලම් බුරු Subject එක. නමුත් අපට තිබෙන ප්‍රශ්නය කැස්බෑවට මේ දුක විඳගන්න බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව හරහා මීට වැඩිය හරවත් කරීකාවක් මා බලාපොරොත්තු වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මේ පිළිබඳවත් ඔබතුමාගේ උපදේශක කාරක සභාවේදී තව තවත් කථා කරලා මේ ප්‍රශ්නයෙන් කැස්බෑවේ ජනතාව බේරලා දෙන්න කියලා. අපට මේකේදී දේශපාලන ප්‍රශ්නයක් තිබුණේ නැහැ. සුනිල් ජයමිණි මැතිතුමා, ගාමිණී ලොකුගේ මැතිතුමා අපි ඔක්කෝම ඉන්නේ එක මතවාදයක. මේ සඳහා විසඳුමක් ඕනෑ. ඒ විසඳුමේදී අංක එක Cash in the Flash වෙන්න බැහැ. කැස්බෑවේ ජනතාව අංක එක වෙන්න ඕනෑ. ඒ නිසා මේකේදී බිස්නස් deal බැහැ. කැස්බෑවේ ජනතාව ආරක්ෂා කර දෙන ලෙස ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වනකොට කොළඹ SSC ක්‍රීඩාංගණයේ බිම ලියනවා Royal Stag කියලා. විස්කි සමාගමක නමක්. දකුණු අප්‍රිකා ශ්‍රී ලංකා සංචාරයේ ප්‍රධාන අනුග්‍රහය. ඉන්දියාවේ විස්කි නිෂ්පාදන සමාගමක්. මත්ද්‍රව්‍ය ක්‍රීඩාවට පාවිච්චි කරන්න බැරි රටක, දුම්වැටි පාවිච්චි කරන්න බැරි රටක ලංකාවේ ක්‍රිකට් තරගාවලියේ ප්‍රධාන අනුග්‍රහයකයා ඉන්දියාවේ විස්කි සමාගමක්. ඒ පිළිබඳවත් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට, මගේ මිත්‍රයාට මතක් කරනවා. ක්‍රීඩා පනතට පටහැනියි. මම හිතුවා බොදු බල සේනාව ක්‍රිකට් පාලක මණ්ඩලය වටලලා ක්‍රීඩා අමාත්‍යාංශය වටලලා උපාලි ධර්මදාසවයි -

(බාධා කිරීම්)

බෙල්ලෙන් අල්ලගෙන අරගෙන එයි කියලා. නමුත් මතට තිත කියන රටක විස්කි සමාගමක -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ මාතෘකාවේ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මාතෘකාවේ අන්තිම කොටස.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වටිනාකම නැති වෙනවා වෙනත් පැත්තකට ගමන් කිරීමෙන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අන්තිම හරිය යනවා. ලාවට යනවා. හිමින් යනවා. ටිකක් යනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ පිළිබඳවත් මතක් කරමින් මේ යෝජනාව පිළිබඳව නැවත නැවතත් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරමින් දැන් මතට තිත ෂුවර් නැති නිසා කුණුවලටවත් තිත තියන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳ විවාදය අවසන් වෙනවා. මම හිතන්නේ, මෙතැන ඉන්න බොහෝ දෙනෙක් පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් වෙලා ඉඳලා අද පළාත් සභාවට ආපු අය. මේ කථා කරන මම ඇතුළු ඒ සියලු දෙනා දන්නවා, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පළාත් සභාවේ බිහි කළාට පස්සේ තමයි පළාත් පාලන ආයතනවලට, අපට ශක්තියක් ඇවිල්ලා මේ ප්‍රශ්නය පළාත් පාලන ආයතන මට්ටමෙන් අපට යම් ප්‍රමාණයක් විසඳා ගැනීමට හැකියාව ලැබුණේ. ඒ නිසා එම යෝජනාව ඉදිරිපත් කිරීමත් එක්කම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කථාවත් එක්ක මට හැඟී ගියේ කාලෝචිත යෝජනාවක් ගෙනාවා. හොඳ කරුණු ටිකක් සාකච්ඡා වුණා. ඒ අනුව අපද්‍රව්‍ය අධිකාරිය තව තවත් ශක්තිමත් කරන්න ක්‍රමවේදයක් බිහි වෙයි කියන බලාපොරොත්තුවක් මේ යෝජනාවත් එක්කම බලාපොරොත්තු වෙනවා. ඒ අනුව මේ යෝජනාවට බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අනුව නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව සභා සම්මත වූ යෝජනාවක් ලෙස සැලකෙනවා. න්‍යාය පත්‍රයේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව විවාදයට ගැනීම සඳහා කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයක් පවතින බැවින් එම යෝජනාව ලබන සභාවට කල් තබනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

බැහැ, බැහැ. ඩෙංගු හැදිලා ළමයි මැරෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ මොහොතේ ළමයි දහස් ගණනක් මැරෙනවා.

[සභාවේ ඝෝෂා]

ඒ නිසා තමයි රීති අත්හිටුවීමේ යෝජනාව ගන්න දුන්නේ නැත්තේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කාල දීර්ඝ කරලා යෝජනාව ගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමාගේ යෝජනාව ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විවාදයට ගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ වෙලාවේ ළමයි මැරෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඩෙංගු හැදිලා ළමයි මැරෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

වහාම මේ යෝජනාව ගන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාට අයිති ආසනයේ ඉස්සෙල්ලාම වාඩි කරවන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමා වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා කථා කළේ මොන භාෂාවෙන්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂ නායකතුමා වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවාදය අතරතුරදී උපාලි කොඩිකාර ඇමැතිතුමා කථා කරනවා ඇහුනා. භාෂා තුනෙන්ම ඇහෙන්නේ නැහැ. කොයි භාෂාවෙන්ද ඒ කථා කළේ? භාෂා තුනෙන්ම ඇහුවා. තේරෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ආසනයට යන්න. මීළඟට -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. රටේ තිබෙන තත්ත්වය පිළිබඳව කාලීන යෝජනාවක් රීති අත්හිටුවලා ගෙනාවාම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා තමයි කිව්වේ, අපට බොහොම හිතට අමාරුයි. මේ වෙලාව වනකොට ඩෙංගු රෝගයෙන් ළමයින් විශාල ප්‍රමාණයක් මැරෙනවා. මේ සභාවේ සාකච්ඡා කළ යුතු මාතෘකාවක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට ඔබතුමාගේ අවධානය යොමු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. කාලය නොමැති නිසා එය කල් දානවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි කාලය දීර්ඝ කර ගනිමු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමා ඒක පිළිගන්නවා. ඔබතුමා වාඩි වෙන්න. මීළඟට සභාව කල් තබන අවස්ථාවේ -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. 2014 ජුනි මස 08 වන දින මා විසින් මෙම සභාවට කරන ලද විශේෂ ප්‍රකාශය සම්බන්ධව මතු වුණු ගැටළුවක්. එම වාර්තාවේ සඳහන් වන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ට කථිකාචාර්ය කොටපිටියේ රාහුල කියන නම වෙනුවට කොටුපිටියේ රාහුල යනුවෙන් සඳහන් වෙලා තිබෙන්නේ. එය නිවැරැදි විය යුතුයි.

ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙම ප්‍රකාශය කරමින් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, මෙම ක්‍රියා මාර්ග ගැනීමට මැදිහත් වන ලෙසට. අවශ්‍ය ස්ථානවලට මේ පිළිබඳව දැනුවත් කිරීමක් කරන ලෙසට. නමුත් මේ වනතුරු ගත් ක්‍රියා මාර්ග පිළිබඳව කිසිදු දැනුවත් කිරීමක් කරලා නැහැ. ඔබතුමා මගින් මා අපේක්ෂා කරනවා, සභා ලේකම් කාර්යාලයෙන්, ගරු සභාපතිතුමා මේ සම්බන්ධයෙන් යම්කිසි යොමු කිරීමක් කරලා තිබෙනවාද? යම් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද? කියන එක පිළිබඳව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ ක්‍රියා කලාපය ඒ ආකාරයෙන් දැනුම් දීලා තිබෙනවා. ඔබතුමාට අවශ්‍ය පිළිතුරු ලැබෙයි. මේ වනකොට එය ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අදාළ ස්ථානවලට දැනුම් දීමක් කර තිබෙනවා නම් කරුණාකරලා මට ඒ අදාළ පිටපත් යොමු කරන ලෙස ඔබතුමා මගින් දැනුම් දෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න මාලාවක් සහ යෝජනාවක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. ඒ සඳහා පැය භාගයක කාලයක් වෙන් කිරීමට පුළුවන්. ඒ අනුව පළමු ප්‍රශ්න මාලාව ගරු ප්‍රධාන ඇමැතිතුමා වෙත ඉදිරිපත් කිරීමටයි තිබෙන්නේ. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව තියෙන්නේ. ඊට මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා සභාවේ කාලය පැය භාගයකින් දිර්ඝ කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

## රීති අංක 30 හා 31 (ආ) යටතේ යෝජනාව
MOTION UNDER RULE NO. 30 AND 31(B)

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"රීති අංක 30 හා 31 (ආ) යටතේ වැඩ කටයුතු සඳහා සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ඔබතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## රීති අංක 30 යටතේ සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්නය
QUESTION ASKED AT THE TIME OF COUNCIL ADJOURNMENT UNDER RULE NO. 30

**01.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් රීති අංක 30 යටතේ අසන ලද ප්‍රශ්නය :**

අ. 2014 පාසල් දෙවන වාර පරීක්ෂණයේ 11 ශ්‍රේණිය සිංහල හා ගණිතය පිළියන්දල කලාපයේ ප්‍රශ්න පත්‍ර පිටවීමක් සම්බන්ධව ඔබතුමා දන්නේද?

ආ. ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද?

ඇ. පරීක්ෂණ වාර්තාවේ තොරතුරු කවරේද?

ඈ. අදාළ වරදකරුවන් පිළිබඳව ගනු ලැබූ පියවර කවරේද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය අ, 2014 පාසල් දෙවන වාර පරීක්ෂණයේ 11 ශ්‍රේණිය සිංහල හා ගණිතය පිළිබඳව කලාපයේ ප්‍රශ්න පත්‍ර පිටවීමක් සම්බන්ධව ඔබතුමා දන්නේද? කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළියන්දල හා මීගමු කලාපයේ ප්‍රශ්න පත්‍ර පිටවීම සම්බන්ධව ලැබුණු තොරතුරක් තිබෙනවා කියන කාරණාව දැනුවත් කරන්න ඕනෑ. මේ ප්‍රශ්නයේ "ආ" මගින් ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද කියලා අහනවා. තොරතුරු ලැබුණු වහාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ගිහිල්ලා පැමිණිලි කරලා තිබෙනවා. ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පරීක්ෂණයක් පවත්වන්නත් කටයුතු කරලා තිබෙනවා. මේ වනතුරු පරීක්ෂණ අවසන් වෙලා වාර්තාවක් ලැබිලා නැහැ. මේ පිළිබඳව අපට ලැබෙන වාර්තාව අනුව යම්කිසි කෙනෙක් මේකට සම්බන්ධ වෙලා තිබෙනවා නම්, වරදකරුවෙක් වෙනවා නම් පළාත් සභාවක් හැටියට නීත්‍යානුකූලව ඒ අයට විරුද්ධව කටයුතු කරන්නත් අපි කටයුතු කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මම මන්ත්‍රීවරයෙක් විධියට නොවෙයි, ගුරු සංගමයේ ප්‍රධාන ලේකම්වාරයා ලෙස ලිඛිතව දැනුම් දීලා තිබෙනවා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට. එහිදී මම පැහැදිලිවම සඳහන් කරලා තිබෙනවා. මම හිතන්නේ ඔබතුමාට අවබෝධයක් ඇති. විශේෂයෙන්ම ගණිතය ප්‍රශ්න පත්‍රය පිට වෙලා තිබෙන්නේ, රාවතාවත්තේ ශාක්‍යා කියන උපකාරක පන්තියෙන්. ඔබතුමා ඒ සම්බන්ධයෙන් දැනුවත් භාවයක ඉන්නවාද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ පිළිබඳව ඔබතුමාගේ ලිපිය අනුව මට තොරතුරු - මට මෙහෙම දෙයක් කියලා ලැබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉන් පසුව දවසකත් ඔතැන සාකච්ඡාවක් වෙනවා කියපුවාම අමාත්‍යාංශය ලේකම්තුමා විසින් 119 වෙත දැනුම් දීලා, පොලීසිය වෙත යොමු කරලා එතැනත් කටඋත්තර අරගෙන තිබෙනවා. හැබැයි, ඒ සම්බන්ධව අපට පිළිතුරක් දෙන්න අවශ්‍ය වාර්තාව ලැබෙන්න ඕනෑ. ලැබුණු වහාම මම ඔබතුමන්ලා දැනුවත් කරන්න කටයුතු කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතකොට මට තවත් අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. මේ සිද්ධියට සම්බන්ධ වෙලා තිබෙන්නේ මධ්‍යම ආණ්ඩුවේ ඇමැතිවරයෙකුගේ පදනමක සම්බන්ධීකරණ ලේකම්වරයෙක්. ඔහුගේ නම තමයි උදය ජයසේකර. ඒ සම්බන්ධයෙන් ඔබතුමා අවබෝධයකින් ඉන්නවාද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වාර්තාව ලැබෙන කල් මම කැමැති නැහැ, ඒ සම්බන්ධව විවෘත ප්‍රකාශයක් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. බොහොම ස්තූතිය. මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය. දේශපාලන බැලපෑම් නිසා මේ ප්‍රශ්නය යටපත්වීමක් තිබෙනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම කිසිම අවස්ථාවක් නැහැ. මම හිතන්නේ දේශපාලන අධිකාරියෙන්වත් වෙන කවුරුන්වත් මේ වනතුරු අපට කථා කරලා නැහැ. මේ පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙනුත්, අපේ දෙපාර්තමේන්තුවෙනුත් පරීක්ෂණ කටයුතු සිදු කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් කාර්ය පටිපාටි රීති 31 (ආ) යටතේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එතුමාට අවස්ථාව.

## රීති අංක 31(ආ) යටතේ යෝජනාව
MOTION UNDER RULES RULE NO. 31(B)

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *රටපුරා ගවයන් හා ඌරන් ඇති කිරීමේ සත්ව නිෂ්පාදන කර්මාන්තයට තර්ජනයක් බවට පත්වන කුර හා මුඛ රෝගය පැතිරීම ආරම්භ වී ඇති බව මීට මාස 4 කට පමණ පෙර විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. මීට මාස 2 ට පෙර ගම්පහ දිස්ත්‍රික්කය පුරා රෝගය පැතිරෙන්නට වූ අතර මේ වනවිට කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල පාදුක්ක, ඉංගිරිය, හොරණ, බුලත්සිංහල, දොඩංගොඩ, බේරුවල ප්‍රදේශවලද වසංගතයක් වීමට පටන්ගෙන ඇත.*

*වෛරසයක් ලෙස පැතිරෙන මෙම සත්ව රෝගය හට ගැනීමෙන් පසු ප්‍රතිකාර නොමැති අතර රෝගය හට ගැනීමට පෙර එන්නත් ලබා දිය යුතුව ඇත. ගොවීන්, පශු වෛද්‍යවරුන් මේ පිළිබඳව වගකිව යුතු ආයතන වෙත දැනුම් දුන්නද බෙහෙත් නොමැති බවත්, ඒ වෙනුවෙන් මුදල් නොමැති බවත් පවසමින් වගකීම් පැහැර හැරීම නිසා විශේෂයෙන් කිරි ගොවීන් විශාල ගැටලුවකට මුහුණ පා සිටී.*

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

*තවදුරටත් සත්ව නිෂ්පාදන ගොවීන් අසරණ තත්ත්වයට ඇද වැටීමට ඉඩ නොදී බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමුකොට වෛරසය පැතිරීම වළක්වා ගැනීම වෙනුවෙන් වහා පියවර ගත යුතු බවට යෝජනා කර සිටිමි.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[අ.භා.01.35]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තට මේ මොහොත වනකොට මම මේ ඉදිරිපත් කරලා තිබෙන අවසාන ඡේදයේ කොටස සම්බන්ධයෙන්, මේ වෛරසය පැතිරීම වළක්වා ගැනීම පැත්තෙන් අපි විශ්වාස කරන්නේ, දැන් පියවරක් ගැනීමේ හැකියාවක් නැහැ. මේ වෛරසය දැන් පැතිරිලා ඉවරයි. විශේෂයෙන්ම මේ හරහා සභාවේ අවධානය යොමු කරන්න හිතුවේ, ඇත්තටම මෙවැනි කාරණා සම්බන්ධව වගකිව යුතු ආයතනය ඊට පෙර පියවර ගත යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මේ ගවයින් සඳහා එන්නත් ලබා දිය යුතු බව අපේ සත්ව නිෂ්පාදන අංශයට, දෙපාර්තමේන්තුවලට දැනුම් දීලා තිබුණා. නමුත් ඒ වගකීම ඉෂ්ට නොකිරීමේ ගැටළුව තමයි මේ තිබෙන්නේ. විශේෂයෙන්ම මේ යෝජනාව මම ගෙන එන්න ඉස්සෙල්ලා, සාමාන්‍යයෙන් මට එකපාරටම ඔළුවට ආවේ මේ යෝජනාව අයිති කෘෂිකර්ම අමාත්‍යාංශයට කියලා. මේ අමාත්‍යාංශ විෂයය බෙදීමේදීත් මේ වාගේ ගැටළුවක් තිබෙනවා. නමුත් කෘෂිකර්ම අමාත්‍යාංශයට නොවෙයි මේ විෂයය යටත් වෙලා තිබෙන්නේ. මම හිතන්නේ ඒක උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ පෞද්ගලික කාරණයක් එක්ක බලපාලා තිබෙනවා. එතුමා ඒ කොටස හලලා වෙනත් අමාත්‍යාංශයකට එල්ලලා තිබෙන්නේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒක ඔබතුමා ප්‍රශ්නයක් කර ගන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒකයි. ප්‍රශ්නයක් කරගන්න දෙයක් නම් නැහැ. ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා මම ඉදිරිපත් කළේ, මේ වගකීම විශේෂයෙන්ම පළාත් සභාව ඉෂ්ට නොකිරීමට ඒක බලපාලා තිබිලා තියෙනවා. මෙහෙමයි. ක්‍රීඩා අමාත්‍යාංශයේ තිබෙන විෂයයන්වලට තමයි අන්තිමට මේ කොටස එල්ලලා තිබෙන්නේ. ඒ නිසා දැන් එම කොටසින් කරන්නේ, මේ අමාත්‍යාංශයෙන් කරන්නේ ඉදිරියේදී ඡන්ද ව්‍යාපාරවලට විශේෂ පිටුබලයක් වන කුකුළු පැටවුන් බෙදනවා වාගේ වැඩ. ඒවා තමයි ලොකු වැඩ හැටියට සලකන්නේ. ඒ නිසා මේවා ලොකු වැඩ හැටියට සලකන්නේ නැහැ. මේවා ගණන් ගන්නේ නැහැ. මේ සභාවට වුණත් ඉදිරිපත් කළාම ඒක නිකම් දැනෙනවා නේ? මේවා ගණන් ගන්න එවා නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මාතෘකාවත් එක්ක කථා කළා නම් ගැටළුවක් මතු වෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමා?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මාතෘකාවත් එක්ක කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව් මේ මාතෘකාවට තමයි කථා කරන්නේ. මාතෘකාවට කථා කරන්නේ. මේ පළාත් සභාවේ නිර්දේශයන් තිබුණාට ඒවා ගණන් ගත්තේ නැහැ. ඒ නිසා තමයි ගොවීන් අපහසුතාවයට පත් වුණේ. කිරි ලීටර් 50, 60 ගත්තු සමහර ගොවි පොළවල් කිරි ලීටර් 10 ට බැස්සා. ඒක වසංගතයක් බවට පත් වුණාට පස්සේ (බාධා කිරීමක්) කරන්න බැහැ. ඒක නිසා මේ යෝජනාව හරහා ඇත්තටම මේ එන්නත් ලබා දීම සඳහා එක සතෙකුට රුපියල් 170 ක වාගේ වියදමක් යනවා. ඒක ගොවීන්ට දරා ගන්න බැහැ. ඒ නිසා ගොවීන් බලාපොරොත්තු වෙන්නේ අපේ පළාත් සභාව හරහා මේක කෙරෙයි කියලා. ඒ බලාපොරොත්තුවෙන් ඉන්නවා.

ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ වෛරසය පැතිර යෑම හරකුන්ගෙන් විතරක් නොවෙයි. එක ගොවි පොළකට ගිය පශු වෛද්‍යවරයෙක් ඒ ගොවි පොළේ ඉඳලා ඊළඟ ගොවි පොළට ගියාට පස්සේ ඒ පශු වෛද්‍යවරයා හරහාත් මේ වෛරසය යනවා. ඒ නිසා තමයි මෙය වළක්වා ගන්න බැරි තත්ත්වයක් බවට පත් වෙන්නේ. ඒක ඉතාමත්ම භයානකයි. ඒ නිසා ඇත්තටම කර්මාන්තයේ යෙදිලා ඉන්න අයගේ පැත්තෙන් ඉතාමත් අසීරු තත්ත්වයකට තමයි පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේකට දැන් පියවර අරගෙන වැඩක් නැහැ. දැන් වන්නත් දීලා වැඩක් නැහැ. දැන් වන්නත් දෙන්න කියලා යෝජනා කළොත් ඒක බොරු වැඩක්. දැන් අපි යෝජනා කරන්නේ අඩුම ගාණේ ඊළඟ වසර දක්වා මේ සතුන් ආරක්ෂා කර ගැනීම පැත්තෙන් මේ වන්නත් ලබා දීම සඳහා අවශ්‍ය වගකීම ඉෂ්ට කරන්න කියන යෝජනාව තමයි මම මේ හරහා ගෙන එන්නේ. බොහොම ස්තූතියි.

[අ.භා.01.39]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා විනාඩි කිහිපයක් ලබා දීම සම්බන්ධව. ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා, මේ යෝජනාව සභාවට ගෙන ඒම ගැන. ප්‍රධානම කාරණාව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා දේශපාලන ව්‍යාපාර යෝජනා ගෙනැල්ලා තමන්ගේ කුහක උවමනාවල් ඉෂ්ට කර ගන්නවා. මේ කාරණය මතු වෙන්න කලින් රටේ කිරි පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. අපි සියලු දෙනා දන්නවා. රටේ බහුජාතික සමාගම් ගෙනැල්ලා විකුණන කිරිවලට ප්‍රශ්නයක් තිබුණා. ඒ ප්‍රශ්නයේදී කිව්වේ, විකිරණශීලී ද්‍රව්‍ය ඒ වාගේම මනුෂ්‍ය ශරීරයට අහිතකර දේ කිරිපිටිවල තිබෙනවා කියලා. ඒ කිරි සමාගම් තහනම් කිරීමේ ව්‍යාපාරයක් ගියා. ඒ තහනම් කිරීමේ ව්‍යාපාරය නිසා සමහර බහුජාතික සමාගම්වලට මේ රට ඇතුළේ කිරි විකුණන්න තිබෙන අවස්ථාව නැති වෙිගෙන ආවා. ඒ නිසාම දියර කිරි භාවිතය මේ රටේ වැඩි වුණා. අද බහුජාතික සමාගම්වල කුමන්ත්‍රණයක් තිබෙනවා. මේ කාලකණ්ණි දේශපාලන ව්‍යාපාරය පෙනී ඉන්නේ, මේ බහුජාතික සමාගම් එක්ක. මට ඒ කාරණය තමයි පැහැදිලි කරන්න උවමනාව තිබුණේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මොකද, මම මේ වැඩේත් එක්ක හිටපු නිසා මා පෞද්ගලිකව දන්නවා. නිලධාරීන් දැඩිව උනන්දු වුණා මේ කාරණාව මාධ්‍යවල ප්‍රසිද්ධ වෙන එක නතර කරන්න. කුර රෝගයක්, මුඛ රෝගයක් ගවයින්ට තිබෙනවා කියන කාරණය මාධ්‍ය හරහා ප්‍රචාරය වන එක නතර කර ගන්න ඒ අයට ලොකු උවමනාවක් තිබුණා. ඒකට ප්‍රධානම හේතුව වුණේ දියර කිරි භාවිතයෙන් ලාංකීක ජනතාව ඇත් වෙයි කියන බිය. රටට ආදරය කරන මිනිස්සුන්ට ඒ උවමනාව තිබුණා. ඒ නිසා ඒ අය මේක වහගෙන ඉතාමත් දැඩිව මේ රෝගය වෙනුවෙන් පෙනී සිටින එක මේ ආයතන විසින් සිද්ධ කරනු ලැබුවා. එහෙම තියෙන වෙලාවක මේ යෝජනාව පළාත් සභාවට ගෙනාවේ මාධ්‍ය හරහා ප්‍රචාරයක් දීලා බහුජාතික සමාගම්වලට සහයෝගයක් දෙන්න. මේ යෝජනා ගෙනැල්ලා Fontera සමාගමෙන් සල්ලි ගන්නවා ඇති කියලා අපි විශ්වාස කරනවා. මේ යෝජනා හරහා උත්සාහ කරන්නේ මුඛ රෝගයක් තිබෙනවා. කුර රෝගයක් තිබෙනවා. ඒ නිසා දියර කිරි භාවිතයෙන් අයින් වෙයල්ලා කියලා රටේ ජනතාවට කියලා රටේ ජනතාවට බහුජාතික සමාගම් බෙදන කිරිපිටි පොවන්න තමයි මේ යෝජනාව ගෙනාවේ. ඒ නිසා මේක කාලකණ්ණි යෝජනාවක්. කුහක යෝජනාවක්.

ඒ නිසා මෙවැනි යෝජනා ගෙනැල්ලා මේ රටේ මිනිස්සුන්ට අසාධාරණකම් කරන්න එපා කියලා අපි පැහැදිලි කරන්න කැමැතියි. මම දන්නවා නිලධාරීන් රෑ දවල් තිස්සේ බෙහෙත් විද්දා. බෙහෙත් අරගෙන ගියා. ඒ අය අකැමැති වුණා, ගොවියෝ එක තැනකට එකතු කරන්නවත්. මොකද, ගොවියෝ හරහාත් මේ වෛරසය යනවා. එපමණ භයානක වෛරසයක් මේක. මේ වෛරසය බහුජාතික සමාගම් ගෙනැල්ලා මේ පොළොව මත තිබ්බාද කියන සැකය නිලධාරීන්ට තිබෙනවා. ඒ නිසා නිලධාරීන් ගොවියෝ එකතු කරලා රැස්වීමක්වත් තිබ්බෙ නැහැ. ගොවියන්ට එක තැනකට එකතු වෙන්න කියලා කිව්වේ නැහැ. එන ගොවියෙක් ආපහු ගොවි බිමට ගියාම ඒ ගොවියා හරහා සතාට මේ වෛරසය යනවා. ඒ නිසා සතාට මේ වෛරසය වැළඳෙනවා. ඒ නිසා මේ කුහක කාලකණ්ණි යෝජනාවක් කියන කාරණය මතක් කරමින් වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා. ස්තූතියි.

[අ.භා.01.42]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කාර්ය පටිපාටි 31 (ආ)

[ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා]

යටතේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. මේ රටේ ගවයන් සහ ඌරන් ඇතුළු විශේෂයෙන් කුර සහිත සතුන්ට වැළදෙන වසංගත වෛරස් රෝගය පිළිබඳව. සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය යටතේ මේ වැළදෙන වෛරස් වසංගත රෝගය අවම කර ගන්න එහෙම නැත්නම් වළක්වා ගන්න පුළුවන් කටයුත්ත අපට කියලා සිද්ධ කරගන්න. ඉතින් මම කනගාටු වෙනවා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශයේම තිබෙනවා මාස දෙකක් තිස්සේ මේ රෝගය විශේෂයෙන් කිරි හරක්ට, එළදෙනුන්ට වැළඳෙනවා කියන එක. නමුත් ඔබතුමා අද මේ සභාව රැස් වනකල් අපේ අමාත්‍යාංශයේ එකම නිලධාරියෙකුටවත් කථා කරලා මේ පිළිබඳව කටයුතු කරන්න කියලා ඔබතුමා කියලා නැහැ. පෞද්ගලිකව මට ඔබතුමා දැනුම් දීලාත් නැහැ. නමුත් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පිළිබඳව පුවත්පත්වලින් ඔබතුමා විශාල ප්‍රසිද්ධියක් අරගෙන අපේ කිරි ගොවීන්ගේ මේ කරන කාර්ය භාරය නවත්වලා - මොකද, අපි දැක්කා ලෝක වෙළඳ පොළේ කිරිපිටි මිල අඩු වුණාම ඒක අඩු කළේ නැහැයි කියලා එක පැත්තකින් කෑ ගැහුවා. මොකද, ආණ්ඩුවක් විදියට අපි අඩු කළේ නැත්තේ මේ කිරි ගොවීන්ව ආරක්ෂා කරන්න.

අපි පැහැදිලිව තමුන්නාන්සේලාට කියන්න ඕනෑ මේ රෝගය ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා අද වෙද්දී, අපේ රටේ ගොඩක් වෙලාවට වෛරස් තිබෙනවා. MDF මේ වෛරසය A.O.C කියලා වර්ග තුනයි. Sat one, Sat two, Sat Three ලෙස ප්‍රභේද අටක් තිබෙනවා. ඒකෙන් ලංකාවේ වැඩියෙන්ම බෝ වෙලා තිබෙන O කියන ප්‍රභේදය. අපි විශේෂයෙන්ම මේ වෙද්දී එන්නත් මාත්‍රා 60,080 ක් ලබා දීලා තිබෙනවා. මම ඇවිල්ලා මේ මාස තුනට. නොකර හිටියා කියන එකට. මාසයකට ගණන් හැදුවොත් අඩුම අපි 20,000 කට වඩා එන්නත් කරලා තිබෙනවා. ඊළඟට අපේ අමාත්‍යාංශයෙන් 50,000 ක් ඇණවුම් කරලා තිබෙනවා. මේක එකපාර ගෙන්නලා ගොඩක් කල් තියාගෙන කරන්න බැහැ. මේවා ඉවර වෙන්න, ඉවර වෙන්න ගේනවා. ගොවියෝ අපිව දැනුවත් කරපුවාම අපි පැහැදිලිවම, සති තුනකට ඉස්සෙල්ලා දොම්පේ ප්‍රදේශයේ වෛරස් එකට අදාළ එන්නත් නැහැයි කියලා කිව්වාම අපි පේරාදෙණිය ඒ ආයතනයට කථා කරලා 50,000 ක් ණයට ඉල්ලා ගත්තා. අපි ඒ වාගේ විශාල වැඩ කොටසක් මේක ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා පසුගිය කාලයේ කළා. ඔබතුමා මේක යෝජනා කිරීම හොඳයි. මේක වැළැක්වෙන්න ඕනෑ. මොකද, මේ රටේ කිරි ගොවියා අද තමයි ශක්තිමත් වෙලා තිබෙන්නේ. කිරි නිෂ්පාදනය එන්න එන්න වැඩි වෙලා තිබෙනවා, අතිගරු ජනාධිපතිතුමා ආවාට පස්සේ. දියර කිරිවලට ගෙවන මිල රුපියල් 80, 85 දක්වා ලබා ගන්න පුළුවන්කම ඇති වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මම හිතනවා ගොවියෝ සතුටින්ම ජීවත් වන කාල වකවානුව තමයි අතිගරු ජනාධිපතිතුමා ආවාට පස්සේ තිබෙන කාල වකවානුව. ඒක පැහැදිලිව තමුන්නාන්සේලා හිතට එකඟව, තට්ටු කරලා අහන්න. හිනා වෙන්න එපා. වැඩිම මිලක් කිරි ගොවියාට හම්බ වෙන්නේ නැද්ද? වැඩිම නිෂ්පාදයක් වෙන්නේ නැද්ද? මේක බොරුවට, කුහකත්වයට හිනා වෙන්න එපා ගරු මන්ත්‍රීතුමා. මේ ඇත්ත පිළිගන්න. අපිත් පිළිගත්තා නේ? මෙතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාව ඉතාමත්ම වැදගත් යෝජනාවක්. අපි පිළිගත්තා. මේ සඳහා කටයුතු කරන්න ඕනෑ කියන එක අපි පිළිගත්තා. තමුන්නාන්සේලා වාගේ බොරුවට නක්කල් හිනා දාන්න අපි කැමැති නැහැ. නක්කල් හිනාව දාන්න කැමැති නැහැ මන්ත්‍රීතුමා. ඔබතුමාට තමයි කියන්නේ. ඔබතුමන්ලා කුහකත්වයෙන් මේ රටේ ප්‍රවෘත්ති මවනවා ඇරෙන්න, ඔබතුමන්ලා හැමදාම මොනවාද කියන්නේ? කොහේ හරි ගිනි තියනවා නම් සන්තෝෂයි. මිනිස්සු ගහගන්නවා නම් සන්තෝෂයි. ජාතීන් අතර අසමගියක් වෙනවා නම් සන්තෝෂයි. ඔබතුමා මේ -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්, වාරිමාර්ග අමාත්‍යාංශයේ හරියට කරපු වැඩ ටික මම කියන්නද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ, තමුන්නාන්සේ අවස්ථාව නොවෙයි. තමුන්නාන්සේ අවස්ථාවක් ඉල්ලා ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මාස 14 ක් තිස්සේ කරපු වැඩ කියන්නද?

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

වැව්වලට මුල් ගල් තිබ්බා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එක වැවක් හැදුවේ නැහැ. මුල්ගල් තිබ්බා.

[සභාවේ ඝෝෂා]

හදපු වැව් 1000 කෝ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

පශු සම්පත් කෑවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා කථා කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා කියනවා, කියපු දේ කියන්නද කියලා. බස් ගිනි තියපු එක අපි දන්නවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අපි කරපුවා ගැන කියන්නද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මිනිස්සු මරපු එක දන්නවා. බස් ගිනි තියපු එක දන්නවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

රයිට්. කියන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ ඉඳගන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

රයිට්. පොඩ්ඩක් ඉන්න. එහෙම කොහොමද? මෙහෙම මඩ ගහන්න දෙන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

ඔබතුමා කථා කරන්නේ ඒවා. බස් ගිනි තියපුවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

බස් ගිනි තියන කට්ටිය කොහේද ඉන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

කොහොමද එහෙම කථා කරන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීතුමා වාඩි වෙන්න. මේක ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු හොඳ යෝජනාවක්. ඒ යෝජනාව හොඳ යෝජනාවක් නිසා, මේකේ අවුලක් ඇති වෙලා, කැකෝ ගහන්නේ නැතිව හොඳ පිළිතුරක් සොයා ගන්න ඕනෑ නිසා තමයි වෙනත් කථා නොදුන්නේ. ඒ පිළිතුර හරියාකාරව ඇමැතිතුමා ලබා දෙනකොට මේක අවුල් කරලා වෙන පැත්තකට ගමන් කරන්න එපා. ඒක නිසා මෙයින් ගොවීන්ට ලැබෙන ඵලදාව මොකක්ද කියන එක පිළිබඳව ඇමැතිතුමාගේ පිළිතුරු ලබාගෙන ඔබතුමා මහජනතාවට ලබා දෙන්න. ඒක නිසා ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සාමාන්‍යයෙන් කථා කරන්නේ මාතෘකාවට අදාළව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔය මාතෘකාවටද කථා කළේ?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඒක මාතෘකාවෙන් පිට ගෙනියන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

තමුන්නාන්සේ නොවෙයි යෝජනාවට උත්තර දෙන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

2004 සන්ධාන ආණ්ඩුව හැදුවේ නැත්නම් අද ඔය ඇමැති පුටුවල නැහැ. හොඳට මතක තියාගන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මොනවද කිව්වේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මීගමුවේ කරපුවා -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ආවාට පස්සේ මේ රටේ කිරි ගොවියාගේ නිෂ්පාදය වැඩි වෙලා තිබෙනවා කිව්වා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ජනාධිපතිතුමා ආවෙත් කොහොමද කියලා පොඩ්ඩක් කල්පනා කරලා බලන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක අහගෙන ඉන්න බැහැ. කුහක මිනිස්සුන්ට ඒක අහගෙන ඉන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතුමා ආපු විධියත් කල්පනා කරගත්තොත් හොඳයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කුහකයෝ.

[සභාවේ ඝෝෂා]

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ මාතෘකාවට අදාළව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. (බාධා කිරීම්) මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙන්න. ඇමැතිතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපටත් අයිතියක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාවට උත්තරයක් ඕනෑද?

[සභාවේ ඝෝෂා]

ඇමැතිතුමා විනාඩියකට වාඩි වෙන්න. සියලුම දෙනා වාඩි වෙන්න. ඔබතුමාත් වාඩි වෙන්න. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ඔබතුමා මූලාසනයට ගරු කරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

මම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගෙන් අහනවා ඔබතුමා මේ ගෙනාපු යෝජනාවට පැහැදිලි පිළිතුරක් ඇමැතිතුමාගෙන් අවශ්‍යද? නැත්නම් මේ වාගේ කෑගහලා ඒ යෝජනාව බාල්දු කරලා නිකම් ඉන්න කැමැතිද කියලා. ඒ නිසා ගරු විපක්ෂ නායකතුමා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට ගරු කරලා විපක්ෂයේ හැසිරීම පොඩ්ඩක් බලාගන්න වෙනවා. ඇමැතිතුමා කථා කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියාගෙන ආවේ සාමාන්‍යයෙන් මම හැමදාම මාතෘකාවට අදාළව තමයි කථා කරන්නේ. මෙතුමන්ලා කුර රෝගය පිළිබඳව ඉතාම වැදගත් කාලීන යෝජනාවක් ගෙනාවා. ගෙනැල්ලා මොනවාද කිව්වේ? ඡන්දයට දේශපාලඥයෝ කුකුළු පැටව් බෙදනවා වාගේ කථාවක් මෙතැන කිව්වා. ඒ නිසා තමයි මම කිව්වේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ආවට පස්සේ මේ රටේ කිරි ගොවියන් සඳහා විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා බහුජාතික සමාගම්වලට යට නොවී මේ රටේ දියර කිරි නිෂ්පාදය වැඩි දියුණු කරන්න විශාල වැඩ පිළිවෙළක් ගත්තා කියලා. එතුමා බලයට පත් වෙද්දී මේ රටේ කිරි හරකාගෙන් කිරි ලීටර් කීයද ගත්තේ? ලීටර් 4 යි, 5 යි, 6 යි. අද අපි තාක්ෂණය හඳුන්වල දීලා කිරි ලීටර් 23, 24, 25 දක්වා ගෙනැල්ලා තිබෙනවා. ඊළඟට දියර කිරි නිෂ්පාදනය සඳහා ගෙවන අවම මිල අපි තීන්දු කරලා, අද රුපියල් 85, 95 දක්වා කිරි ගොවියාට නියම මිලක් ලැබෙනවා. කිරි ගොවියෝ ඉතාමත් සතුටින් ඉන්නවා. කිරි පවුල් ටික ඉතාමත් සතුටින් ඉන්නවා. මේක කියාගෙන එද්දී තමයි ගරු මන්ත්‍රීතුමා නක්කල් හිනාව මට දැම්මේ. ඉතින් තමුන්නාන්සේලා තීන්දු කරන්න මමද වැරැදි කියන එක. මාධ්‍ය ආයතන තීන්දු කරන්න. ඊට පස්සේ තමයි මම අදාළ නැති මාතෘකාවට ආවේ. මෙතුමන්ලාට ඕනෑ මේවා, මේවා කියලා - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමන්ගේ කථාවේදී මම කාටවත් බාධා කළේ නැහැ. ගරු මන්ත්‍රීතුමා යෝජනාව ගෙනාවා. මම බාධා කළේ නැහැ. ඒ නිසා අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේ ඉගෙන ගන්න ඇමැතිතුමාට විරුද්ධව හරි, ඇමැතිතුමාගේ අමාත්‍යාංශයට අදාළව හරි යෝජනා ගෙනෙද්දී ඇමැතිතුමා කට වහගෙන ඉදිද්දී ඇමැතිවරයා කථා කරද්දී තමුන්නාන්සේ කථා කරන්න එන්න එපා. එතකොට අපටත් පුළුවන් තමුන්නාන්සේට විරුද්ධව කථා කරන්න. ඒක මතක තියාගන්න. ඊළඟට මේ ගෙනාපු යෝජනාවට මම එන්නම්. (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ඉතාමත්ම හොඳ යෝජනාවක්. මේ යෝජනාව කාලීන යෝජනාවක්. මේකට අපි කටයුතු කරන්න ඕනෑ. අද වෙද්දී අපි 60,000 ක් එන්නත් කරලා තිබෙනවා. තවත් 50,000 ක් ඇණවුම් කරලා තිබෙනවා. මේක වළක්වා ගන්න ක්‍රම සහ විධි ගොඩක් අපට පාවිච්චි කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ සියල්ලක් සත්ව නිෂ්පාදනය - වෛද්‍යවරු හරහා කිරි ගොවීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් අපි නොකඩවා සිද්ධ කරනවා. ඒ ඉල්ලන සියලුම දේවල් අපේ අමාත්‍යාංශයෙන් - තමුන්නාන්සේගේ යෝජනාවේ

[ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා]

තිබෙනවා මුදල් නැහැයි කියලා. කොහේවත් මුදල් නැහැ කියලා අපි ගත්තේ නැතුව ඉඳලා නැහැ. ඕනෑම කෙනෙක් ඉල්ලන්න. තමුන්නාන්සේ ඉල්ලන්න. කිරි ගොවීන්ට එන්නත් ටික ලබා දෙන්න කියන්න. අපි ලබා දෙනවා. අපට එකම දේ තිබෙන්නේ, ප්‍රායෝගිකව මේක ගෙන්නගෙන තමයි දෙන්න ඕනෑ. එතකොට යම්කිසි කාලයක් යනවා. සමහර වෙලාවට මේ එන්නත් කරලා නැතුව මැරුණා කියලා තමුන්නාන්සේලා කිව්වාට මේ වෛරයෙන් එන්නත් කරපු කිරි හරකුත් මැරිලා තිබෙනවා. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා අපි කථා කර කර හිටියේ, සෙම්ප්‍රතිශ්‍යායාවට අපි කොපමණ බෙහෙත් ගත්තත් සමහර විට එනවා. අපේ ඇඟට එක එක රෝග එනවා. ඉතින් මේවාට ප්‍රතිකර්ම එක එක විධියට කරන්න වෙනවා. හැම කෙනාටම එක ආකාරයෙන් මේක වෙන්නේ නැහැ. සමහර විට මැරෙන්න පුළුවන්. තමුන්නාන්සේ කිව්වා වාගේ අපේ කිරි ගවයන් 79 ක් අපෙන් තුරන් වෙලා තිබෙනවා. ඉතින් අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, කිරි ගොවීන් ආරක්ෂා කරන ආණ්ඩුවක් විධියට. අපට විශාල කැක්කුමක් තිබෙනවා. ඒ නිසා පැහැදිලිවම බස්නාහිර පළාත් සභාවක් විධියට, බස්නාහිර පළාත් සභාව තුළ කිරි ගොවීන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ඔබතුමා ගෙනාපු මේ රට පුරා ව්‍යාප්ත වන විශේෂයෙන් ඌරන්ට සහ හරක්ට වැළඳෙන කුර සහ මුඛ රෝගය පැතිරීම වැළැක්වීම සඳහා ගන්න පුළුවන් සියලුම ක්‍රියාකාරකම් කරන ගමන් මම ඉතාමත් කනගාටු වෙනවා, මේ පිළිබඳව විකල්ප යෝජනා ටිකක් ගෙනැල්ලා මේ සභාව දැනුවත් කළා නම් අපි දැනට ක්‍රියාත්මක වෙනවාට වඩා වැඩි යමක් අපට කරන්න තිබුණා කියන එක අපි හිතනවා. ඒ නිසා ලබන පාර මේ වාගේ යෝජනා ගෙන එද්දී හොඳ විකල්ප යෝජනාත් ගෙන එන්න කියලා ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරමින් අද මේ ගෙනාපු යෝජනාව සම්බන්ධව හෙට ඉඳලා අපේ වෛද්‍යවරු හරහා මේ කිරි ගොවීන් සියල්ල දැනුවත් කරලා තවත් අඩුපාඩු තිබෙනවා නම් ඒ සඳහාත් එන්නත් ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්ම කරනවා කියන එක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රකාශ කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. දැන් (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට දැන ගන්න ඕනෑ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම අවස්ථාව දෙනවා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේගේ රීතිය මොකක්ද? ඉඳ ගන්නකෝ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ පාසල් ශිෂ්‍යයන්ව කුලප්පු කරලා පාසල් ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න ඇති කරලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මම ඔබතුමාට කථා කරන්න විනාඩි දෙකක් දෙනවා. සෑහීමකට පත් වෙනවාද කියලා බලන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ ඉඳගන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇමැතිතුමාගේ කථාවට පිළිතුරු කථාවක් කරන්න දෙනවාද කියලා දැන ගන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට කථා කරන්න විනාඩි දෙකක් ලබා දෙනවා.

[අ.භා.01.56]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට විනාඩි දෙකයි දෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට විනාඩි දෙකකුත් ඕනෑ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි යෝජනාවක් ගෙන ඒමේදී විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියලා දෙකක් තිබෙන නිසා යෝජනා සම්බන්ධව පූර්ව නිගමනවලට යනවා. අපි අවංකවම කියන්න ඕනෑ ජනතාව නියෝජනය කරමින් තමයි ඒ යෝජනාව ගෙනාවේ. ඒක ඇමැතිතුමා පස්සේ කිව්වා. ප්‍රතිවිරෝධය හැදුණේ මේකට සම්පූර්ණයෙන් වෙනස් කථාවක් තමයි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කළේ. ඊට වඩා සම්පූර්ණයෙන් වෙනස් කථාවක් ගරු ඇමැතිතුමා කළේ. ඒකත් එක්ක ඇති වුණු ප්‍රතිවිරෝධය - කොහොම හරි ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙන ඒමට අවස්ථාව ලබා දීම සම්බන්ධව.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.57 ට, 2014 අගෝස්තු මස 05 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 01.57 p.m till 9.30 a.m. on 05.08.2014*